# පරිශිෂ්ටයසත්

## පළමුවැනි පරිශිෂ්ඨය

ශ්‍රී ලංකාවේ ජාතික රාජ්‍ය සභාව විසින් 1975 දී පනවන ලද ප්‍රධාන නීතිවලින් උපුටා ගත්, මහ බැංකුවේ සහ බැංකු ආයතන කටයුතු හා ගනුදෙනු වලට අදාල කොටස්:


පිටුව

1. 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතින් උධෘතයි .. (i)
2. 1975 අංක 6 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) පනත (ii)
3. 1975 අංක 9 දරන විදේශීය සමාගම් (විශේෂ විධිවිධාන) පනත .. (iv)
4. 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත .. (x)
5. 1975 අංක 18 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් උධෘතයි .. (xvi)
6. 1975 අංක 21 දරන මිල පාලන (සංශෝධන) පනතින් උධෘතයි .. (xL)
7. 1975 අංක 22 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත .. .. .. (xLi)
8. 1975 අංක 28 දරන මුද්දර (සංශෝධන) පනත . (xLii)
9. 1975 අංක 32 දරන බැංකු හරබදු (සංශෝධන) පනත .. (xLvi)
10. 1975 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත .. (xLvii)
11. 1975 අංක 42 දරන ජාතික මිල කොමිෂන් සභා පනතින් උධෘතයි .. (Liii)
12. 1975 අංක 43 දරන මිල පාලන (සංශෝධන) පනතින් උධෘතයි .. (Liii)
13. 1975 අංක 50 දරන විසර්ජන පනත .. (Lvii)

අදාළ වන තැනැත්තාට හැර අන් කිසිම තැනැත්තකුට දැනුම් දීම හෝ මේ පනත යටතේ තම කාර්ය ඉටු කිරීමෙහි දී තමා සන්තකයට පත්වන ලේඛන හෝ වාර්තා කිසිවක් බලය නොලත් කිසිම තැනැත්තකුට බැලීමට ඉඩ හැරීම හෝ ඔහු විසින් නොකළ යුතුය.

(2) (1) වන උප වගන්තියේ විධිවිධාන යටතේ රහස්‍යතාව රැකීමට සහ රහස්‍යතාව රැකීමට ආධාර කිරීමට නියමිත සෑම තැනැත්තකුම, නියම කරනු ලබන ආකාරයක රහස්‍යතා දිවුරුමක් සමාදාන විනිශ්චයකාර වරයකු ඉදිරියේ දී අත්සන් කළ යුතුය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ රහස්‍යතාව රැකීමට සහ රහස්‍යතාව රැකීමට ආධාර කිරීමට නියමිත යම් තැනැත්තකුට, මේ පනත හෝ අල්ලස් පනත හෝ විනිමය පාලන පනත හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත හෝ රේගු ආඥාපනත හෝ යටතේ පවරන ලද හෝ පැවරීමට තිබෙන යම් නඩු කටයුත්තක් සඳහා හෝ එම පනත්වල විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා හෝ අවශ්‍ය වියහැකි පරිදි හැර, කිසිම වත්කම් හෝ බැරකම් ප්‍රකාශයක් හෝ ඒ හා සම්බන්ධ වෙනත් යම් ලියවිල්ලක් යම් අධිකරණයක් වෙත ඉදිරිපත් කිරීමට හෝ මේ පනත යටතේ ඔහුගේ කාර්ය ඉටු කිරීමේ දී ඔහුට දැනගන්නට ලැබෙන යම්කිසි කාරණයක් හෝ දෙයක් යම් අධිකරණයකට එළිදරව් කිරීමට හෝ දැනුම් දීමට හෝ නියම නොකළ යුතුය.

(4) මේ වගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තකු වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඒ තැනැත්තා රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේය.

---

## ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 6 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) පනත

**පෞද්ගලික අංශයේ සියළුම සේවකයන් සඳහා වෘද්ධෝපගත ප්‍රතිලාභ ගෙවීමේ ඒකාකාර ක්‍රමයක් ඇති කිරීම සඳහාත් ඊට ආනුෂංගික හෝ සම්බන්ධ කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 6 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක වන්නේය.

2. (1) නියමිත දිනයේ දී හෝ ඉන් පසුව යම් ආරක්ෂිත රැකියාවක සේවකයකු ලෙස පත්වන කිසිම තැනැත්තකු යම් වෘද්ධෝපගත ප්‍රතිලාභ ලබා ගැනීමේ කාර්යය සඳහා, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල හැර යම් අර්ථසාධක අරමුදලක, විශ්‍රාම වැටුප් අරමුදලක හෝ වෙන යම් වෘද්ධෝපගත අරමුදලක හෝ යෝජනා ක්‍රමයක සාමාජිකයකු වීම හෝ එයට දායක මුදලක් ගෙවීම නොකළ යුතුය.

(2) නියමිත දිනයේ දී හෝ ඉන් පසුව වෙන යම් තැනැත්තකු යම් ආරක්ෂිත රැකියාවක නියුක්ත කර ඇති කිසිම තැනැත්තකු විසින් ඒ සේවකයාට වෘද්ධෝපගත ප්‍රතිලාභ සැලසීමේ කාර්යය සඳහා ඒ සේවකයා සම්බන්ධයෙන්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල හැර යම් අර්ථසාධක අරමුදලකට, විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ වෙන යම් වෘද්ධෝපගත අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදලක් නොගෙවිය යුතුය.

3. නියමිත දිනයේ දී හෝ ඉන් පසුව වෙන යම් තැනැත්තකු යම් ආරක්ෂිත රැකියාවක නියුක්ත කර ඇති කිසිම තැනැත්තකු විසින් ඔහුගේ සේවකයන්ට වෘද්ධෝපගත ප්‍රතිලාභ සැලසීමේ කාර්යය සඳහා යම් අර්ථසාධක අරමුදලක්, විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ වෙන යම් වෘද්ධෝපගත අරමුදලක්හෝ යෝජනා ක්‍රමයක් නොපිහිටුවිය යුතුය.

4. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සහ විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලබන දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් කරනු ලබන පසු දිනයක හෝ එය ක්‍රියාත්මක වන්නේය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතියේ දිනයේ සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතුය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබිය යුතුය.

(5) අමාත්‍යවරයා විසින් සාදනු ලබන යම් නියෝගයක් ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබූ විට එය මෙහි ලා පනවනු ලැබූවාක් මෙන් වලංගුව බලපැවැත්විය යුතුය ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

5. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ මේ පනත යටතේ නීත්‍යානුකූලව කරන ලද යම් නියමයක් හෝ දෙන ලද විධානයක් කඩ කරන හෝ පිළිපැදීම පැහැරහරින සෑම තැනැත්තෙක්ම මේ පනත යටතේ වරදක් කරන්නේය.

(2) මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තෙක්ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, හය මාසයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේය.

(3) සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක ඒ වරද කරනු ලැබූ අවස්ථාවෙහි ඒ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරී, ලේකම් හෝ එවැනි වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තෙක් ද ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම් ඒ ව්‍යාපාරික ආයතනයේසෑම හවුල් කරුවෙක් ද, තමාගේ කැමැත්ත හෝ වංක සහයෝගය දැක්වීමක් නොමැතිව ඒ වරද කර ඇති බවත් තම කටයුතුවල ස්වභාවය හා එළඹ තිබුණු සියලු කරුණු ගැන සැලකිලිමත්ව තමා විසින් කළ යුතුව තිබුණු පරිදි ඒ වරද කිරීම වැළැක්වීම පිණිස තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බවත් ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ වරදට වරදකරු ලෙස සලකනු ලබන්නේය.

6. වෙන යම් ලිඛිත නීතියක, තීරණයක, සාමූහික ගිවිසුමක හෝ වෙනත් එකඟවීමක කුමක් සඳහන්ව ඇත ද මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර ඒ අනුව, මේ පනතේ විධිවිධාන හා ඒ වෙනත් නීතිය, තීරණය, සාමූහික ගිවිසුම හෝ එකඟවීම හා අතර යම් ගැටුමක් හෝ නොගැලපීමක් ඇතිවුවහොත්, මේ පනතේ විධිවිධාන ඒ වෙනත් නීතිය, තීරණය, සාමූහික ගිවිසුම හෝ එකඟවීම අභිභවා බලපැවැත්විය යුතුය.

7. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි "ආරක්ෂිත රැකියාව" සහ "සේවකයා" යන්නට 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ දී ඇති අර්ථම පිළිවෙලින් ඇත්තේය.

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 9 දරන විදේශීය සමාගම් (විශේෂ විධිවිධාන) පනත

ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සමාගම්වල වත්කම් හා බැරකම්, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මකවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ සංස්ථාගත සමාගම්වලට පවරනු ලැබූ අවස්ථාවන්හි දී බදු හා වෙනත් අයකිරීම් වලට අදාළ විශේෂ විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 9 දරන විදේශීය සමාගම් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු ලැබූ (මේ පනතෙහි මින් මතු "විදේශීය සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් සමාගමක් විසින් ශ්‍රී ලංකාව තුළ පවත්වා ගෙන යනු ලබන යම් ව්‍යාපාරයක් සහ ඒ ව්‍යාපාරයට සම්බන්ධව විදේශීය සමාගම සතුව ශ්‍රී ලංකාවෙහි තිබෙන වත්කම් හා බැරකම් උචිත දිනයෙහි හෝ ඉන් පෙර ඒවායේ පොත්ගත වටිනාකම අනුව ශ්‍රී ලංකාවේ යම් සමාගමකට පවරනු ලැබූ අවස්ථාවක සහ—

(අ) පැවරීමේ ප්‍රතිඵලයක් වශයෙන් විදේශීය සමාගමට හෝ, විදේශීය සමාගමට සහ එක් එක් තැනැත්තා විදේශීය සමාගම වෙනුවෙන් එකකට නොවැඩි කොටස් ගණනක් භාරයක් වශයෙන් තබාගෙන සිටින නම් කළ තැනැත්තන් නවදෙනකුට නොවැඩි සංඛ්‍යාවකට හෝ වෙන්කර දෙනු ලැබූ ශ්‍රී ලංකා සමාගමෙහි කොටස්වල නාම මාත්‍ර වටිනාකමේ; සහ

(ආ) පැවරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා සමාගමෙහි ඇති වූ යම් ප්‍රාග්ධන සංචිතයක

සමස්තය එකී බැරකම්වල පොත්ගත වටිනාකමට වැඩියෙන් ඇති, එකී වත්කම්වල පොත්ගත වටිනාකමෙහි අධිකයට අඩු නොවන අවස්ථාවක, මේ පනතේ විධිවිධාන—

(i) විදේශීය සමාගම හා ශ්‍රී ලංකා සමාගම,

(ii) විදේශීය සමාගමේ වත්කම් හා බැරකම් ශ්‍රී ලංකා සමාගමට පැවරීම වෙනුවෙන් කරන ලද ප්‍රථම කොටස් වෙන්කරදීමේ දී ශ්‍රී ලංකා සමාගම විසින් විදේශීය සමාගමට සහ විදේශීය සමාගමේ ඉහත කී නම් කළ තැනැත්තන්හට වෙන්කර දෙනු ලැබූ කොටස්, සහ

(iii) ශ්‍රී ලංකා සමාගමට පවරනු ලැබූ වත්කම් හා බැරකම් කෙරෙහි අදාළ වන්නේය.

(2) (1) වන උප වගන්තියෙහි කාර්යයන් සඳහා—

"පොත්ගත වටිනාකම" යන්න—

(අ) පහත සඳහන් දේවල් අතුරින්—එනම් කීර්ති නාමය, ඉඩම්, ගොඩනැගිලි, පිරියත්, යන්ත්‍රෝපකරණ, සවිකිරීම් උපකරණ, කොටස්, සෑණ පත්‍ර හා ඇප යන මේවා යම් එකකින් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත වූ හා ශ්‍රී ලංකාවේ සමාගමකට පවරන ලද්ද වූ විදේශීය සමාගමක වත්කම කිසිවක් සම්බන්ධයෙන් යෙදෙන විට—

(i) ඒ වත්කම්වල වටිනාකම 1973 ලිත් වර්ෂයේ යම් දිනයක අවසන් වන සමාගමේ ගිණුම් වර්ෂයේ අවසාන දිනය සඳහා වූ සමාගමේ ශේෂ පත්‍රයෙන්, නිශ්චය වශයෙන් දැනගත හැකි බව දේශීය ආදයම් කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක—

(අ) එම ශේෂ පත්‍රයේ දිනයට පසුව හා එම වත්කම් ශ්‍රී ලංකාවේ සමාගමට පැවරීමට පෙර ඒ වත්කම්වලට නියම වශයෙන් කරන ලද එකතු කිරීම් හෝ නියම වශයෙන් කරන ලද ඒ වත්කම් විකිණීම් පිළිබඳව නැතහොත් ඒ වත්කම් ක්ෂයවීම හෝ නැතිවීම සඳහා වූ දීමනා පිළිබඳව කෙරෙන වෙනස් කිරීම් කිසිවක් වෙතොත් ඒවා කිරීමෙන් පසු, සහ

(ආ) ඒ වත්කම් නැවත තක්සේරු කිරීමට ආරෝපණය කළ හැකි ඒ වත්කම්වල වටිනාකමෙහි කොටස ඇතුළත් කිරීම දේශීය ආදයම් කොමසාරිස් ජනරාල්වරයා අනුමත කර ඇතහොත් මිස ඒ කොටස බැහැර කිරීමෙන් පසු ඒ ශේෂ පත්‍රයෙන් නිශ්චය වශයෙන් දැනගන්නා ඒ වත්කම්වල වටිනාකම අදහස්වේ,

(ii) ඒ වත්කම්වල වටිනාකම ඒ ශේෂ පත්‍රයෙන් නිශ්චය වශයෙන් දැනගත නොහැකි බව දේශීය ආදයම් කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක දේශීය ආදයම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් නිශ්චය කරනු ලබන මුදලක් අදහස්වේ;

(ආ) විදේශීය සමාගමේ වත්කම් අතුරින් (අ) ඡේදයෙහි සඳහන් නොවූ වත්කම් කිසිවක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ වත්කම් ශ්‍රී ලංකාවේ සමාගමට පවරනු ලැබූ දිනයෙහි ඒ වත්කම්වල වටිනාකම වශයෙන් විදේශීය සමාගමේ ගණන් පොත්වල පෙන්නුම් කර තිබෙන වටිනාකම අදහස් වේ; තවද,

(ඇ) විදේශීය සමාගමේ බැරකම් කිසිවක් සම්බන්ධයෙන් යෙදෙන විට. ඒ බැරකම් ශ්‍රී ලංකාවේ සමාගමට පවරනු ලැබූ දිනයෙහි ඒ බැරකම්වල මුදල් ප්‍රමාණයන් වශයෙන් විදේශීය සමාගමේ ගණන් පොත්වල පෙන්නුම් කර තිබෙන මුදල් ප්‍රමාණයන් අදහස්වේ;

"උචිත දිනය" යන්නෙන්,—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) පනතේ අර්ථානුකූලව "නිදහස් කළ සමාගමක්" නොවන යම් විදේශීය සමාගමක් සම්බන්ධයෙන් වූ විට, ඒ පනතේ අර්ථානුකූල වූ "නියමිත දිනය" අදහස් වේ, තවද

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) පනතේ අර්ථානුකූලව "නිදහස් කළ සමාගමක්" වූ විදේශීය සමාගමක් සම්බන්ධයෙන් වූ විට, ඒ සමාගම පිළිබඳව ඒ නීතිය යටතේ වූ නිදහස් කිරීමේ විධානය බලාත්මකව පැවතීම යම් දිනයක හෝ යම් දිනයකට පෙර හෝ අවසන්වේද ඒ දිනය අදහස්වේ.

3. වෙන යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇතද—

(අ)(i) විදේශීය සමාගමේ ව්‍යාපාර කටයුතු, වත්කම් හා බැරකම් ශ්‍රී ලංකා සමාගමට පැවරීම සම්බන්ධයෙන් එම සමාගම විසින් හෝ එම සමාගම වෙනුවෙන් හෝ එම සමාගමේ වාසියට හෝ ලියා අත්සන් කරන්නාවූ හා මෙම විධිවිධානය මගින් දෙනු ලැබූ නිදහස් කිරීම නිසා නොවේ නම් මුද්දර ගාස්තු ගෙවීමට විදේශීය සමාගම යටත් වන්නට තිබුණා වූ යම් සාධන පත්‍රයක් සඳහා, සහ

(ii) විදේශීය සමාගම විසින් ශ්‍රී ලංකා සමාගමෙහි දරනු ලබන කොටස් කිසිවක් විදේශීය සමාගම විසින් එහි යම් කොටස්කරුවනට පැවරීම ශ්‍රී ලංකා සමාගම විසින් විදේශීය සමාගමට කොටස් වෙන්කර දීමෙන් පසු මාස දෙළහක් ඇතුළත කරනු ලබතොත් සහ ඒ පැවරීමට පෙරාතුවම ඒ කොටස්කරුවනට විදේශීය සමාගමේ කොටස් අයිතිව තුබූ අනුපාතයම අනුව ඔවුන්ට ඒ කොටස් පැවරීම කරතහොත් ඒ කොටස් පැවරීම සඳහා

මුද්දර ගාස්තු ගෙවීමෙන් විදේශීය සමාගම නිදහස් වන්නේය; තවද—

(ආ) (i) විදේශීය සමාගමේ ව්‍යාපාර කටයුතු, වත්කම් හා බැරකම් ශ්‍රී ලංකා සමාගමට පැවරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සමාගම විසින් හෝ එම සමාගම වෙනුවෙන් හෝ එම සමාගමේ වාසියට හෝ ලියා අත්සන් කරන්නා වූ හා මෙම විධිවිධානය මගින් දෙනු ලැබූ නිදහස් කිරීම නිසා නොවේ නම් මුද්දර ගාස්තු ගෙවීමට ශ්‍රී ලංකා සමාගම යටත් වන්නට තිබුණා වූ යම් සාධන පත්‍රයක් සඳහා, සහ,

(ii) විදේශීය සමාගමට සහ විදේශීය සමාගම වෙනුවෙන් එක් එක් තැනැත්තා එකකට නොවැඩි කොටස් ගණනක් භාරයක් වශයෙන් තබා ගෙන සිටින නම් කළ තැනැත්තන් නව දෙනකුට නොවැඩි සංඛ්‍යාවකට ද වෙන් කර දෙනු ලැබූ ශ්‍රී ලංකා සමාගමෙහි කොටස්වලට අදාළ කොටස් සහතික පත්‍ර සඳහා,

මුද්දර ගාස්තු ගෙවීමෙන් ශ්‍රී ලංකා සමාගම නිදහස් වන්නේය.

4. 1963 අංක 11 දරන මුදල් පනතේ 58 වන වගන්තියෙහි විධිවිධාන—

(අ) ශ්‍රී ලංකා සමාගමෙහි කොටස් විදේශීය සමාගම විසින් එකී විදේශීය සමාගමේ කොටස්කරුවන් වූ තැනැත්තන්හට පැවරීම ශ්‍රී ලංකා සමාගම විසින් විදේශීය සමාගමට කොටස් වෙන්කරදීමෙන් පසු මාස දෙළහක් ඇතුළත කරනු ලබතහොත් සහ ඒ පැවරීමට පෙරාතුව ම ඒ කොටස්කරුවන්ට විදේශීය සමාගමේ කොටස් අයිතිව තුබූ අනුපාතය ම අනුව ඔවුන්ට ඒ කොටස් පැවරීම කරතහොත් ඒ කොටස් පැවරීම කෙරෙහි; සහ

(ආ) විදේශීය සමාගමේ නම් කළ තැනැත්තන් විදේශීය සමාගම වෙනුවෙන් භාරයක් වශයෙන් තබා ගෙන සිටින ශ්‍රී ලංකා සමාගමෙහි යම් කොටසක් විදේශීය සමාගම වෙනුවෙන් භාරයක් වශයෙන් තබාගනු ලැබීම පිණිස විදේශීය සමාගමේ වෙනත් නම් කළ තැනැත්තකුට පැවරීම කෙරෙහි

අදාළ නොවන්නේය.

5. 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත විදේශීය සමාගම කෙරෙහි සහ ශ්‍රී ලංකා සමාගම කෙරෙහි අදාළ වීමේදී, විදේශීය සමාගම විසින් ශ්‍රී ලංකාවෙහි තිබෙන සිය ව්‍යාපාර කටයුතු, වත්කම හා බැරකම් ශ්‍රී ලංකා සමාගම වෙත පැවරීමෙන් උද්ගත වන යම් කරුණක් සම්බන්ධයෙන් හෝ පිළිබඳව, ඒ තාක් දුරට පමණක්, මෙහි පහත දැක්වෙන මඳ වෙනස් කිරීම්වලට යටත්ව එය බලපවත්වන්නේ ය. එනම්:—

(අ) විදේශීය සමාගම සම්බන්ධයෙන් වූ විට—

(1) විදේශීය සමාගමට ඉටු කරන ලද සේවාවන් සඳහා යම් සේවකයකුට ශ්‍රී ලංකා සමාගම විසින් යම් පාරිතෝෂිකයක්, විශ්‍රාම වැටුපක් හෝ වෙනත් ප්‍රතිලාභයක් ගෙවීම වෙනුවෙන් විදේශීය සමාගම විසින් ශ්‍රී ලංකා සමාගමට දෙන ලද යම් මුදලක් සම්බන්ධයෙන් ඒ පනතේ 10 වන වගන්තිය යටතේ කිසිදු අඩු කිරීමකට ඉඩ නොදිය යුතුය;

(4) ස්වකීය ව්‍යාපාර කටයුතු ශ්‍රී ලංකා සමාගමට නොපවරන ලද්දේ නම් විදේශීය සමාගම විසින් අඩු කිරීමක් කළ හැකිව තිබුණු එම සමාගම විසින් දරන ලද්දා වූ (යම් ප්‍රාග්ධන අලාභයක් ඇතුළත්) යම් අලාභයක් ශ්‍රී ලංකා සමාගම විසින් දරනු ලැබූ අලාභයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, විදේශීය සමාගම විසින් එහි ව්‍යාපාර කටයුතු නොපරන ලද්දේ නම් එම අලාභය සම්බන්ධයෙන් එම සමාගම විසින් ඒ පනත යටතේ අඩු කළ හැකිව තිබුණු යම් අඩු කිරීමක් කිරීමට ශ්‍රී ලංකා සමාගමට හිමිකම් ඇත්තේය;

(5) ස්වකීය ව්‍යාපාර කටයුතු ශ්‍රී ලංකා සමාගමට නොපවරන ලද්දේ නම් ඒ පනතේ 15 (4) වන වගන්තිය යටතේ විදේශීය සමාගම විසින් යම් මුදලක් සම්බන්ධයෙන් අඩු කිරීමක් කළ හැකිව තිබිණි නම් ඒ මුදල ශ්‍රී ලංකා සමාගමට අඩු කිරීමක් කිරීමට හිමිකම් ලැබිය යුතු මුදලක් ලෙස සල්කනු ලැබිය යුතුය.

6. (1) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවේ යොදවනු ලබන යම් ලිඛිත නීතියක් යටතේ යම් ක්‍රියාවක්, කරුණක් සහ දෙයක් කිරීමට විදේශීය සමාගම බැඳී සිටිය හැකිව තිබුණේ ද ඒ සියලු ක්‍රියා, කරුණු සහ දේවල් කිරීමට ශ්‍රී ලංකා සමාගම බැඳී සිටින්නේය.

(2) විදේශීය සමාගමෙහි ව්‍යාපාර කටයුතු පැවරීමට පෙර යම් කාල සීමාවක් සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවේ යොදවනු ලබන යම් ලිඛිත නීතියක් යටතේ, විදේශීය සමාගමෙන් අය කර ගත හැකි හෝ එම සමාගම ගෙවීමට බැඳී ඇති යම් බද්දක් හෝ වෙනත් අය කිරීමක් ශ්‍රී ලංකා සමාගමෙන් අය කර ගත හැකි අතර එය ගෙවීමට ශ්‍රී ලංකා සමාගම බැඳී සිටින්නේය.

7. (1) 1958 අංක 2 දරන තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලනය කිරීමේ) පනතෙහි සහ 1972 අංක 2 දරන වතු (පැවරීම පාලනය කිරීමේ හා අත්කර ගැනීමේ) පනතෙහි විධිවිධාන, අවස්ථාවෝචිත පරිදි, 1958 අංක 2 දරන තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලනය කිරීමේ) පනතේ අර්ථානුකූලව තේ හෝ රබර් වත්තක හෝ 1972 අංක 2 දරන වතු (පැවරීම පාලනය කිරීමේ හා අත්කර ගැනීමේ) පනතෙහි අර්ථානුකූලව වත්තක හෝ අයිතිය විදේශීය සමාගමක් විසින් ශ්‍රී ලංකා සමාගමකට පැවරීම කෙරෙහි අදාළ නොවන්නේය.

(2) මේ වගන්තියෙහි "අයිතිය පැවරීම" යන්නට—

(අ) එය 1958 අංක 2 දරන තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලනය කිරීමේ) පනතෙහි අර්ථානුකූලව යෙදෙන කල්හි, ඒ පනතෙහි ලා ඇති අර්ථයම ඇත්තේ ය; තව ද

(ආ) 1972 අංක 2 දරන වතු (පැවරීම පාලනය කිරීමේ හා අත්කර ගැනීමේ) පනතෙහි අර්ථානුකූලව යෙදෙන කල්හි, ඒ පනතෙහි ලා ඇති අර්ථය ම ඇත්තේය.

8. මේ පනතෙහි කාර්යයන් සඳහා, අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,—

"දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන් 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ කාර්යයන් සඳහා පත් කරනු ලැබූ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වන අතර තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට පොදුවේ හෝ යම් නිශ්චිත කාර්යයක් සඳහා හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ යම් දේශීය ආදායම් කොමසාරිස්වරයෙක් හෝ නියෝජ්‍ය දේශීය ආදායම් කොමසාරිස්වරයෙක් එයට ඇතුළත්වේ;

''ශ්‍රී ලංකා සමාගම'' යන්නෙන් –

(අ) (සමාගම් ආඥපනතෙහි අර්ථානුකූලව පෞද්ගලික සමාගමක් නොවන) 1974 ජූනි මස 19 වන දින හෝ ඊට පසු ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරනු ලැබූ යම් සමාගමක් හෝ,

(ආ) (i) ඒ දිනයට පෙර ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරනු ලැබූ සමාගමක්වූ ද;

(ii) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථා ගත කරන ලද සමාගමක් විසින් කොටස් ප්‍රාග්ධනය මුළුමනින් ම දරන එක් විදේශීය සමාගමක් විසින් පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාරය සමාගමට පවරනු ලබන අවස්ථාවේ දී, ඒ දිනයෙහි, මුළුමනින් ම එම විදේශීය සමාගම විසින් නැතහොත් එම විදේශීය සමාගම විසින් නම් කළ යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් දරන ප්‍රාග්ධනයක් ඇත්තාවූ සහ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමක් විසින් කොටස් ප්‍රාග්ධනය මුළුමනින් ම දරන විදේශීය සමාගම් එකක් හෝ ඊට වැඩි ගණනක් විසින් පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාරය සමාගමට පවරනු ලබන අවස්ථාවේදී, ඒ දිනයෙහි, මුළුමනින් ම එම විදේශීය සමාගම් විසින් හෝ ඒ සමාගම්වල නම් කළ තැනැත්තන් විසින් දරන ප්‍රාග්ධනයක් ඇත්තාවූ ද,

(iii) ව්‍යාපාරය සමාගමට පවරනු ලබන දිනයෙහි දී සමාගම් ආඥපනතෙහි අර්ථානුකූලව පෞද්ගලික සමාගමක් නොවූ ද

යම් සමාගමක් අදහස් වේ.

---

## ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත

වෙනත් කටයුතු අතර, දැනට ලංකා රජයේ උකස් බැංකු ආඥපනත සහ කෘෂිකාර්මික සහ කාර්මික ණය සංස්ථා ආඥපනත යටතේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර පවත්වාගෙන යෑමේ අරමුණ ඇතිව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව පිහිටුවීම සඳහා ද ඒ ආඥපනත් ඉවත් කිරීම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිසත් ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් වූ පනතකි.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතෙහි ''නියමිත දිනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක වන්නේය.

## I වන කොටස

### පිහිටුවීම

2. (1) (මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද 3 වන වගන්තිය යටතේ තත් කාලයෙහි ඒ බැංකුවෙහි සාමාජිකයන්ගෙන් සමන්විත වන්නාවූ ද බැංකුවක් පිහිටුවනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධානවලට අනුකූලව මූල්‍ය හා වෙනත් ආධාර සැපයීමෙන් කෘෂිකර්ම, කර්මාන්ත හා නිවාස සංවර්ධනයට සහායවීම බැංකුවේ කාර්යය වන්නේය.

(3) බැංකුව අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර ඉහත සඳහන් නාමයෙන් බැංකුව විසින් හා බැංකුවට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි වන්නේය; තව ද මේ පනතේ විධිවිධානවලට යටත්ව බැංකුව විසින් නිශ්චල හා චංචල දේපල අත්කර ගැනීම, දැරීම හා අන්සතු කිරීම ද සංස්ථා විසින් කළහැකි සහ ඉටු කළහැකි සියලු ක්‍රියා සහ දේවල් කිරීම හා ඉටු කිරීම ද කළහැකි වන්නේය.

3. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ බැංකුවේ සාමාජිකයෝ වන්නාහ.

4. බැංකුවේ ප්‍රධාන කාර්යාලය කොළඹ තිබිය යුතුය. මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකන බැංකුවේ ශාඛා කාර්යාල පිහිටුවීම මණ්ඩලය විසින් කළ හැකිය.

5. සමාගම් ආඥාපනතේ සහ විශේෂයෙන් බැංකු පාලනය වන වෙන යම් නීතියක විධිවිධාන බැහැර කරමින් මේ පනතේ විධිවිධානවලට අනුකූලව බැංකුව පවත්වාගෙන යෑම හා එහි කළමනාකරණය කළයුතු වන්නේය.

6. මේ පනතේ විධිවිධානවලට යටත්ව, 31 වන වගන්තියෙහි සඳහන් වෙන් වෙන් ව්‍යාපාර කටයුතු වර්ග පවත්වාගෙන යෑමට සහ ඒවායේ කටයුතු කිරීමට බැංකුව වෙත බලය පවරනු ලැබේ.

## II වන කොටස

### කළමනාකරණය

### අධ්‍යක්ෂ මණ්ඩලය

7. බැංකුවේ කටයුතුවල සහ ව්‍යාපාරවල සාමාන්‍ය අධීක්ෂණය පාලනය සහ පරිපාලනය අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සුදුසු හා නිසි තැනැත්තන් පස්දෙනෙකුගෙන් සමන්විත (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයකට පවරනු ලැබේ. එසේ පත්කරනු ලබන තැනැත්තන් අතුරින් එක් තැනැත්තකු කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ විෂයය භාර අමාත්‍යාංශයේ නියෝජිතයකු විය යුතුය.

8. බැංකුවේ ව්‍යාපාර පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය වියහැකි සියලු බලතල ක්‍රියාවෙහි යෙදවීම ද සියලු ක්‍රියා හා දේවල් කිරීම ද මණ්ඩලය විසින් කළ හැකිය.

9. අධ්‍යක්ෂවරයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් හෝ අධ්‍යක්ෂවරයකු පත්කිරීමේ යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නොවන්නේය.

10. සෑම අධ්‍යක්ෂවරයකුම සාමාන්‍යයෙන් තුන් අවුරුදු කාලයකට පත්කරනු ලැබිය යුතු අතර, කලින් මිය ගියහොත්, ඉවත්ව ගියහොත් හෝ ඉවත් කරනු ලැබුවහොත් හෝ නුසුදුස්සකු බවට පත් වුවහොත් මිස ඔහු ඒ කාලය තුළ ධුරය දැරිය යුතුය.

11. අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයෙන් හා ප්‍රමාණයෙන් අනුව බැංකුවේ අරමුදල් වලින් අධ්‍යක්ෂවරයකුට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකිය.

12. (1) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා අධ්‍යක්ෂවරයකු ධුරයෙන් ඉවත් කළ හැකිය.

(2) කිසියම් තැනැත්තෙක්—

(අ) බුන්වත් යයි විනිශ්චිතව සිටී නම්; නැතහොත්

(ආ) සිහි විකල වූවෙක් නම් හෝ වරදකට වරදකරු කරනු ලැබ දඩයක විකල්පය නොමැතිව ඔහුට සිර දඬුවම නියම කර ඇත්නම්

ඔහු අධ්‍යක්ෂ ධුරයට පත් නොකළ යුතුය.

(3) අධ්‍යක්ෂ ධුරයට පත්කරනු ලැබූ තැනැත්තකු —

(අ) බුන්වත් යයි විනිශ්චය කරනු ලැබුවහොත් හෝ තම මුදලය සිය ණය හිමියන්ගේ ප්‍රතිලාභය සඳහා පැවරුවහොත් හෝ සිය ණය හිමියන් සමග ණය බේරුම් කිරීමේ ඔප්පුවකට බැඳුනහොත් හෝ සිය පාරිශ්‍රමිකය ඔවුන්ගේ ප්‍රතිලාභය සඳහා පැවරුවහොත්; හෝ

(ආ) සිහිවිකල වූවහොත් හෝ වරදකට වරදකරු කරනු ලැබ දඩයක විකල්පය නොමැතිව ඔහුට සිර දඬුවම නියම කරනු ලැබුවහොත්; හෝ

(ඇ) අමාත්‍යවරයාගේ අවසරය නොමැතිව, යම් අනුගාමී මාස තුනක් තුළ පැවැත්වුණු මණ්ඩලයේ සියලු රැස්වීම්වලට නොපැමිණියහොත්

ඔහු ස්වකීය ධුරයෙහි සිටීමට නුසුදුස්සකු බවට පත්වන අතර ඔහු අධ්‍යක්ෂවරයකුව සිටීම ඒ හේතුවෙන්ම අවසන් වන්නේය:

එසේ වුව ද, (ඇ) ඡේදය යටතේ ස්වකීය ධුරයෙහි සිටීමට නුසුදුසු බවට පත්වී ඒ හේතුවෙන්ම අධ්‍යක්ෂවරයකුව සිටීම අවසන් වන අධ්‍යක්ෂවරයකු, නැවත පත්කරනු ලැබීමට ඒ හේතුකොටගෙන නුසුදුසු වන ලෙස නොසැලකිය යුතුය.

(4) ජාතික රාජ්‍ය සභාවේ කිසිම මන්ත්‍රී වරයකු අධ්‍යක්ෂ ධුරයට පත් කිරීම හෝ ඒ ධුරයෙහි සිටීම හෝ නොකළ යුතුය.

13. (1) අධ්‍යක්ෂවරයකු පත්කරනු ලැබුවේ යම් කාලයකට ද ඒ කාලය ඉකුත් වීමේ හේතුවෙන් ඒ අධ්‍යක්ෂවරයා ධුරය දැරීම අවසන් කරන කල්හි අමාත්‍යවරයා විසින් අලුත් පත් කිරීමක් කළ යුතුය. ඉවත්ව යන අධ්‍යක්ෂවරයා අන් ආකාරයකින් නුසුදුස්සෙක් නොවී නම් නැවත පත්කරනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේය.

(2) අධ්‍යක්ෂවරයකු පත්කරනු ලැබුවේ යම් කාලයකට ද ඒ කාලය ඉකුත් වීමට පෙර ඔහු ධුරය දැරීම අවසන් කළහොත්, ඒ අධ්‍යක්ෂවරයා විසින් ධුරය දැරිය යුතුව තුබූ කාලයේ ඉතිරි කොටස සඳහා අලුත් පත්කිරීමක් අමාත්‍යවරයා විසින් කළ යුතුය.

(3) අධ්‍යක්ෂවරයකුට නිවාඩු දී තිබෙන අවස්ථාවක, ඒ අධ්‍යක්ෂවරයාට නිවාඩු දී තිබෙන කාලය සඳහා අලුත් පත්කිරීමක් අමාත්‍යවරයා විසින් කළ හැකිය.

14. (1) අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයන් අතුරින් මණ්ඩලයේ සභාපති පත්කළ යුතුය. තමා පැමිණ සිටින මණ්ඩලයේ සෑම රැස්වීමකට මූලාසනය සභාපති විසින් දැරිය යුතු අතර ඡන්දවල සමානත්වයක් ඇතිවන සියලු අවස්ථාවල දී දෙවන හෝ තීරක ඡන්දයක්

ඔහුට ඇත්තේය. සභාපති නොපැමිණි විටක රැස්වීමට පැමිණ සිටින අධ්‍යක්ෂවරයන් විසින් තමන් අතුරින් කෙනෙකු මූලාසනය දැරීම සඳහා තෝරා ගතයුතු අතර තීරක ඡන්දයකට ඇති අයිතිවාසිකම ඇතුළු සභාපතිගේ සියලු බලතල ඒ රැස්වීමේ දී ඔහුට ඇත්තේය.

(2) මණ්ඩලයේ සභාපති ධූරයට පත්කර සිටින අධ්‍යක්ෂවරයකුට යම් කාලයක් සඳහා නිවාඩු දී තිබෙන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඒ කාලය සඳහා සභාපතිවරයකු අධ්‍යක්ෂ-වරයන් අතුරින් අලුතින් පත්කළ යුතුය.

15. (1) යටත් පිරිසෙයින් මාසයකට වරක් මණ්ඩලයේ රැස්වීමක් පැවැත්විය යුතු අතර සභාපති අවශ්‍ය යයි සලකතහොත් ඊට වැඩි වාර ගණනක් රැස්වීම් පැවැත්විය යුතුය.

(2) අධ්‍යක්ෂවරයන් දෙදෙනෙකුගේ ලිඛිත ඉල්ලීමක් පිට සභාපති විසින් විශේෂ රැස්වීමක් කැඳවිය යුතුය. රැස්වීමේ වේලාව සහ රැස්වීම පැවැත්වීමේ අරමුණ දැක්වෙන ලිඛිත හෝ මුද්‍රිත දැන්වීමකින් දින හතරක දැනුම්දීමක් සෑම අධ්‍යක්ෂවරයකු වෙත කරනු ලැබී නම් මිස එවැනි කිසිම විශේෂ රැස්වීමක් නොපැවැත්විය යුතුය.

(3) රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ කවර වූ හෝ වෙන යම් කරුණක් හෝ හේතුවක් නිසා යම් අධ්‍යක්ෂවරයකුට ස්වකීය ධූරයෙහි කාර්යයන් ඉටු කිරීමට තාවකාලිකව නොහැකිවේ යයි අමාත්‍යවරයාට පෙනී ගියහොත් ඒ අධ්‍යක්ෂවරයා වෙනුවට ක්‍රියා කිරීමට වෙන යම් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත්කළ හැකිය.

(4) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය මේ පනත යටතේ සාදන ලද රීති මගින් නිශ්චය කරන ලද පරිදි හෝ එවැනි රීති නොමැතිවිට මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබියහැකි පරිදි වන්නේය.

16. මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තුන්දෙනෙකු විය යුතු අතර මණ්ඩලය විසින් කරනු ලැබීමට බලය දී ඇති හෝ නියමිත සියලු ක්‍රියා ගණපූරණයක් තිබෙන රැස්වීමකට පැමිණ සිටින හා ඡන්දය දෙන අධ්‍යක්ෂවරයන් වැඩි දෙනෙකුගේ ඡන්දයෙන් තීරණය කළ යුතුය:

එසේ වුව ද, සාමාජිකයන් තුන්දෙනෙකු පමණක් පැමිණ සිටින කල්හි, රුපියල් විසිපන් දහසකට වැඩි කිසිම ණයක් ඒකච්ඡන්දයෙන් සම්මත වන යෝජනාවකින් හැර අනුමත නොකළ යුතුය.

17. මණ්ඩලය විසින් කරනු ලබන යම් ගනුදෙනුවකට හෝ කිරීමට අදහස් කරන යම් ගනුදෙනුවකට කෙළින්ම හෝ අන් අයුරකින් අධ්‍යක්ෂවරයකුගේ හෝ එම අධ්‍යක්ෂවරයාගේ භාර්යාවගේ/පුරුෂයාගේ හෝ යැපෙන දරුවකුගේ සම්බන්ධතාවක් තිබෙන අවස්ථාවක, එම ගනුදෙනුව සාකච්ඡා කරනු ලබන්නේ මණ්ඩලයේ යම් රැස්වීමකදී ද එම රැස්වීමේ දී ඒ අධ්‍යක්ෂවරයාවිසින් ඒ සම්බන්ධතාවේ ස්වභාවය හෙළිදරව් කළ යුතුය. එම හෙළිදරව් කිරීම මණ්ඩලයේ වාර්තාවල සටහන් කළ යුතුය. තව ද එම ගනුදෙනුව සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කරනු ලබන යම් සලකා බැලීමකට හෝ තීරණයකට එම අධ්‍යක්ෂවරයා සහභාගි නොවිය යුතු අතර ඒ සලකා බැලීම කරන හෝ තීරණය ගන්නා අවස්ථාවේ දී ඔහු එම රැස්වීමෙන් ඉවත්ව සිටිය යුතුය.

18. මණ්ඩලයේ සෑම රැස්වීමක කටයුතුවල වාර්තාවක් විධිමත් ලෙස සකස් කොට ඒ කාර්යය සඳහා තබාගනු ලබන පොත්වල ප්‍රමාණවත් ලෙස සටහන් කළයුතු අතර එක් එක් රැස්වීමේ දී කරන ලද කටයුතු පිළිබඳව නිසි ලෙස චක්‍රගත කරන ලද විස්තර දැක්වෙන පරිදි ඒ පොත් තැබිය යුතුය. එක් එක් රැස්වීමේ කටයුතුවල වාර්තාව ඊළඟට පැවැත්වෙන රැස්වීමේ දී ඉදිරිපත් කළයුතු අතර එය නිවැරදි යයි එවිට සම්මත වී නම් මූලාසනය උසුලන තැනැත්තාගේ අත්සනින් එය ස්ථිර කළ යුතුය. තව ද, එය යම් රැස්වීමක කටයුතුවල වාර්තාවක් වී ද ඒ කටයුතු පිළිබඳව එය මුල් බැල්මට පෙනෙන පිළිගත යුතු සාක්ෂිය වන්නේය.

19. අමාත්‍යවරයා විසින්, මණ්ඩලය විමසීමෙන් පසු, බැංකුවේ ව්‍යාපාර කටයුතු කිරීමට අදාළ සාමාන්‍ය හෝ විශේෂ විධාන මණ්ඩලයට ලියවිල්ලකින් දිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතුය.

### බැංකුවේ නිලධරයෝ

20. (1) මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි වැටුපක් සහ දීමනාවක් පිට මණ්ඩලය විසින් බැංකුවේ කාර්ය මණ්ඩලයට සාමාන්‍යාධිකාරිවරයකු පත්කළ යුතුය.

(2) සාමාන්‍යාධිකාරි බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, බැංකුව විසින් හෝ මණ්ඩලය විසින් හෝ කළයුතු යයි මේ පනතින් නියමිත සියලු ක්‍රියා, ඒ ක්‍රියා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරි වෙත විශේෂයෙන් හෝ සාමාන්‍යයෙන් ලියවිල්ලකින් බලය පවරා ඇත්තේ නම්, පද සම්බන්ධයෙන් පටහැනි අදහසක් පෙනී ගියහොත් මිස, සාමාන්‍යාධිකාරි විසින් කළ හැකිය.

(3) සාමාන්‍යාධිකාරි, මණ්ඩලයේ ලේකම් වශයෙන් ක්‍රියා කළයුතු අතර, මණ්ඩලය විසින් අන්ලෙසක් විධාන කළහොත් මිස, ඔහු මණ්ඩලයේ සෑම රැස්වීමකට පැමිණ ඊට සහභාගි විය යුතු නමුදු ඡන්දය දීමේ කිසිම අයිතිවාසිකමක් ඔහුට නොතිබිය යුතුය.

21. මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන සේවා නියුක්තයන් මණ්ඩලය විසින් පත්කළ හැකිය. ඒ සේවා නියුක්තයන්ගේ වැටුප් සහ දීමනා කලින් කල නියම කිරීම ද වෙනස් කිරීම ද මණ්ඩලය විසින් කළ හැකිය.

22. නෛතික, ආර්ථික, මූල්‍ය හෝ කාර්මික උපදේශකයන් වශයෙන් ක්‍රියා කිරීම සඳහා යථා පරිදි සුදුසුකම් ලත් යම් තැනැත්තකු, ව්‍යාපාර ආයතනයක් හෝ සංස්ථාගත වූ හෝ සංස්ථාගත නොවූ මණ්ඩලයක් සහ තක්සේරුකාර මූල මණ්ඩලයක් කලින් කල බැංකුවට පත්කිරීම මණ්ඩලය විසින් කළහැකි අතර නියම කළහැකි ගාස්තු ප්‍රමාණවලට අනුකූලව ඒ තැනැත්තන්ට පාරිශ්‍රමික ගෙවිය යුතුය.

23. වෙනත් තැනැත්තකු වෙත පවරාදීමට මණ්ඩලයට බලය ඇති යම් ක්‍රියාවක් මණ්ඩලය වෙනුවෙන් කිරීම සඳහා ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් ස්ථානයක ස්වකීය නියෝජිතයා වශයෙන් යම් බැංකුවක් හෝ යම් තැනැත්තකු පත්කිරීම මණ්ඩලය විසින් කළහැකි අතර ඒ නියෝජිතයා විසින් ඉටු කළයුතු කාර්යයන් හා ඒ සඳහා ගෙවිය යුතු පාරිශ්‍රමික පිළිබඳව ඒ නියෝජිතයා සමග ගිවිසුමකට එළඹීම ද මණ්ඩලය විසින් කළ හැකිය.

### පොදු විධිවිධාන

24. මණ්ඩලය විසින් නිදහස් කරනු ලැබූ යම් සේවා නියුක්ත පන්තියක සාමාජිකයකු නොවන බැංකුවේ සෑම සේවා නියුක්තයකුම විසින් ස්වකීය කාර්යයන් නිසි පරිදි හා අවංකව ඉටු කරන බවට මණ්ඩලය සෑහීමකට පත්වන ඇපයක් තැබිය යුතුය.

25. බැංකුවේ කිසිම අධ්‍යක්ෂවරයෙක් හෝ කිසිම සේවා නියුක්තයෙක් මේ පනත යටතේ වූ ඔහුගේ බලතල ක්‍රියාත්මක කරමින් හෝ ක්‍රියාත්මක කරන්නේ යයි සිතාගෙන සද්භාවයෙන් ක්‍රියා කිරීමේ දී ඔහු විසින් කරනු ලබන හෝ නොකර හරිනු ලබන යම් දෙයක් සම්බන්ධයෙන් සිවිල් වශයෙන් හෝ අපරාධ වශයෙන් වගකිව යුතු නොවන්නේය.

26. බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකුට, සාමාන්‍යාධිකාරිවරයකුට, විගණකවරයකුට, ලේකම්වරයකුට, උපදේශකයකුට, හෝ වෙනත් සෑම සේවා නියුක්තයකුට ඔහුගේ විෂමාචාරයෙන් හෝ චුවමනාවෙන්ම කළ පැහැර හැරීමෙන් සිදු වී යයි මණ්ඩලය විසින් සලකනු ලබන පාඩු හා වියදම් හැර ඔහුගේ කාර්යයන් ඉටු කිරීමේ දී හෝ ඉටු කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් දරන ලද සියලු පාඩු සහ වියදම් සම්බන්ධයෙන් බැංකුව විසින් වන්දි ගෙවිය යුතුය.

27. බැංකුවේ කිසිම අධ්‍යක්ෂවරයකු හෝ සේවා නියුක්තයකු බැංකුව විසින් වෙන යම් තැනැත්තකුට දෙන ලද යම් ණයක් ආපසු ගෙවීම සඳහා ඇප නොවිය යුතුය.

28 බැංකුව විසින් බැංකුවේ යම් අධ්‍යක්ෂවරයකුට හෝ සේවා නියුක්තයකුට, නැතහොත් අධ්‍යක්ෂවරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ භාර්යාවට/ස්වාමිපුරුෂයාට හෝ යැපෙන දරුවකුට, නැතහොත් බැංකුවේ යම් අධ්‍යක්ෂවරයකුට හෝ සේවා නියුක්තයකුට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇති යම් සමාගමකට හෝ ව්‍යාපාර ආයතනයකට කිසිම ණයක් නොදිය යුතුය:

එසේ වුව ද වාසස්ථානයක් ඉදි කිරීම සඳහා යම් ඉඩමක් මිලට ගැනීම හෝ වාසස්ථානයක් මිලට ගැනීම, ඉදි කිරීම, අලුත්වැඩියා කිරීම, අලුත් කිරීම හෝ විශාල කිරීම සඳහා බැංකුව විසින් තම සේවා නියුක්තයන්ට ණය දිය හැකිය.

මේ වගන්තියේ කාර්යයන් සඳහා "සැලකිය යුතු සම්බන්ධතාව" යන්න—

(අ ) සමාගමක් සම්බන්ධයෙන් යෙදුණු විට, ඒ සමාගමේ කොටස් සඳහා ගෙවා නිමි මුදල රුපියල් පන්ලක්ෂය හෝ ඒ සමාගමේ ගෙවා නිමි ප්‍රාග් ධනයෙන් සියයට පහ යන දෙකින් වඩා අඩු මුදල ඉක්මවන ඒ සමාගමේ කොටස්වල අර්ථලාභී සම්බන්ධතාවක් පුද්ගලයකු හෝ ඔහුගේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ යැපෙන දරුවා විසින් තනි තනිව හෝ එක්ව දැරීම එයින් අදහස් වේ; තව ද

(ආ) ව්‍යාපාරික ආයතනයක් සම්බන්ධයෙන් යෙදුනු විට, ඒ ව්‍යාපාරික ආයතනයේ සියලු හවුල්කරුවන් විසින් දයක වී ඇති මුළු ප්‍රාග් ධනයෙන් සියයට පහකට සමාන මුදලක් ඉක්මවන ප්‍රමාණයක අර්ථලාභී සම්බන්ධතාවක් පුද්ගලයකු හෝ ඔහුගේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ යැපෙන දරුවා විසින් ඒ ව්‍යාපාරික ආයතනයෙහි තනි තනිව හෝ එක්ව දැරීම, එයින් අදහස් වේ.

29. සෑම අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරිවරයකු, විගණකවරයකු, ලේකම්වරයකු, උපදේශකවරයකු, සේවා නියුක්තයකු, ඒජන්සියක සාමාජිකයකු, ගණකාධිකාරිවරයකු හෝ බැංකුවේ ව්‍යාපාර කටයුතුවල සේවයෙහි යොදවනු ලැබූ වෙනත් සෑම තැනැත්තකු විසින් ස්වකීය කාර්යයන් භාර ගැනීමට පෙර, බැංකුවේ සියලු ගනුදෙනු එහි අනුග්‍රාහකයන් සහ යම් තැනැත්තකු සමග ඇති ගිණුම්වල තත්ත්වය හා ඊට සම්බන්ධ සියලු කරුණු පිළිබඳව පූර්ණ රහස්‍යතාව රකින බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයකට අත්සන් තැබිය යුතු අතර ඒ ප්‍රකාශයෙන්—

(අ ) (i) මණ්ඩලය විසින්, හෝ

(ii) අධිකරණයක් විසින්, හෝ

(iii) ඒ කරුණු අදාළ වන්නේ යම් තැනැත්තකු කෙරෙහි ද ඒ තැනැත්තා විසින්

ඉල්ලා සිටි විට;

(ආ) ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී; සහ

(ඇ) මේ පනතේ හෝ වෙන යම් නීතියක විධිවිධාන කිසිවක් අනුව ක්‍රියා කිරීම සඳහා

හැර, ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී තමාට දැනගන්නට ලැබෙන කිසියම් කරුණක් අනාවරණය නොකිරීමට පොරොන්දු විය යුතුය.

30. අධ්‍යක්ෂවරයකුගෙන්, සාමාන්‍යාධිකාරිවරයෙකුගෙන්, විගණකවරයෙකුගෙන්, ලේකම්වරයෙකුගෙන්, උපදේශකවරයෙකුගෙන් හෝ බැංකුවේ වෙනයම් සේවා නියුක්තයෙකුගෙන් කවර අවස්ථාවක දී වුව ද බැංකුවේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් අසනු ලබන කිසියම් ප්‍රශ්නයකට දෙන පිළිතුර නිසා බැංකුවේ රහස් හෝ බැංකුවේ යම් අනුග්‍රාහකයෙකුගේ වෙළෙඳ ව්‍යාපාර හෝ කටයුතු හෝ අනාවරණය වෙතැයි හෝ අනාවරණය වීමට ඉඩ ඇතැයි ඒ තැනැත්තා සලකතහොත් එවැනි ප්‍රශ්නවලට පිළිතුරු දීම ඉහතින් වූ වගන්තියෙහි දක්වෙන අවස්ථාවන්හි දී හැර ඒ සැම තැනැත්තකු විසින් ප්‍රතික්ෂේප කළ යුතුය.

## III වන කොටස

### ව්‍යාපාර කටයුතු

31. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මෙහි මින් මතු සඳහන් වෙන් වෙන් ව්‍යාපාර කටයුතු වර්ග පවත්වාගෙන යෑමට හා ඒවායේ කටයුතුවල යෙදීමට බැංකුවට බලය දෙනු ලැබේ:-

(අ) (i) යම් කෘෂිකාර්මික හෝ කාර්මික කාර්යයක් සඳහා ප්‍රයෝජනයට ගෙන තිබෙන හෝ ප්‍රයෝජනයට ගැනීමට තිබෙන යම් ඉඩමක් මිළ දී ගැනීමේ හෝ බදු ගැනීමේ හෝ ඒ ඉඩම වගා කිරීමේ, සංවර්ධනය කිරීමේ හෝ දියුණු කිරීමේ;

(ii) යම් කෘෂිකාර්මික හෝ කාර්මික කාර්යයකට සම්බන්ධව ප්‍රයෝජනයටගෙන තිබෙන හෝ ප්‍රයෝජනයට ගැනීමට තිබෙන යම් ගොඩනැගිල්ලක්, කර්මාන්ත ශාලාවක්, මෝලක්, පතලක්, යන්ත්‍රයක් හෝ උපකරණයක් මිල දී ගැනීමේ හෝ බදු ගැනීමේ හෝ තැනීමේ හෝ අලුත්වැඩියා කිරීමේ හෝ අලුත් කිරීමේ;

(iii) වාසස්ථානයක් ගොඩනැගීම සඳහා යම් ඉඩමක් මිල දී ගැනීමේ හෝ බදු ගැනීමේ;

(iv) වාසස්ථානයක් ගොඩනැගීමේ, අලුත්වැඩියා කිරීමේ, අලුත් කිරීමේ හෝ විශාල කිරීමේ;

(v) වාසස්ථානයක් මිල දී ගැනීමේ හෝ බදු ගැනීමේ;

(vi) වෙළෙඳ පොළෙහි විකිණීම සඳහා යම් කෘෂිකාර්මික හෝ කාර්මික නිෂ්පාදනයක් හෝ වෙළෙඳ භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ හෝ පිළියෙළ කිරීමේ;

(vii) ඉහත සඳහන් අනුච්ඡේද අතුරින් යම් අනුච්ඡේදයක සඳහන් යම් කාර්යයකට ආනුෂංගික, අනුබද්ධ හෝ අනුයාත යම් කාර්යයක් කිරීමේ;

(viii) ඉහත සඳහන් අනුච්ඡේද අතුරින් යම් අනුච්ඡේදයක සඳහන් යම් කාර්යයක දී එවකටත් දරා ඇති යම් ණයක් ගෙවා අවසන් කිරීමේ

කාර්යය සඳහා යම් තැනැත්තකුට පොලියට යටත් කොට ණය දීම;

(ආ) යම් කෘෂිකාර්මික හෝ කාර්මික වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යෑමේ කාර්යය සඳහා හෝ බැංකුවේ විෂය සීමාවට අයත් වන කාර්යයක් සඳහා ලබාගත් ණය මුදලක් ආරක්ෂා කිරීම සඳහා කරනු ලබන උකසක් වූ යම් උකසක් යටතේ දරන ලද ණය බේරුම් කිරීම සඳහා යම් තැනැත්තකුට පොලියට යටත් කොට මුදල් ණයට දීම;

(ඇ) කෘෂිකාර්මික හෝ කාර්මික සංවර්ධනය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ යම් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා යම් තැනැත්තකුට මුදල් ණයට දීම;

(ඈ) කෘෂිකර්මයෙහි හෝ කර්මාන්තවල පාවිච්චි කරනු ලබන යන්ත්‍ර හා උපකරණ කුලී සින්නක්කර ක්‍රමයට විකිණීමේ වෙළෙඳ ව්‍යාපාරය පවත්වාගෙන යෑම;

(ඉ) බැංකුව විසින් දෙන ලද යම් ණයක් පිළිබඳ වූ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා බැංකුවේ යම් ගනුදෙනුකරුවකුගේ යම් කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යාපාරයක් බැංකුව විසින් කළමනාකරණය කිරීම, අධීක්ෂණය කිරීම හෝ පාලනය කිරීම නැතහොත් එහි කළමණාකරණයට, අධීක්ෂණයට හෝ පාලනයට බැංකුව සහභාගිවීම අවශ්‍ය බව බැංකුවට පෙනී යන අවස්ථාවක පාරිශ්‍රමික සහිතව හෝ රහිතව ඒ කළමණාකරණයෙහි, අධීක්ෂණයෙහි හෝ පාලනයෙහි යෙදීම හෝ පාරිශ්‍රමික සහිතව හෝ රහිතව එම කළමනාකරණයෙහි, අධීක්ෂණ-යෙහි හෝ පාලනයෙහි ලා සහභාගිවීම;

(ඊ) බැංකුවේ යම් ගනුදෙනුකරුවකුගේ යම් කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යාපාරයකට සම්බන්ධ යම් කරුණක් පිළිබඳව ඒ ගනුදෙනුකරුගේ කාර්මික උපදේශක වශයෙන් පාරිශ්‍රමික සහිතව හෝ රහිතව ක්‍රියා කිරීම;

(උ) බැංකුවේ යම් අතිරික්ත අරමුදල් යෙදවීමේ කාර්යය සඳහා ආණ්ඩුව විසින් හෝ මහා බැංකුව විසින් නිකුත් කරනු ලැබූ හෝ සහතික කරනු ලැබූ ස්කන්ධ, කොටස්, ණය පත්‍ර, උකස්, බැඳුම්කර හෝ සුරැකුම්පත් මිල දී ගැනීම, විකිණීම, ඒවා ආයෝජනය කිරීම හෝ ඒවා පිළිබඳ කටයුතු කිරීම;

(ඌ) බැංකුවේ යම් ගනුදෙනුකරුවකු විසින් බැංකුවට උකස් කරන ලද යම් දේපලක් රක්ෂණය කිරීම සඳහා කටයුතු සැලැස්වීම;

(එ) බැංකුව සතුව ඇති යම් සුරැකුම්පත් මුදල් කර ගැනීම පහසු කරලීම පිණිස, නැතහොත් ඇති වෙතැයි සිතෙන යම් අලාභයක් හෝ වගකීමක් වැලැක්වීම හෝ අඩුකර ගැනීම සඳහා පවත්වාගෙන යෑමට බැංකුවට බලය ඇති හෝ අත්කරගැනීම අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි බැංකුව විසින් සලකනු ලබන යම් වෙළෙඳ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය යයි හෝ හිතකර යයි බැංකුව විසින් සලකනු ලැබිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් සහ යම් අයිතිවාසිකම් හෝ වරප්‍රසාද මිල දීගැනීම, බදු ගැනීම, හුවමාරු කර ගැනීම, කුලියට ගැනීම හෝ අන් ලෙසකින් අත්කර ගැනීම;

(ඒ) බැංකුවේ සේවකයන්ගේ හෝ ඒ සේවකයන්ගෙන් යැපෙන්නන්ගේ අර්ථලාභය පිණිස විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සහ වෙනත් අරමුදල් හා පහසුකම් සැලැස්වීම සඳහා වූ සංගම්, ආයතන, භාරකාර මණ්ඩල හා යෝජනා ක්‍රම පිහිටුවීම හා ඒවාට ආධාර කිරීමට හෝ ඒවා පිහිටුවීමට හා ඒවාට ආධාර කිරීමට සහාය වීම;

(ඔ) යම් චංචල හෝ නිශ්චල දේපලක ඇපය පිට බැංකුව විසින් යම් ණයක් දී තිබේ ද නැතහොත් යම් චංචල හෝ නිශ්චල දේපලක් බැහැර කිරීමේ යම් බලයක් බැංකුවට තිබේ ද ඒ දේපල ඇතුළු බැංකුවේ සියලු දේපල හෝ ඉන් යම් කොටසක් සහ බැංකුවේ අයිතිවාසිකම් දියුණු කිරීම, කළමනාකරණය කිරීම, සංවර්ධනය කිරීම, හුවමාරු කිරීම, බදු දීම, උකස් කිරීම, බැහැර කිරීම, විකිණීම, ප්‍රයෝජවත් කිරීම හෝ ඒ පිළිබඳව අන් ලෙසකින් කටයුතු කිරීම;

(ඕ) බැංකුවේ කාර්යයට හිතකර යයි බැංකුවට පෙනී යා හැකි අයිතිවාසිකම්, අනුග්‍රහ හා වරප්‍රසාද කිසිවක් ලබාගැනීම පිණිස යම් සහතිකයක් හෝ හානි රක්ෂණයක් දීම, සහ විදේශීය සංවිධාන කිසිවක් හෝ ආණ්ඩුව හෝ යම් පළාත් පාලන ආයතනයක් හෝ යම් සංස්ථාවක් හෝ වෙනත් තැනැත්තකු සමග යම් ගිවිසුම්වලට එළඹීම;

(ක) යම් අවසස්ථාවක ණයට ගනු ලබන හා තැන්පතු වශයෙන් භාරගනු ලබන මුදලෙහි සමස්තය අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන උපරිම සීමාව නො ඉක්මැවෙන ලෙස, පාර්ශ්වකරුවන් විසින් අන්‍යෝන්‍ය වශයෙන් එකඟවන නියම හා කොන්දේසි පිට, ආණ්ඩුවෙන් හෝ මහා බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ඒ කාර්යය සඳහා අනුමත කරනු ලැබූ යම් ආයතන වලින් මුදල් ණයට ගැනීම හෝ තැන්පතු භාර ගැනීම;

(ග) පාර්ශ්වකරුවන් විසින් අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වන නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව, බැංකුවේ සංචිත අරමුදල අරභයා ආණ්ඩුවෙන් දායක මුදල් භාර ගැනීම;

(ච) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි අවම ප්‍රමාණික මුදලින් යුක්ත වූ ද එසේ නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමා සඳහා වූ ද වාරික තැන්පතු යම් තැනැත්තකුගෙන් භාර ගැනීම;

(ජ) බැංකුවේ මුදල් කෘෂිකර්මයෙහි හෝ කර්මාන්තයන්හි යෙදී සිටින පොදු හෝ පෞද්ගලික සමාගම්වලට අයත් කොටස්වල, ණය පත්‍රවල හෝ වෙනත් නිසි සුරැකුම්පත්වල ආයෝජනය කිරීම;

(ට) ඒ කොටස්, ණය පත්‍ර හෝ වෙනත් නිසි සුරැකුම්පත් ප්‍රතිරක්ෂණය කිරීම;

(ඩ) බැංකුවේ ආයෝජන ලැයිස්තුවේ ආයෝජන කිසිවක් වෙළෙඳ පොළෙහි විකිණීම:

(ණ) වෙනත් බැංකු හා අමාත්‍යවරයා විසින් කලින් කල අනුමත කරනු ලැබිය හැකි වෙනත් ආයතන සමග සංගාමිව හෝ හවුල්ව යෝජනා ක්‍රමවලට මුදල් යෙදවීම;

(ත) අවස්ථාවෝචිත පරිදි බැංකුවේ යම් ගනුදෙනුකරුවකුගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ යම් කෘෂිකාර්මික හෝ වෙනත් නියමිත ව්‍යාපාරයක් සඳහා අවශ්‍ය යම් යන්ත්‍රෝපකරණ හෝ උපකරණ හෝ යම් වර්ගයක ද්‍රව්‍ය මිලට ගැනීමෙ කාර්යය සඳහා එම ගනුදෙනුකරුගේ හෝ වෙනත් තැනත්තාගේ නියෝජිත වශයෙන් ක්‍රියා කිරීම;

(ද) පවත්වාගෙන යැමට බැංකුවට අවසර ඇති වෙළෙඳ ව්‍යාපාරයක් වූ ද යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙහි පවත්වාගෙන යනු ලබන්නා වූ ද යම් ව්‍යාපාරයක් සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් අත්කර ගෙන පවත්වාගෙන යෑම;

(න) කාර්මික, මූල්‍ය සහ කළමනාකරණ සේවා සඳහා යම් ආයතනයක් පිහිටුවා පවත්වාගෙන යෑම හෝ යම් යෝජනා ක්‍රමයකට සහභාගි වීම;

(ප) ආර්ථික ගවේෂණ, අධ්‍යයන පාඨමාලා හා සාකච්ඡා සම්මෙලන පැවැත්වීම;

(බ) තෝරාගනු ලබන බැංකුවේ නියුක්තයන් හා වෙනත් තැනැතන් ගණකාධිකරණය, බැංකු ක්‍රම සහ අගැයීම, ව්‍යාපෘති සහ ණය සුදුසුකම් මිලකරණය යන විෂයයන්හි ද ඉංජිනේරු හා විද්‍යා දක්ෂතාවන්හි ද පුහුණු කිරීම;

(ම) සාමාන්‍යයෙන් බැංකුවේ කීර්තිය රැකගැනීමට සහ එහිලා ආධාර වීමට ඉතාමත් යෝග්‍ය යයි බැංකුව සලකන සියලු පියවර ගැනීමට හෝ ඒ පියවර එසේ ගැනීමේ දී ඒ හා සංගමනය වීම සහ ඉහතින් වූ ඡේදයන්හි දැක්වෙන අරමුණු මුදුන් පමුණුවා ගැනීමට හෝ බලතල ක්‍රියාවෙහි යෙදවීමට ආනුෂංගික හෝ ඊට තුඩු දෙන සියලු දේවල් කිරීම; සහ

(ය) යම් කෘෂිකාර්මික හෝ වෙනත් නියමිත ව්‍යාපාරයක යම් නිෂ්පාදනයක් විකිණීම හෝ අලෙවි කිරීම සඳහා අවශ්‍ය සංවිධානයක් පිහිටුවීම.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි යම් ඡේදයක සඳහන් යම් අරමුණක් හෝ කාර්යයක්, පද සම්බන්ධයෙන් ප්‍රකාශිතවම නියම කරනු ලැබ තිබෙන අවස්ථාවක දී හෝ යම් සීමා කිරීමක් හෝ සීමා නියම කිරීමක් නියමිත අවස්ථාවක දී හැර, ඒ උපවගන්තියේ වෙන යම් ඡේදයක නියමයන් හෝ එහි නිශ්චිතව සඳහන් අරමුණු ගැන සැලකීමෙන් හෝ ඒ පිළිබඳ අනුමිතියෙන් හෝ අන් ආකාරයකින් සීමා නොකළ යුතුය, නොහොත් එසේ එහි ලා සීමා නියම නොකල යුතුය.

(3) මේ වගන්තියෙහි "බැංකුවේ ගනුදෙනුකරු" යන්නෙන් මේ පනත යටතේ බැංකුවෙන් ආධාර ලබන තැනැත්තෙක් අදහස් වේ.

32. (1) මණ්ඩලයේ යෝජනා සම්මතයකින් සහ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි අනුව හැර කිසිම ණයක් නොදිය යුතුය:

එසේ වුව ද, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ප්‍රමාණයක් දක්වා ණය දීමට, මණ්ඩලය විසින් 20 (2) වන වගන්තිය යටතේ සාමාන්‍යාධිකාරිවරයාට බලය දිය හැකිය.

(2) මේ වගන්තියේ විධිවිධාන යටතේ සාමාන්‍යාධිකාරිවරයා විසින් දෙන ලද සියලු ණය, මණ්ඩලයේ ඊළඟ රැස්වීමේ දී මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය.

33. ණයක් අනුමත කිරීමෙන් පසුව සහ නියම වශයෙන් මුදල් ගෙවීමට පෙර යම් වේලාවක, මණ්ඩලය විසින්, ස්වකීය අභිමතය අනුව, සහ කිසිම හේතුවක් නොදක්වා, ඒ අනුමත කිරීම අවලංගු කර හෝ වෙනස් කර ඒ මුදලේ මුළු ප්‍රමාණයම හෝ ඉන් කොටසක් ගෙවීම අත්හිටුවිය හැකිය

34. (1) ණයක් දෙනු ලැබුවේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යය සඳහා ඒ ණය යොදගත් බවට හෝ යොදන බවට මණ්ඩලය සෑහීමට පත් කරන ලෙස මණ්ඩලය විසින් ඒ ණය දෙනු ලැබූ තැනත්තාගෙන් ඉල්ලා සිටිය හැකි අතර එසේ ඉල්ලනු ලැබුවේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා විසින්, ඒ ණය ඒ කාර්යය සඳහා යොදගත් බව හෝ යොදන බව ඔප්පු කිරීම සඳහා, යම් අධ්‍යක්ෂවරයකු හෝ ඒ කාර්යය සඳහා ලියවිල්ලකින් පත් කරනු ලැබූ වෙන යම් තැනැත්තකු ඉදිරිපිට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(2) ණය දෙනු ලැබුවේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යය සඳහා ඒ ණය යොදගත් බවට හෝ යොදන බවට මණ්ඩලය සෑහීමට පත් නොවී නම්, නියමයෙහි සඳහන් කාලය ඇතුළත ඒ ණය පොලියත් සමග සම්පූර්ණයෙන් ආපසු ගෙවන ලෙස හෝ ඒ ණයට සමාන මුදලක් එකී කාර්ය සඳහා යොදගන්නා ලෙස මණ්ඩලය විසින් නියමයකින් විධාන කළ හැකිය.

(3) (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් කරන ලද නියමයකට අනුකූලව ක්‍රියා කරනු නොලැබූ අවස්ථාවක, ණය මුදලින් ආපසු නොගෙවා ඇති සම්පූර්ණ කොටස සහ එතෙක් ඊට ලැබිය යුතුව තිබුණු පොළිය සම්බන්ධයෙන් පැහැර හැරීම කරනු ලැබූ ලෙස සැලකිය යුතු අතර, මේ පනතේ V වන කොටසේ විධිවිධාන ඒ අනුව අදළ වන්නේය.

35. (1) ණයක් දීමෙන් පසු යම් විටක—

(අ) දේපළ උකසක් පිට ණය දී ඇති අවස්ථාවක—

(i) ණයෙහි සුරක්ෂිත භාවයට හානිකර විය හැකි ප්‍රමාණයකට දේපළෙහි වටිනාකම ක්ෂය වීඇති බවට, හෝ

(ii) ණය ගන්නාගේ නිත්‍යානුකූල අයිතිය සලකා බලනවිට, ඒ දේපළ ප්‍රමාණවත් යයි පිළිගත යුතුව නොතුබුණු බවට; හෝ

**43.** බැංකුව විසින් විදේශීය ආණ්ඩු වලින් හෝ ශ්‍රී ලංකා ජනරජයෙන් පිටත වෙනත් ප්‍රභවයන්ගෙන් යම් ණයට ගැනීමක් කරනු ලබන කල්හි ශ්‍රී ලංකාවේ රුපියල නැවත අගය කිරීමකින් උද්ගතවන යම් පාඩුවක් බැංකුව විසින් දැරිය යුතුය; නැතහොත් එසේ උද්ගතවන යම් ලාභයකට බැංකුව හිමිකම ලැබිය යුතුය;

එසේ වුව ද ඒ ණයවලට ආණ්ඩුව ඇප වූ අවස්ථාවක යම් අලාභයක් ආණ්ඩුව විසින් දැරිය යුතුය; නැතහොත් යම් ලාභයකට ආණ්ඩුව හිමිකම ලැබිය යුතුය.

**44.** ණයක් සම්බන්ධයෙන් වූ යම් ගෙවීමක් එම ගෙවීම ලැබිය යුතු දිනයට පෙර, බැංකුව එකඟ වන නියම හා කොන්දේසි පිට, බැංකුව විසින් භාරගනු ලැබිය හැකිය.

**45** (1) බැංකුව හෝ මණ්ඩලය විසින් —

(අ) බැංකුවෙහි ප්‍රාග්ධනයට ලැබෙන දායක මුදල් වශයෙන්;

(ආ) බැංකුවෙහි කාර්යයන් කරගෙන යෑමෙන්;

(ඇ) බැංකුවෙහි හෝ මණ්ඩලයෙහි බලතල ක්‍රියාවෙහි යෙදවීමෙන් හෝ කාර්යයන් ඉටු කිරීමෙන්; සහ

(ඈ) බැංකුවෙහි ව්‍යාපාර කටයුතු සහ පරිපාලනය පවත්වාගෙන යෑමෙන්

ලබන සියලු මුදල් බැංකුවේ අරමුදලට බැරකළ යුතුය.

(2) (අ) බැංකුවෙහි කාර්යයන් කරගෙන යෑමෙන්;

(ආ) බැංකුවෙහි හෝ මණ්ඩලයෙහි බලතල ක්‍රියාවේ යෙදවීමෙන් හෝ කාර්යයන් ඉටු කිරීමෙන්; සහ

(ඇ) බැංකුවෙහි ව්‍යාපාර කටයුතු සහ පරිපාලනය පවත්වාගෙන යෑමෙන්.

උද්ගතවන හෝ බැංකුවට හෝ මණ්ඩලයට ඒ සම්බන්ධයෙන් දරන්නට සිදුවන සියලු මූල්‍ය වගකීම් සහ බැඳීම් බැංකුවේ මුදල් කෙරෙහි වැය බරක් වන්නේය.

**46.** 1971 අංක 38 දරන මුදල් පනතේ 10 වන වගන්තියෙහි දැක්වෙන කාර්යයන් සියල්ල හෝ ඉන් යම් කාර්යයක් සඳහා බැංකුවෙහි ලාභ යෙදිය යුතුය.

## V වන කොටස

### අයකර ගැනීම

**47.** මුල් මුදල හෝ පොලිය හෝ ඒ දෙකම හෝ වශයෙන් යම් ණය මුදලක් මත ලැබිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හරින කවර අවස්ථාවක වුව ද එම පැහැර හැරීම, ණය මුදලෙහි ආපසු නොගෙවා ඇති සම්පූර්ණ කොටස සහ එතෙක් ඊට ලැබිය යුතුව තිබුණු පොලිය සම්බන්ධයෙන් කරන ලද පැහැර හැරීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින්, සිය අභිමතය අනුව 48 වන වගන්තියෙහි හෝ 50 වන වගන්තියෙහි දක්වා ඇති ආකාරයට ක්‍රියා කළ හැකිය:

එසේ වුව ද, මණ්ඩලය විසින් යම් ණයක් සම්බන්ධයෙන් 48 වන වගන්තිය අනුව ක්‍රියා කර හෝ ක්‍රියා කිරීම ආරම්භ කර තිබෙන අවස්ථාවක, 50 වන වගන්තිය යටතේ යෝජනා සම්මතයක් මගින් පසුව යම් අවස්ථාවක ඒ කරුණ සම්බන්ධයෙන් කටයුතු කිරීම සුදුසු යයි හෝ අවශ්‍ය යයි මණ්ඩලය අදහස් කරන්නේ නම් මණ්ඩලය විසින් එසේ කිරීම කිසිවකින් වලකනු ලැබේ යයි නොසැලකිය යුතුය.

48. (1) 51 වන වගන්තියෙහි විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් ලියා වාර්තාගත කළ යුතු යෝජනා සම්මතයක් මගින් එම යෝජනා සම්මතයෙහි සඳහන් යම් තැනැත්තකුට, ගෙවීම් පැහැර හැරීම කර ඇත්තේ යම් ණයක් සම්බන්ධයෙන් ද එම ණය සඳහා ඇප ලෙස බැංකුවට උකස් කර ඇති නිශ්චල දේපලට නැතහොත් එම දේපල සම්බන්ධයෙන් යම් ණය ගිවිසුමක නියමයන් කඩ කර ඇතහොත් එවිට ද එම දේපලට පිවිස, එම දේපළ සන්තකයට ගෙන කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම පිණිස ද උකස්කරු විසින් ගෙවීම් පැහැර හැරීම හෝ ඒ ගිවිසුමෙහි නියමයන් කඩ කිරීම නොකරන ලද නම් එම දේපළ පාලනයෙහි සහ කළමනාකරණයෙහි ලා උකස් කරු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිව තිබූ යම් බලතල වේ ද ඒ බලතල ක්‍රියාත්මක කිරීම පිණිස ද බලය පැවරිය හැකිය.

(2) යම් පිරියතක්, යන්ත්‍රයක් හෝ වෙනත් චංචල දේපළක් බැංකුව වෙත ඇප වශයෙන් ඇතිව යම් කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යාපාරයක් සඳහා දෙන ලද ණයක් මත ලැබිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හැර තිබෙන හෝ එම දේපළ සම්බන්ධයෙන් යම් ණය ගිවිසුමක නියමයන් කඩකර තිබෙන කවර අවස්ථාවක වුව ද, මණ්ඩලය විසින්, ලියවිල්ලකින් සඳහන් යම් තැනැත්තකුට, ඒ පිරියත, යන්ත්‍රය හෝ වෙනත් චංචල දේපළ පිහිටි කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යාපාරයට පිවිස එම ව්‍යාපාරයෙහි සන්තකය භාර ගැනීමට ද ඒ නිශ්චල දේපළ ඔඩපනය කර හෝ උකස් කර තිබුණි නම් එම දේපළ පාලනය කිරීමෙහි සහ කළමනාකරනය කිරීමෙහි ලා ක්‍රියාත්මක කළහැකි වන්නට තුබුණු යම් බලයක් වේද එම බලය ඒ ව්‍යාපාරය පාලනය කිරීමෙහි සහ කළමනාකරණය කිරීමෙහි ලා ක්‍රියාත්මක කිරීමට ද බලය දිය හැකිය.

49. (1) යම් දේපළක් සම්බන්ධයෙන් 48 වන වගන්තිය යටතේ මණ්ඩලයේ යෝජනා සම්මතයක් මගින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට සාමාන්‍යයෙන් යෝජනා සම්මතයේ නියමයන් ප්‍රකාර කටයුතු කිරීමට සහ විශේෂයෙන්—

(අ) ඒ දේපළෙහි පලදාව විකිණීමට;

(ආ) යම් ණයක් දෙනු ලැබුවේ යම් පිරියතක් හෝ යන්ත්‍රයක් ඇප වශයෙන් ඇතිව ද ඒ ණය සම්බන්ධයෙන් ගෙවීම් පැහැර හැරීමක් කර තිබේ නම් සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ඒ පිරියත හෝ යන්ත්‍රය මගින් නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ විකිණීමට;

(ඇ) ඒ දේපළින් කුලී, ලාභ හෝ වෙනත් ආදායම් ලැබීමට; .

(ඈ) ඒ දේපළෙහි ආදායමෙන් ඒ දේපළ පාලනයෙහි සහ කළමනාකරණයෙහි ලා දරනු ලබන වියදම් ගෙවීමට;

(ඉ) ස්වකීය සේවය සඳහා පාරිශ්‍රමික වශයෙන් නියම කිරීම සුදුසු යයි මණ්ඩලය සලකන යම් මුදලක් (වේ නම්) ඒ ආදායමෙන් ඒ මුදල තමාට නතු කර ගැනීමට;

(ඊ) එම දේපළට අදළ උකස යටතේ බැංකුවට ලැබිය යුතු සියලු මුදල් සම්පූර්ණ-යෙන්ම ගෙවනතුරු හෝ එම දේපළෙහි සන්තකය අත්හරින ලෙස (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් තමාට විධාන කරනු ලබනතුරු එම දේපළ සන්තකව සිටීමට

හිමිකම තිබිය යුතුය.

(2) යම් දේපලක් සම්බන්ධයෙන් 48 වන වගන්තිය යටතේ මණ්ඩලයෙහි යෝජනා සම්මතයකින් බලය දෙනු ලැබූ සෑම තැනැත්තකුම විසින්—

(ඉ) උකස්කරුගේ නඩත්තුව සඳහා මණ්ඩලය විසින් මණ්ඩලයේ අභිමතය අනුව නියම කරනු ලබන යම් මුදලක් (වේ නම්) ඒ දේපළෙහි ආදායමෙන් මාසපතා උකස්කරු වෙත ගෙවිය යුතුය;

(ඊ) මෙහි මීන් පෙර බලය දෙනු ලැබූ ගෙවීම් කිරීමෙන් පසුව, ඒ දේපළෙහි ආදායමෙන් ඉතිරිව තිබෙන මුදල මණ්ඩලය විසින් විධාන කරනු ලැබිය හැකි තැනැත්තා හෝ තැනැත්තන් වෙත සහ මණ්ඩලය විසින් විධාන කරනු ලැබිය හැකි ආකාරයට තුන් මසකට වරක් හෝ මණ්ඩලය විසින් විධාන කරනු ලැබිය හැකි වෙනත් ආකාරයකට හෝ ගෙවිය යුතුය;

(උ) ඒ දේපළ සම්බන්ධයෙන් තමාට ලැබුණු හෝ තමා විසින් ගෙවනු ලැබූ සියලු මුදල් පිළිබඳ පැහැදිලි සහ නිවැරදි වාර්තා තබා, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමා තුළ එය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය;

(ඌ) මණ්ඩලය විසින් විධාන කරනු ලබන ආකාරයට උකස්කරු හෝ වෙනත් තැනැත්තකු වෙත ඒ දේපළෙහි සන්තකය භාර දී මෙහි මීන් පෙර බලය දෙනු ලැබූ ගෙවීම් කිරීමෙන් පසු ඒ දේපළවල ආදායමෙන් තමා ළඟ ඉතිරිව ඇති යම් මුදලක් මණ්ඩලය වෙත ගෙවිය යුතුය.

(3) උකස යටතේ බැංකුවට ලැබිය යුතු සියලු මුදල් සම්පූර්ණයෙන් ගෙවනු ලැබූවිට මණ්ඩලය විසින්, උකස් කරන ලද දේපළෙහි සන්තකය උකස්කරුට භාරදිය යුතු අතර ඒ දේපළෙහි ආදායමෙන් ඉතිරිව ඇති යම් මුදලක් ඔහුට ආපසු දිය යුතුය.

50. ගෙවීම් පැහැර හැරීම කර ඇත්තේ යම් ණයක් සම්බන්ධයෙන් ද ඒ ණය සඳහා ඇප වශයෙන් බැංකුවට උකස් කරන ලද යම් නිශ්චල හෝ චංචල දේපළක්, ඒ ණය මුදලින් ආපසු නොගෙවා ඇති සම්පූර්ණ කොටස ද විකිණීමේ දිනය තෙක් ඊට ලැබිය යුතු පොලිය ද 57 වන වගන්තිය යටතේ අයකර ගතයුතු මුදල් සහ වියදම් ද සමග අයකර ගැනීම සඳහා, 51 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ලියා වාර්තාගත කළයුතු යෝජනා සම්මතයක් මගින්, ඒ යෝජනා සම්මතයෙහි සඳහන් යම් තැනැත්තකුට මණ්ඩලය විසින් බලය පැවරිය හැකිය. තව ද ඉන් පසුව ණය ගැනුම්කරු විසින් හෝ බැංකුවට උකස් කිරීමේ දිනයෙන් පසු කරන ලද හෝ ලියාපදිංචි කරන ලද කවර වූ හෝ යම් බැහැර කිරීමක් මගින් හෝ එය යටතේ ඒ දේපළට හා ඒ දේපළ සම්බන්ධයෙන් ණය ගැනුම්කරුට ඇති අයිතිවාසිකමට, හිමිකමට සහ සම්බන්ධතාවට හිමිකම් කියන යම් තැනැත්තකු විසින් කවර හේතුවක් නිසාවත් එකී යෝජනා සම්මතය අවලංගු කිරීම සඳහා යම් අධිකරණයක කටයුතු ඇරඹීම කළ නොහැකි විය යුතු අතර කිසිදු අධිකරණයක් විසින් එවැනි යම් ඉල්ලීමක් භාරගනු නොලැබිය යුතුය.

51. (1) ණය ගැනුම්කරු මියගොස් ඇතත්, එසේ නැතහොත් ණය සඳහා ඇප වශයෙන් බැංකුවට උකස් කරන ලද දේපළෙහි කවර වූ හෝ යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ස්වේච්ඡා හිමිකරයකින් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් හෝ වෙනත් යම් තැනැත්තකු වෙත පැවරී ඇතත් 48 වන සහ 50 වන වගන්තිවල විධිවිධාන, (2) වන උපවගන්තියෙහි අන් ආකාරයකින් විධිවිධාන සලස්වා ඇති පරිදි හැර යම් ගෙවීම් පැහැර හැරීමකට අදාළ විය යුතුය.

(2) ණය ගැනුම්කරු මියගොස් ඔහුගේ අන්තිම කැමති පත්‍රයේ ප්‍රොබේට් බලපත්‍රය හෝ ඔහුගේ බුද්ගලයේ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ යම් තැනැත්තකු වෙත නිකුත් කොට නොමැති අවස්ථාවක, කොළඹ දිසා අධිකරණය හෝ ණය ගැනුම්කරු විසින් බැංකුවට උකස් කරන ලද දේපළ පිහිටියේ යම් දිස්ත්‍රික්කයක ද ඒ දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය විසින්, මණ්ඩලය විසින් ඉල්ලුම් කරනු ලැබූවිට, සහ ඉල්ලීම පිළිබඳ දැන්වීම භාරදිය යුතු යයි අධිකරණය විසින් අණකරනු ලැබිය හැකි යම් තැනැත්තන් වෙතහොත් ඔවුන් වෙත ඒ

දැන්වීම භාරදීමෙන් පසු ප්‍රොබේට් බලපත්‍රය දීම හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය නිකුත් කිරීම අනවශ්‍ය ලෙස ප්‍රමාද වීමට ඉඩ ඇතැයි අධිකරණය සෑහීමට පත්වන්නේ නම්, ණය ගැනුම්කරුගේ බූදලය මේ වගන්තියේ කාර්යයන් සඳහා නියෝජනය කිරීමට තැනැත්තකු පත්කරනු ලැබිය හැකිය; ණය ගැනුම්කරුගේ බූදලය නියෝජනය කිරීමට මේ උපවගන්තිය යටතේ තැනැත්තකු පත්කරනු ලැබී නම් මිස ද පත්කරනු ලබන තෙක් ද එම ණය ගැනුම්කරු විසින් කරන ලද යම් ගෙවීම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් 48 වන සහ 50 වන වගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතුය.

52. යම් දේපළක් විකිණීමට බලය දෙමින් 50 වන වගන්තිය යටතේ කරනු ලබන සෑම යෝජනා සම්මතයක්ම පිළිබඳ වූ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි සහ දිනපතා ප්‍රවෘත්ති පත්‍රයක පළකළ යුතු අතර එම දැන්වීමෙහි පිටපත් ණය ගැනුම්කරු ජීවත්ව සිටී නම්, ඔහු වෙත ද ඒ දේපළ සම්බන්ධයෙන් 84 (1) වන වගන්තිය යටතේ තම ලිපිනය ලියාපදිංචි කර තිබෙන සෑම තැනැත්තකු වෙත ද එම දේපළ රජයෙන් දෙනු ලැබූ බද්දක් යටතේ බදු ගැනුම්කරුවකුගේ සම්බන්ධතාවකින් සමන්විත වේ නම් ඉඩම් කොමසාරිස් වෙත ද යැවිය යුතුය.

53. සෑම විකිණීමක්ම සිදුවන දිනය, වේලාව සහ ස්ථානය පිළිබඳ දැන්වීමක්, එම විකිණීම සඳහා නියම කරනු ලැබූ දිනයට දින දහහතරකට නොඅඩු කාලයකට පෙර ගැසට් පත්‍රයෙහි පළකළ යුතු අතර, එම දැන්වීමෙහි පිටපත්—

(අ) ණය ගැණුම්කරු ජීවත්ව සිටිනම් ඔහු වෙත ද යම් යෝජනා සම්මතයක් පිළිබඳ දැන්වීමක් 52 වන වගන්තිය යටතේ යවනු ලැබීමට නියමිත සෑම තැනැත්තකු වෙත ද යැවිය යුතුය;

(ආ) විකිණීමට තිබෙන දේපළෙහි හෝ ඒ අසල ඇලවිය යුතුය; තවද

(ඇ) කච්චේරියේ බිත්තිවල ද, දේපළ පිහිටා ඇත්තේ යම් දිසා අධිකරණවල හා මහෙස්ත්‍රාත් අධිකරණවල බල සීමා තුළ ද ඒ වෙන් වෙන් වූ දිසා අධිකරිණවල හා මහෙස්ත්‍රාත් අධිකරණවල බිත්තිවල ද ඇලවිය යුතුය.

54. (1) ණය මුදලින් ආපසු නොගෙවා ඇති සම්පූර්ණ මුදල් කොටස, 76 වන වගන්තියේ අතුරු විධානය යටතේ අයවිය යුතු යම් දණ්ඩන හෝ වෙනත් පොලියක් ද ඇතුළුව ඊට ගෙවිය යුතු එහි පොලිත් 57 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් අයකර ගත යුතු යම් මුදල් හෝ ගාස්තු වේ නම් ඒවාත් සමග, විකිණීම නියම කරනු ලැබ ඇති දිනයට පෙර යම් අවස්ථාවක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත්, ඒ දේපළ නොවිකිණිය යුතු අතර ඒ දේපළ විකිණීම සඳහා 50 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය ක්‍රියාත්මක කිරීමෙහිලා තවදුරටත් කිසිම පියවරක් නොගත යුතුය.

(2) ගෙවීම පැහැර හරිනු ලැබූවේ යම් කොටස් මුදලක්, සෑමයු ගෙවීමක් හෝ වෙනත් ගෙවීමක් සම්බන්ධයෙන් ද ඒ මුදල, 76 වන වගන්තියේ අතුරු විධානය යටතේ ඊට ගෙවිය යුතු හා අයවිය යුතු යම දණ්ඩන හෝ වෙනත් පොලියක් ද 57 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් අයකර ගතයුතු යම් මුදල් හෝ ගාස්තු වේ නම් ඒවා ද සමග, විකිණීම නියම කරනු ලැබ ඇති දිනයට පෙර යම් අවස්ථාවක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත්, ඒ දේපළ නොවිකිණිය යුතු යයි ද ඒ දේපළ විකිණීම සඳහා 50 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය ක්‍රියාත්මක කිරීමෙහිලා තවදුරටත් කිසිම පියවරක් නොගත යුතු යයි ද ස්වකීය අභිමතය අනුව බැංකුව විසින් විධාන කරනු ලැබිය හැකිය.

55. බැංකුවට හැර වෙනත් යම් තැනැත්තකුට යම් ආරම්භක ලංසුවකට අඩුවෙන් දේපළ නොවිකිණිය යුතු වන්නේ ද එම ආරම්භක ලංසුව මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකිය.

56. (1) එකම දේපළක් ඇපය වශයෙන් ඇතිව බැංකුව විසින් ණය දෙකක් හෝ ඊට වැඩි ගණනක් දෙනු ලැබ ඇත්තා වූ හා එවැනි ණය වලින් යම් ණයක් හෝ ඊට වැඩි ගණනක් සඳහා අයවිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හැර තිබෙන්නා වූ යම් අවස්ථාවක, සෙසු ණය හෝ සෙසු ණය අතුරින් යම් ණයක් සම්බන්ධයෙන් ගෙවීම් පැහැර හැරීමක් කර නොතිබීම ගැන නොසලකා මේ පනතේ ඉහතින් වූ විධිවිධාන අදාළ විය යුතු අතර එවැනි යම් අවස්ථාවක දී මණ්ඩලය විසින් 50 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයකින් අවස්ථාවෝචිත පරිදි එම ණය දෙකම හෝ ඒ ණය සියල්ලම හෝ සම්බන්ධයෙන් බැංකුවට අයවිය යුතු මුළු මුදල අයකර ගැනීම පිණිස එම දේපළ විකිණීමට බලය පැවරිය හැකිය. තව ද මේ පනතේ මේ කොටසේ විධිවිධාන ඒ අනුව අදාළ වන්නේය.

(2) 47 වන වගන්තියේ සිට 62 වන වගන්තිය (වගන්ති දෙකම ඇතුළුව) දක්වා වූ වගන්තිවල අඩංගු කිසිවකින් උකස්කරයක් මත ලැබිය යුතු මුදල මණ්ඩලය විසින් වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට අනුකූලව අයකර ගැනීමෙන් වලක්වනු නොලබන්නේය.

57. යම් ණයක් මත ලැබිය යුතු මුදල හැර, මණ්ඩලය විසින්,—

(අ) ණය දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් අත්සන් කරනු ලැබූ උකස්කරයෙහි අඩංගු ප්‍රතිඥප්තිවලට අනුකූලව, බැංකුවට උකස් කරන ලද දේපළ මත බලාන්විත කරන ලද යම් රක්ෂණ සහතිකයක් සම්බන්ධයෙන් වාරික සහ වෙනත් ගාස්තු ගෙවීමේ සහ ණයකරු විසින් ලියා අත්සන් කරනු ලැබූ එම උකස්කරයෙහි අඩංගු ප්‍රතිඥප්ති යටතේ බැංකුව විසින් දරනු ලැබීමට බලය දෙන ලද සෙසු සියලු වියදම් සහ ගාස්තු ගෙවීමේ දී බැංකුව විසින් වියදම් කරන ලද සියලු මුදල්;

(ආ) උකස් කරන ලද දේපළ වික්ණීම ප්‍රචාරය කිරීමේ සහ එය විකිණීමේ ගාස්තු; සහ

(ඇ) ණය සඳහා ඇප වශයෙන් උකස් කරන ලද දේපළ, රජයෙන් ලද බද්දක් යටතේ ණයකරුගේ සම්බන්ධතාවකින් සමන්විත වන්නා වූ ද එම දේපළ 63 වන වගන්තියේ විධිවිධාන වලට අනුකූලව රජයට භාර දී තිබෙන්නා වූ ද යම් අවස්ථාවක එකී බද්ද යටතේ ණයකරුගෙන් රජයට අයවිය යුතු මුදල වශයෙන් එම භාර දීමේ දී මණ්ඩලය විසින් රජයට ගෙවනු ලබන සියලු මුදල්

ණය කරුගෙන් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකුගෙන් අයකර ගතහැකිය:

එසේ වුව ද (ආ) ඡේදය යටතේ දරන ලද වියදම් මණ්ඩලයේ යෝජනා සම්මත මගින් කලින් කල නියම කරනු ලැබිය හැකි ණය මුදලෙහි ප්‍රතිශතයක් නොඉක්ම විය යුතුය.

58. උකස් කරන ලද දේපළ විකුණන ලද නම් උකස මත අයවිය යුතු මුදල සහ 57 වන වගන්තිය යටතේ අයකර ගතයුතු මුදල් සහ ගාස්තු, ඒ විකිණීමෙන් ලද මුදලින් අඩුකර ගැනීමෙන් පසු යම් මුදලක් ඉතිරි වුවහොත් ඒ මුදල බැංකුව විසින් ණයකරුට හෝ ණය කරුට අයවිය යුතු ගෙවීම් භාර ගැනීමට නීත්‍යානුකූල හිමිකමක් ඇති යම් තැනැත්තකුට හෝ ගෙවිය යුතුය. මුදල ගෙවිය යුත්තේ කවරකුට ද යන්න පිළිබඳව මණ්ඩලයට සැකයක් තිබෙන අවස්ථාවක උකස් කරන ලද දේපළ පිහිටි දිස්ත්‍රික්කයෙහි දිසා අධිකරණයට ඒ මුදල ගෙවිය යුතුය.

59. (1) උකස් කරන ලද දේපළ විකුණන ලද නම් මණ්ඩලය විසින් විකිණීමේ සහතිකයක් අත්සන් කළයුතු අතර, එවිට ඒ දේපළට හා ඒ දේපළ සම්බන්ධයෙන් ණයකරුට ඇති අයිතිවාසිකම, හිමිකම සහ සම්බන්ධතාව යන සියල්ල ඒ දේපළෙහි ගැනුම්කරු සතුවිය යුතුය; තව ද ඉන් පසුව එම දේපළ බැංකුවට උකස් කිරීමේ දිනයෙන් පසු කරන ලද හෝ

ලියාපදිංචි කරන ලද කවර වූ හෝ යම් බැහැර කිරීමක් මගින් හෝ යටතේ එම දේපළට හෝ ඒ දේපළ සම්බන්ධයෙන් ණයකරුට ඇති අයිතිවාසිකමට, හිමිකමට හෝ සම්බන්ධතාවට හිමිකම් කියන යම් තැනැත්තකු විසින් කවර හේතුවක් නිසාවත් එකී විකිණීම අවලංගු කිරීම සඳහා හෝ එම දේපළට හෝ ඒ දේපළ සම්බන්ධයෙන් යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ගැනුම්කරුට විරුද්ධව පවත්වාගෙන යෑම සඳහා යම් අධිකරණයකින් ඉල්ලා සිටිය නොහැකි විය යුතුය.

(2) යම් දේපළක් විකිණීම සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් අත්සන් කරන ලද සහතිකයක් ඒ දේපළ විකිණීම සම්බන්ධයෙන් මේ පනතේ සියලු විධිවිධාන අනුව ක්‍රියාකර ඇති බවට තීරණාත්මක සාක්ෂිය වන්නේය.

(3) ගැනුම්කරු බැංකුව නොව වෙනත් තැනැත්තකු නම් සහතිකය නියමිත ආකෘතියට සාරානුකූල විය යුතු අතර, ගැනුම්කරු බැංකුව නම් සහතිකය නියම කරනු ලැබිය හැකි වෙනත් ආකෘතියක විය යුතුය.

(4) සෑම විකිණීමේ සහතියක්ම එය නිශ්චල දේපළක පැවරීමක් වූවාක් මෙන් මුද්දර ගාස්තුවලට සහ අයකිරීම්වලට ද, නීතියෙන් බලය දී ඇති යම් ලියාපදිංචි කිරීමේ හෝ වෙනත් අයකිරීම් වලට ද යටත් වියයුතු අතර ඒ සියල්ල ගැනුම්කරු විසින් ගෙවිය යුතුය.

(5) විකුණනු ලබන දේපල රජයෙන් ලැබුණු බද්දක් යටතේ බදුකරුවකුගේ සම්බන්ධතාවකින් සමන්විත වන අවස්ථාවක එම දේපළෙහි ගැනුම්කරු බැංකුව නොව වෙනත් තැනැත්තෙක් වන්නේ නම් ඉඩම් කොමසාරිස් සිය අභිමතය පාවිච්චි කරමින් ගැනුම්කරු අනුමත කර තිබෙනම් මිස මණ්ඩලය විසින් විකිණීමේ සහතිකය අත්සන් නොකළ යුතුය.

(6) රජයෙන් ලැබුණු බද්දක් යටතේ වූ බදුකරුවකුගේ සම්බන්ධතාවක් මිළට ගත් යම් ගැනුම්කරුවකු අනුමත කිරීම ඉඩම් කොමසාරිස් විසින් (5) වන උපවගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරනු ලබන කවර අවස්ථාවක වුවද—

(අ) විකිණීම සම්බන්ධයෙන් ගැනුම්කරු විසින් බැංකුවට ගෙවන ලද සියලු මුදල් මණ්ඩලය විසින් ඔහුට ආපසු ගෙවිය යුතුය;

(ආ) එම විකිණීම ප්‍රචාරය කිරීමේ සහ පැවැත්වීමේ වියදම් 57 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් අයකර ගත යුතු වියදම් ලෙස සැලකිය යුතුය; තව ද

(ඇ) එම දේපළ මේ පනතේ විධිවිධානවලට අනුකූලව නැවත විකිණිය යුතුය.

**60.** (1) මේ පනතේ ඉහතින් වූ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා විකුණනු ලැබූ යම් නිශ්චල දේපළක ගැනුම්කරුට කොළඹ දිසා අධිකරණය වෙත හෝ ඒ දේපළ පිහිටා තිබෙන ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉල්ලීමක් කළවිට සහ ඒ දේපළ සම්බන්ධයෙන් 59 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද විකිණීම් සහතිකය ඉදිරිපත් කළවිට ඒ දේපළෙහි සන්තකය භාර ගැනීම සඳහා ආඥවක් ලබා ගැනීමට හිමිකම තිබිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් ද ඒ ඉල්ලීම අසා නිම කිරීම ද සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ලඝු කාර්ය පටිපාටිය අනුව කළ යුතුය; තව ද ඒ එක් එක් ඉල්ලීමෙහි සහ ඒ සම්බන්ධයෙන් පැවැත්වෙන සියලු නඩු කටයුතුවල කාර්යයන් සඳහා ඉදිරිපත් කෙරෙන සියලු ලියකියවිලි වෙනුවෙන්, එම ඉල්ලීම අදාළ වන්නේ යම් දේපලකට ද එහි වටිනාකමට සමාන වටිනාකමක් තිබෙන යම් නිශ්චල දේපළක සන්තකය භාර ගැනීම පිණිස දිසා අධිකරණයක තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ඉල්ලීමක් හෝ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ හෝ ආනුෂංගික නඩු කටයුත්තක් වෙනුවෙන් තත්කාලයෙහි වලංගුව පවත්නා යම් ලිඛිත නීතියක් යටතේ පිළිවෙළින් ගෙවිය යුතු ප්‍රමාණයන් අනුව මුද්දර ගාස්තු සහ වෙනත් අයකිරීම, ගෙවිය යුතුය.

(3) මේ පනතේ ඉහතින් වූ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා විකුණනු ලැබූ යම් නිශ්චල දේපළක් ණයකරු හෝ ඔහු වෙනුවෙන් යම් තැනැත්තකු හෝ එම දේපළ බැංකුවට උකස් කිරීමෙන් පසුව ණයකරු විසින් ඇති කරන ලද හිමිකමක් යටතේ හිමිකම් පාන තැනැත්තකු හෝ පදිංචියට ගෙන තිබෙන අවස්ථාවක, දිසා අධිකරණය විසින්, ගැණුම්කරු හෝ ඔහු විසින් තමා වෙනුවෙන් සන්තකය භාර ගැනීමට පත්කරනු ලබන යම් තැනැත්තකු දේපළෙහි සන්තකයට පත් කරමින් භාරදීම කළයුතු යයි ආඥවක් කළයුතුය.

(4) මේ පනතේ ඉහතින් වූ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා විකුණනු ලැබූ යම් නිශ්චල දේපළක් කුලී නිවැසියකු හෝ එහි පදිංචි වීමට හිමිකම් තිබෙන වෙනත් තැනැත්තකු පදිංචියට ගෙන තිබෙන අවස්ථාවක, විකිණීම සිදුකර ඇති බවට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වූ දැන්වීමක් දේපළෙහි ප්‍රකටව පෙනෙන ස්ථානයක ඇලවීමෙන් සහ ණයකරුගේ සම්බන්ධතාවය ගැනුම්කරු වෙත පවරා ඇති බවට පහසු ස්ථානයක දී ව්‍යවහාරික ක්‍රමයෙන් හෝ අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි වෙනත් ක්‍රමයකින් පදිංචි කරුට ප්‍රකාශ කිරීමෙන්, භාරදීම කළයුතු බවට දිසා අධිකරණය විසින් අණ කළ යුතුය. එවැනි ප්‍රකාශයක වියදම අධිකරණය විසින් නියම කරනු ලැබිය යුතු අතර, සෑම අවස්ථාවකදීම ගැනුම්කරු විසින් එය කලින් ගෙවනු ලැබිය යුතුය.

(5) (3) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය හෝ යටතේ වූ සෑම ආඥවක්ම අවස්ථාවෝචිත පරිදි සිවිල් නඩු විධාන සංග්‍රහයේ 287 වන වගන්තිය හෝ 288 වන වගන්තිය යටතේ කරන ලද සන්තකය භාරදීම සඳහා වූ ආඥවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එසේ කරන ලද ආඥවක් ලෙස, ඒ නඩු විධාන සංග්‍රහයේ යම් විධිවිධානයක් අදාළ කිරීමේ කාර්යය සඳහා, ණයකරු සහ ගැනුම්කරු පිළිවෙලින් විනිශ්චිත ණයකරු සහ විනිශ්චිත ණය හිමි ලෙස සලකමින් එය ඒ ආකාරයට ක්‍රියාත්මක කළ හැකිය.

61. විකුණනු ලැබූ දේපළ බැංකුව වෙනුවෙන් මිලයට ගෙන ඇති අවස්ථාවක, ඒ දේපළ විකුණනු ලැබුවේ ණය මුදල සම්බන්ධයෙන් අයවිය යුතු යම් මුදලක් සඳහා ද (තහනම් කිරීමේ සහ විකිණීමේ වියදම් ඇතුළුව) ඒ මුදල ද සමස්ත මුදල මත වර්ෂයකට නියමිත පොලී ප්‍රමාණය නොඉක්මවන පොලිය ද ණයකරු විසින් හෝ ඔහු වෙනුවෙන් යම් තැනැත්තකු විසින් ගෙවනු ලැබූ විට, එම දේපළ විකිණීම අවලංගු කළ බවට විකිණීමේ සහතිකයේ සහතික පිටපතක පිටසනක් කිරීමෙන්, මණ්ඩලය එම දේපළ නැවත විකිණීමට පෙර යම් අවස්ථාවක දී, ඒ දේපළ විකිණීම මණ්ඩලය විසින් අවලංගු කළ හැකිය. එවැනි පිටසන් කිරීමක් ඉඩම් රෙජිස්ට්‍රාර්ගේ කාර්යාලයෙහි ලියාපදිංචි කළවිට මේ පනත යටතේ වූ විකිණීම කෙදිනකවත් නොකරන ලද මෙන් එම දේපළ නැවත ණයකරු සතු වන්නේය.

62. එසේ විකුණන ලද දේපළ බැංකුව වෙනුවෙන් මිලයට ගනු ලැබ ඒ විකිණීම 61 වන වගන්තිය යටතේ අවලංගු කර නොමැති නම්, මණ්ඩලය විසින් ඕනෑම අවස්ථාවක දී ඒ දේපළ නැවත විකුණා 59 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි සඳහන් සහතිකයේ සහතික පිටපතක පිටසන් කිරීමෙන් මුල් විකිණීමේ දී ගැනුම්කරු විසින් අත්කර ගනු ලැබිය හැකිව තිබූ සියලු අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ගැනුම්කරු වෙත පැවරිය හැකිය. මුල් විකිණීමෙහි දී ගැනුම්කරුවකුට දෙන සහතිකයට අවශ්‍ය ප්‍රමාණයේම මුද්දර ගාස්තුවලට සහ අයකිරීම්වලට ඒ පිටසන යටත් විය යුතුය. තව ද එය ඉඩම් රෙජිස්ට්‍රාර්ගේ කාර්යාලයෙහි ලියාපදිංචි කළවිට එම අයිතිවාසිකම්, හිමිකම සහ සම්බන්ධතාව පෙරකී පරිදි ගැනුම්කරු සතුවිය යුතුය.

63. මේ පනතේ ඉහතින් වූ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා කෙරෙන යම් විකිණීමක දී ණයක් ආපසු ගෙවීම පැහැර හැරීම නිසා විකුණන ලද දේපලක් බැංකුව විසින් මිලට ගෙන ඇත්නම් ණය, පොලිය, වියදම් සහ ගාස්තු සම්බන්ධයෙන් බැංකුවට අයවිය යුතු මුළු මුදල පියවෙන මුදලකට එම දේපළ නැවත විකිණීමට බැංකුවට හැකිවීම පිණිස අවශ්‍ය කාලයට වැඩි කාලයක් බැංකුව විසින් එම දේපළ තබා නොගත යුතුය:

එසේ වුව ද එම දේපළ රජයෙන් ලැබුණු බද්දක් යටතේ වූ බදු කරුවකුගේ සම්බන්ධතාවකින් සමන්විත වන අවස්ථාවක, එම දේපළ නැවත විකිණීම වෙනුවට, මණ්ඩලය ද අමාත්‍යවරයා ද රජයේ ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා ද අතර එකඟවන නියම හා කොන්දේසි මත මණ්ඩලය විසින් එම බද්ද රජයට පවරණය කළ හැකිය.

64. මේ කොටසෙහි, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, රජයෙන් ලැබුණ බද්දක් යටතේ වූ බදුකරුවකුගේ සම්බන්ධතාවක් උකස් කිරීමකින් ණයක් ආරක්ෂා කෙරෙන යම් අවස්ථාවක "දේපළ" යන්නෙන්, බද්ද යටතේ බදුකරුගේ අයිතිවාසිකම, හිමිකම හා සම්බන්ධතාව අදහස් වේ.

## VI වන කොටස

### ගිණුම් හා විගණනය

65. (1) බැංකුවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය වන්නේය.

(2) බැංකුවේ මූල්‍ය පාලනයට හා ගිණුම්වලට 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටස අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

## VII වන කොටස

### පොදු විධිවිධාන

66. (1) බැංකුවේ පොදු මුද්‍රාව සාමාන්‍යාධිකාරිවරයා භාරයේ තිබිය යුතුය. සාමාන්‍යාධිකාරිවරයා හා අධ්‍යක්ෂවරයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛණයකට පොදු මුද්‍රාව නොතැබිය යුතු අතර තමන් සිටි බවට සාක්ෂි වශයෙන් ඔවුන් සියලු දෙනාම ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන් තැබිය යුතුය.

(2) බැංකුවේ පොදු මුද්‍රාව බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකිය.

67. (81 වන අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ, 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ සහ (80 වන අධිකාරය වූ) මුදල් ණයට දීමේ ආඥාපනතේ විධිවිධාන බැංකුවට සහ බැංකුව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු අතර, ඒ අනුව, මේ පනතේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව ඒ විධිවිධාන කියවා තේරුම් ගත යුතුය.

68. බැංකුව, මුදල් නීති පනතේ අර්ථානුකූලව ද ඒ පනතේ කාර්යයන් සඳහා ද බැංකු ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව කියවා තේරුම් ගත යුතුය.

69. අධ්‍යක්ෂවරයන් දෙදෙනකු විසින් හෝ කුවිතාන්සි දීමට මණ්ඩලය විසින් ප්‍රකාශිතවම බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ අත්සන් කරනු ලැබූ කුවිතාන්සි බැංකුවට ගෙවනු ලැබූ මුදල් පිළිබඳ බල ඇති නිදහස් කිරීමක් වන්නේය.

70. (1) බැංකුව වෙනුවෙන් පහත සඳහන් ආකාරයට ගිවිසුම් ඇති කරගනු ලැබිය හැකිය:-

(අ) පෞද්ගලික තැනැත්තන් අතර ඇති කරගනු ලබන්නේ නම්, ලියවිල්ලකින් විය යුතුයයි නීතියෙන් නියම කරනු ලැබ ඇති ගිවිසුමක් බැංකුව වෙනුවෙන් බැංකුවේ පොදු මුද්‍රාව යටතේ වූ ලියවිල්ලකින් ඇති කරගනු ලැබිය හැකිය;

(ආ) පෞද්ගලික තැනැත්තන් අතර ඇති කරගනු ලබන්නේ නම් ගිවිසුමෙන් බැඳෙන පාර්ශ්වකරුවන් විසින් අත්සන් කරනු ලැබූ ලියවිල්ලකින් විය යුතුයයි නීතියෙන් නියම කරනු ලැබ ඇති ගිවිසුමක්, බැංකුව වෙනුවෙන් වූ විට, එය ඇතිකර ගැනීමට මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් යථා පරිදි බලය දෙනු ලැබූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් අත්සන් කරනු ලැබූ ලියවිල්ලකින් ඇතිකරගනු ලැබිය හැකිය; තව ද,

(ඇ) වාචිකව වුව ද පෞද්ගලික තැනැත්තන් අතර ඇති කරගනු ලබන්නේ නම් නීතියෙන් වලංගු වන ගිවිසුමක් එය ඇතිකර ගැනීමට මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් යථා පරිදි බලය දෙනු ලැබූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් බැංකුව වෙනුවෙන් ඇතිකර ගනු ලැබිය හැකිය.

(2) මේ වගන්තිය අනුව ඇතිකර ගනු ලැබූ ගිවිසුමක් නීතිය අනුව වලංගු විය යුතු අතර, බැංකුව සහ ඒ ගිවිසුමේ වෙනත් සියලුම පාර්ශ්වකරුවන් හා ඔවුන්ගේ නීත්‍යානුකූල නියෝජිතයන් එයින් බැඳී සිටිය යුතුය.

(3) මේ වගන්තිය අනුව ඇතිකර ගනු ලැබූ ගිවිසුමක් වෙනස් කිරීම හෝ එයින් නිදහස්වීම, එය ඇතිකර ගනු ලැබීමට මේ වගන්තියෙන් බලය දෙනු ලැබ ඇති ආකාරයෙන්ම කළ හැකිය.

71. මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි තත් කාර්යය සඳහා යථා පරිදි බලය දෙනු ලැබූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් විනිමය බිල් පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක් හෝ බැංකුවේ නමින් හෝ බැංකුව විසින් හෝ බැංකුව වෙනුවෙන් හෝ බැංකුව උදෙසා හෝ සාදනු ලැබුයේ නම්, ලියා අත්සන් කරනු ලැබුයේ නම් හෝ පිටසන් කරනු ලැබුයේ නම්, එම විනිමය බිල් පත්‍රය හෝ පොරොන්දු නෝට්ටුව බැංකුව වෙනුවෙන් සාදනු ලැබූවක්, ලියා අත්සන් කරනු ලැබූවක් හෝ පිටසන් කරනු ලැබූවක් ලෙස සලකනු ලැබිය යුතුය.

72. මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා ප්‍රකාශිතවම බලය දෙනු ලැබ තමන් වෙත එසේ දෙනු ලැබූ අධිකාරයේ සීමා ඇතුළත ක්‍රියා කරන තැනැත්තන් හැර වෙනත් කිසිම තැනැත්තකුට බැංකුවේ නමින් හෝ බැංකුව වෙනුවෙන් හෝ යම් පොරොන්දු නෝට්ටුවක්, විනිමය බිල් පත්‍රයක්, චැක් පතක් හෝ මුදල් ගෙවීම සඳහා වූ නියමයක් සෑදීමට, ලිවීමට, පිළිගැනීමට හෝ පිටසන් කිරීමට, හෝ බැංකුවට යම් වගකීමක් පැවරෙන පරිදි යම් ගිවිසුමකට එළඹීමට හෝ වෙනත් ආකාරයකින් බැංකුව ණය බැඳීමකට යටත් කිරීමට හෝ කිසිම බලයක් නොතිබිය යුතුය.

73. (1) ශ්‍රී ලංකා ජනරජයෙන් පිටත යම් ස්ථානයක දී පොදුවේ හෝ යම් නිශ්චිත කරුණක් සම්බන්ධයෙන් බැංකුව වෙනුවෙන් ඔප්පු ලියා අත්සන් කිරීමට මණ්ඩලයේ පොදු මුද්‍රාව යටතේ වූ ලියවිල්ලකින් යම් තැනැත්තකුට මණ්ඩලයේ ඇටෝර්නි බලකරු ලෙස මණ්ඩලය විසින් බලය පවරනු ලැබිය හැකිය.

(2) එවැනි ඇටෝර්නි බලකරුවකු විසින් බැංකුව වෙනුවෙන් හා ඔහුගේ අත්සන හෝ මුද්‍රාව යටතේ අත්සන් කරනු ලැබූ ඔප්පුවකින් බැංකුව බැඳෙන අතර, බැංකුවේ පොදු මුද්‍රාව යටතේ වූවාක් මෙන්ම එය බලපැවැත්විය යුතුය.

74. (1) පහත සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් සඳහා හෝ පිළිබඳව මණ්ඩලය විසින් රීති සෑදිය හැකිය —

(අ) නියම කළ යුතුයයි මේ පනතින් ප්‍රකාශිත හෝ නියමිත හෝ රීති සෑදීමට මේ පනතින් බලය දී ඇති සියලු කරුණු;

(ආ) බැංකුවේ සේවා නියුක්තයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ගේ පාරිශ්‍රමික, විනය පාලනය සහ පැවැත්ම සහ ඔවුන්ට නිවාඩු දීම, සහන සැලසීම සහ ඊට සම්බන්ධ වෙනත් කරුණු;

(ඇ) බැංකුවේ සේවා නියුක්තයන්ට හෝ බැංකුව වෙනුවෙන් සේවයන් ඉටු කරන වෙනත් තැනත්තන්ට බැංකුවේ මුදල්වලින් (ගමන් ගාස්තු, යැපීම් දීමනා ඇතුළුව) පාරිශ්‍රමික ගෙවීම;

(ඈ) ණය පත්‍ර නිකුත් කිරීම, ලියාපදිංචි කිරීම, පැවරීම, නිදහස් කිරීම හා අවලංගු කිරීම සහ ඒ නිකුත් කිරීමට, ලියාපදිංචි කිරීමට, පැවරීමට, නිදහස් කිරීමට සහ අවලංගු කිරීමට ආනුෂංගික හා අනුයායි සියලු කරුණු;

(ඉ) මේ පනතේ යම් යම් කාර්යයන් සඳහා භාවිත කළ යුතු ආකෘති පත්‍ර;

(ඊ) චංචල හා නිශ්චල දේපළ උකසක් මත බැංකුව විසින් දෙනු ලබන ණයවල උපරිම සීමාව;

(උ) ඒ ණය දෙනු ලැබිය හැකි හෝ ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි අවස්ථා;

(ඌ) ඒ ණයවල ප්‍රමාණය, ඒ ණයවල පොලිය ගෙවිය යුතු ආකාරය හා මුල් මුදල ආපසු ගෙවිය යුතු ආකාරය;

(එ) ණය වෙනුවෙන් අය කළ යුතු පොලියේ අවම ප්‍රමාණය;

(ඒ) දණ්ඩන පොලියේ ප්‍රමාණයන් එය අයකරගනු ලැබිය යුතු අවස්ථා සහ ඊට සම්බන්ධ වෙනත් කරුණු;

(ඔ) බැංකුවේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් මෙහි මින් පෙර සඳහන් කරනු නොලැබූ වෙනත් සියලු කරුණු;

(ඕ) බැංකුව පිහිටුවීම හා ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ කෘෂිකාර්මික සහ කාර්මික ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර බැංකුවට පැවරීම හා සම්බන්ධ සියලු කරුණු;

(ක) ඉහත කී කරුණුවලට සම්බන්ධ හො ආනුෂංගික සියලු කරුණු.

(2) මණ්ඩලය විසින් සාදන ලද කිසිම රීතියක්, ඒ රීතිය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබනතුරු බල සහිත නොවිය යුතුය.

75. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන බලාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, නියෝගයෙහි සඳහන් කරනු ලබන දිනයක හෝ එසේ දිනයක් සඳහන් කර නොමැති නම් එසේ පළ කරනු ලැබූ දිනයෙහි එය ක්‍රියාත්මක වන්නේය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක ම එය පළකරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් ඒ නියෝගය අනුමත කරන ලෙස ඉල්ලන යෝජනාවක් මගින් ජාතික රාජ්‍ය සභාවට ඉදිරිපත් කළ යුතුය.

(4) අනුමත කිරීම ජාතික රාජ්‍ය සභාව විසින් ප්‍රතික්ෂේප කරන යම් නියෝගයක් පරිච්චින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරනු ලැබූ යම් දෙයක වලංගු භාවයට ඉන් හානියක් නොවිය යුතුය. නියෝගය පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු දිනය ජාතික රාජ්‍ය සභාව විසින් නියෝගය අනුමත කිරීම ප්‍රතක්ෂේප කළ දිනය වන්නේය.

(5) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

76. බැංකුවෙන් දෙනු ලබන ණයයක් ආරක්ෂා කිරීම සඳහා වූ යම් සාධන පත්‍රය, අයවිය යුතුවන දිනයේ දී ඒ වනවිට ඒ ණය සම්බන්ධයෙන් අයවිය යුතු අවස්ථාවෝචිත පරිදි වූ වාර මුදල හා පොලිය ගෙවීම නැතහොත් සැමයු හෝ වෙනත් ගෙවීමක් කිරීම ණයකරු විසින් පැහැර හරිනු ලැබුවහොත් හෝ නොසලකා හරිනු ලැබුවහොත්, ණය මුදල දෙන ලද්දේ යම් පොලී ප්‍රමාණයක් මත ද ඒ ප්‍රමාණයට වැඩිවූ ද, 74 වන වගන්තිය යටතේ වූ රීතිවලින් නියම කරනු ලබන්නාවූද පොලී ප්‍රමාණයක් ඒ ණය වෙනුවෙන් ගෙවිය යුතු බවට විධිවිධාන සලස්වනු ලැබිය හැකිය:

එසේ වුව ද, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල සඳහන් නියමිත ප්‍රමාණය අනුව පොලිය ගෙවීම මණ්ඩලය විසින් ස්වකීය පරම අභිමතය අනුව අත්හරිනු ලැබිය හැකි අතර ගෙවීම පැහැර හැර ඇති වාර මුදල මත ඒ වාර මුදල අය වීමට ඇති දිනයෙන් ආරම්භ වී වාර මුදල ගෙවනු ලැබූ දිනයෙන් අවසන් වන කාලය සඳහා, එකඟ වූ පොලී ප්‍රමාණය මෙන් දෙගුණයක පොලී ප්‍රමාණයක් ගෙවිය යුතු යයි මණ්ඩලය විසින් නිශ්චය කළ හැකිය.

77. චංචල හෝ නිශ්චල දේපළක ඇපයක් මත බැංකුව ණයක් දෙන්නා වූ සහ උකස්කරු විසින් එකී දේපළට බලපාන යම් විකිණීමේ සාධන පත්‍රයක් හෝ වෙන යම් බැහැර කිරීමක් ලියා අත්සන් කරනු ලබන්නා වූ ඕනෑම විටක දී, දෙනු ලැබූ ණය ආපසු ඉල්ලීමට හෝ දනට පවත්නා පොලී ප්‍රමාණය අලුත් අයිතිකරුගෙන් අයකර ගැනීමට හෝ බැංකුවට බලය තිබිය යුතු අතර මේ කාර්යය සඳහා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් ගිවිසුමකට එළඹෙන ලෙස අලුත් අයිතිකරුට බැංකුව විසින් නියම කළ හැකිය.

78. ණයක් සඳහා ඇපය වශයෙන් ඉදිරිපත් කරන ලද යම් නිශ්චල දේපළක් පිළිගත යුතු ද නැත්ද යන්න නිශ්චය කිරීම සඳහා යම් ප්‍රාදේශීය අර්ඝණ අධිකාරියක අගැයුම් ලේඛනය ගාස්තුවක් හෝ අය කිරීමක් නොමැතිව පරීක්ෂා කිරීමට බැංකුවට ඉඩ ලැබිය යුතු අතර, එකී සෑම අධිකාරියක නිලධරයන් විසින්, වරිපනම් අය කිරීමට එකී අධිකාරියට බලය ඇති වරිපනම් අයකළ හැකි යම් දේපළක් පිළිබඳ යම් අගැයීමක සම්පූර්ණ විස්තර ඒ සඳහා ඉල්ලීමක් කරනු ලැබූවිට බැංකුවට ඉදිරිපත් කළ යුතුය.

79. නියෝජිතයකු, අගැයුම්කරුවකු හා පරීක්ෂකයකු ඇතුළු බැංකුවේ සෑම අධ්‍යක්ෂ-වරයකු හා සෑම සේවා නියුක්තයකු ඒ ඒ ධුරයෙහි කටයුතු කරන කල්හි දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රාජ්‍ය නිලධරයන් වශයෙන් සලකනු ලබිය යුතුය.

80. මුදල් නීති පනතේ 58 වන සහ 59 වන වගන්තිවල—

(අ) "මුදල් නෝට්ටු" යන වචන වෙනුවට "ඝෘණ පත්‍රය" යන වචන; සහ

(ආ) "මහ බැංකුවේ අධිපති" යන වචන වෙනුවට "අධ්‍යක්ෂවරයන්" යන වචනය

ආදේශ කරනු ලැබුවාක් මෙන්, බැංකුව විසින් නිකුත් කරනු ලබන ඝෘණ පත්‍රවලට මුදල් නීති පනතේ 58 වන සහ 59 වන වගන්ති අදාළ වන්නේය.

81. (1) මේ පනතින් බලය දෙනු ලැබූ යම් පරීක්ෂණයක දී, දිවුරුම් පිට, අසත්‍ය හා අසත්‍ය යයි තමා දන්නා හෝ විශ්වාස කරන හෝ සත්‍ය යයි තමා විශ්වාස නොකරන ප්‍රකාශයක් කරන කවර කෙනකු වුවද අධිකරණ කටයුත්තක යම් අවස්ථාවක දී ඕනෑකමින්ම අසත්‍ය සාක්ෂි දුන් ලෙස සලකනු ලැබිය යුතු අතර, දණ්ඩ නීති සංග්‍රහයට අනුකූලව ඒ පිළිබඳව දඬුවම් කරනු ලැබිය යුතුය.

(2) මේ පනතින් හෝ ඒ යටතේ වූ රීතිවලින් නියම කරනු ලැබූ ප්‍රකාශයක් යම් විශේෂ කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය බව දන දනම කරන කවර කෙනකු වුවද අසත්‍ය සාක්ෂි දීම පිළිබඳව වරද කරුවකු විය යුතු අතර, ඒ සඳහා දණ්ඩ නීති සංග්‍රහයට අනුකූලව දඬුවම් කරනු ලැබිය යුතුය.

82. (1) (අ) තමාගේ ණයකරුවකු වූ හෝ තමාගේ ණය හිමියකු වූ හෝ තමා සමග හවුල් ව්‍යාපාරයක් කරන්නකු වූ හෝ තමාගේ සේවයේ නියුක්ත වූවකු වූ හෝ තැනැත්තකුට; හෝ

(ආ) තමාට මූල්‍ය සම්බන්ධතාවක් ඇති යම් දේපළක ඇපයක් පිට;

ණයක් දීම සඳහා වූ යම් යෝජනා සම්මතයක් පිළිබඳ සාකච්ඡාවට සහභාගි වන හෝ ඊට ඡන්දය දෙන අධ්‍යක්ෂවරයකු වරදකරු කරනු ලැබූවිට, රුපියල් පන්දහසක නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය ගෙවීම පැහැර හැරීමේ දී මාස තුනක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ යටත් විය යුතුය.

(2) (අ) (1) වන උපවගන්තියේ සඳහන් සම්බන්ධතා අතුරින් යම් සම්බන්ධතාවක් තමාට ඇති තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද; නැතහොත්

(ආ) ඇපය සම්බන්ධයෙන් තමාට මූල්‍ය සම්බන්ධතාවක් ඇති

ණය ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් අගැයුම්කරුවකු වශයෙන් ක්‍රියා කරන යම් තැනැත්තකු රුපියල් පන්සියයක දඩයකට යටත් විය යුතුය.

83. (1) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ රීතියක යම් විධිවිධානයක් කඩකරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ එය යටතේ සාදනු ලැබූ රීති කඩකරන හෝ ඒ අනුව ක්‍රියාකිරීම පැහැර හරින හෝ යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූවිට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

(2) මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක,—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම හා සෑම නිලධරයකුම; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකුම

ඒම වරදට වරදකරු ලෙස සැලකිය යුතුය:

එසේ වුව ද තමාගේ දැනුම නොමැතිව ඒ වරද කර තිබෙන බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ ඒ ව්‍යාපාරික ආයතනයේ හවුල්කරුවකු හෝ ඔප්පු කරතහොත් ඒ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා හෝ හවුල්කරු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතුය.

84. (1) ණය පත්‍රයක් දරන සෑම තැනැත්තකුම; සහ

(අ) බැංකුව විසින් ණයක් දෙනු ලබන; හෝ

(ආ) බැංකුවෙන් ණයක් දෙනු ලැබූ තැනැත්තකුගේ අන්තිම කැමති පත්‍රයේ ප්‍රොබේට් බලපත්‍රය හෝ බුදලයේ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ලබාගත් හෝ මියගිය ණයකරුවකුගේ බුදලය නියෝජනය කිරීමට 51 (2) වන වගන්තියේ විධිවිධාන යටතේ පත්කරනු ලැබූ; හෝ

(ඇ) ස්වෙච්ඡා හිමිකරයකින් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන්, හෝ යම් ණයක් සඳහා ඇපයක් වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ යම් දේපළක හෝ එවැනි යම් දේපළක යම් කොටසක හෝ කවර වූ හෝ යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ලැබී ඇත්තා වූ

සෑම තැනැත්තකු තමා වෙත එවිය යුතු සියලුම දැන්වීම් එවීම සඳහා වූ ලිපිනයක් බැංකුවේ ලියාපදිංචි කළ යුතුය.

(2) යම් ණය පත්‍රයක් දරන්නකු හෝ වෙනත් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ ස්වකීය ලිපිනය ලියාපදිංචි කිරීමට අපොහොසත් වන අවස්ථාවක එකී ණය පත්‍ර දරන්නා හෝ තැනැත්තා වෙත මේ පනත යටතේ භාරදීමට නියමිත යම් දැන්වීමක් භාරදීම සම්බන්ධයෙන් ඇති සියලු වගකීම්වලින් බැංකුව නිදහස් වන්නේය:

එසේ වුව ද, එකී යම් අපොහොසත් වීමක් ණය පත්‍ර දරන්නකු වන යම් තැනැත්තකු සම්බන්ධයෙන් හෝ බැංකුව විසින් ණයක් දෙනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් හෝ සිදු වූ විට, ඔහුට ආමන්ත්‍රිත දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ දිනපතා ප්‍රවෘත්ති පත්‍රයක බැංකුව විසින් පළකළ යුතු අතර, ඒ දැන්වීම පළකරනු ලැබූ දිනයේ එකී දැන්වීම ඒ ණය පත්‍රය දරන්නාට හෝ තැනැත්තාට යථා පරිදි දෙනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(3) මේ වගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් ලියාපදිංචි කරනු ලැබූ ලිපිනයට ලියාපදිංචි කළ ලිපියක් මගින් තැපැලෙන් දැන්වීමක් යවන ලද්දේ නම්, මේ පනතේ කාර්යයන් සඳහා ඒ තැනැත්තා වෙත ඒ දැන්වීම යථා පරිදි භාර දෙනු ලැබූ ලෙස සැලකිය යුතු අතර, ලිපිය සාමාන්‍යයෙන් තැපැල් මගින් භාරදෙනු ලබන වේලාවේ දී ඒ භාරදීම ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතුය.

85. (1) ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියෝගයක් මගින් අමාත්‍යවරයා විසින් මේ පනතේ කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි, බැංකුවේ ව්‍යාපාර ආරම්භ කළ දිනයට පසු යම් දිනයක සිට බලපාන පරිදි, ලංකා රජයේ උකස් බැංකු ආඥාපනත හා කෘෂිකාර්මික සහ කාර්මික ණය සංස්ථා ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) (1) වන උපවගන්තියෙහි දැක්වෙන ආඥාපනත් ඉවත් කරනු ලැබූ දිනයේ සිට—

(අ) ඒ දිනයට ඉහතින් වූ දිනයේ දී පැවති ලංකා රජයේ උකස් බැංකුවේ හා කෘෂිකාර්මික සහ කාර්මික ණය සංස්ථාවේ අයිතිවාසිකම්, බැඳීම්, වත්කම් සහ බැරකම් බැංකුවේ අයිතිවාසිකම්, බැඳීම්, වත්කම් සහ බැරකම් වන්නේය.

(ආ) ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නමින් හෝ කෘෂිකාර්මික සහ කාර්මික ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය නමින් කරනු ලැබූ සෑම ආයෝජනයක් මේ පනත යටතේ බැංකුව විසින් කරනු ලැබූ ආයෝජනයක් ලෙස සලකනු ලැබිය යුතුය.

(ඇ) 1968 අංක 33 දරන පනතින් සංශෝධිත ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ Vඅ වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ ලංකා රජයේ උකස් බැංකුව වෙත සතු කරනු ලැබූ සහ එහි 70ම වන වගන්තියේ විධිවිධාන යටතේ කුලියට දෙනු ලැබූ සියලුම ස්ථාන, එම ආඥාපනත යටතේ ලියා අත්සන් කරනු ලැබූ කුලී සින්නක්කර ගිවිසුමේ ඇතුළත් නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව බැංකුවේ දේපළ වන අතර එසේ වී තිබිය යුතුය.

(ඈ) ලංකා රජයේ උකස් බැංකුවේ සහ කෘෂිකාර්මික සහ කාර්මික ණය සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් බැංකුව විසින් නිශ්චය කරනු ලබන නියම් හා කොන්දේසි පිට බැංකුවේ සේවා නියුක්තයන් ලෙස සලකනු ලැබිය යුතුය:

එසේ වුවද, එයින් යම් නිලධරයකුට හෝ සේවකයකුට සුදුසු රක්‍ෂාවක් දීමට බැංකුවට නොහැකි වන අවස්ථාවක හෝ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි පිට පත්වීමක් පිළිගැනීමට ඒ නිලධරයා හෝ සේවකයා අකැමැති වන අවස්ථාවක, නියම කරනු ලැබිය හැකි ප්‍රමාණ අනුව බැංකුව විසින් වන්දි ගෙවිය යුතුය.

(ඉ) ඒ දිනයට ඉහතින් වූ දිනයෙහි පවතින හෝ බලපැවැත්වෙන හා ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් හෝ කෘෂිකාර්මික සහ කාර්මික ණය සංස්ථාවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අත්සන් කර ඇති සියලු ගිවිසුම්, ඔප්පු, බඳුම්කර, එකඟවීම් සහ වෙනත් සාධන පත්‍ර ඒ අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙනුවට බැංකුව ඊට පාර්ශ්වකරුවකු වූ ලෙස සම්පූර්ණයෙන් හා බල සහිතව අවස්ථෝචිත පරිදි බැංකුවට විරුද්ධව හෝ බැංකුවේ වාසියට බලපැවැත්විය යුතුය.

(ඊ) ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් හෝ කෘෂිකාර්මික සහ කාර්මික ණය සංස්ථාවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් හෝ ඒ අධ්‍යක්‍ෂ මණ්ඩලයට විරුද්ධව හෝ පවරනු ලැබ ඒ දිනයට ඉහතින් වූ දිනයෙහි පවත්නා සියලු නඩු, අභියාචන හෝ වෙනත් නඩු කටයුතු එකී අවලංගු කිරීමේ හේතුවෙන් නතරවීම හෝ අත්හිටවනු ලැබීම හෝ ඒ නඩු කටයුතු කෙරෙහි කවර හෝ ආකාරයකින් හානි කර ලෙස බලපෑමක් ඇතිවීම නොවිය යුතු අතර, ඒ අනුව බැංකුව විසින් හෝ බැංකුවට විරුද්ධව ඒවා පවත්වාගෙන යනු ලැබීම හෝ ක්‍රියාත්මක කරනු ලැබීම කළ හැකිය.

86. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අධ්‍යක්ෂවරයා" හා "සාමාන්‍යාධිකාරිවරයා" යන්නෙන් මේ පනත යටතේ ඒ ධුරවලට පත්කරනු ලැබූ තැනැත්තෝ අදහස් වෙති;

"කර්මාන්තය" යන්නට මසුන් ඇල්ලීම, මැණික් ගැරීම, සංචාරක ව්‍යාපාරය, සහ වෙළෙඳ පොළේ විකිණීම සඳහා යම් නිෂ්පාදනයක් හෝ භාණ්ඩයක් ප්‍රවාහණය කිරීම සහ නිෂ්පාදනය කිරීම හෝ පිළියෙල කිරීම ඇතුළත් වේ;

"කෘෂිකර්මය" යන්නට බෝග, ඖෂධීය පැලෑටි හා ශාක වගාව, උයන්වතු වැවීම, පටපණුවන් ඇති කිරීම, මී මැසි පාලනය, වන විද්‍යාව, සතුන් ඇති කිරීම, කුකුළු ආදී සතුන් ඇති කිරීම සහ (සතුන් ඇති කිරීම සහ බෝ කිරීම, තණ බිම් සහ සත්වාහාර වගා කිරීම හා නිෂ්පාදන අලෙවිය ඇතුළු) කිරිපට්ටි පාලනය ඇතුළත් වේ;

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදනු ලැබූ රීති මගින් නියමිත බව අදහස් වේ;

"ණය" යන්නෙන් මුදලින් දෙන ණයක් අදහස් වන අතර කවර වූ හෝ නමකින් හෝ අභිධානයකින් හඳුන්වනු ලබන යම් අයිරා අණකරයක් හෝ වෙනත් යම් මුදල් ණයට දීමක් ඊට ඇතුළත්වන නමුත් බැංකුවේ සේවක මණ්ඩලයට දෙනු ලබන යම් වේතන අත්තිකාරම් මුදලක් ඊට ඇතුළත් නොවේ;

"මහ බැංකුව" යන්නෙන් මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"ව්‍යවසාය" යන්නෙන් කවර වූ හෝ නමකින් හෝ අභිධානයකින් හඳුන්වනු ලබන සංස්ථාගත හෝ සංස්ථාගත නොවූ යම් පුද්ගල මණ්ඩලයක් අදහස් වන අතර, ඒක පුද්ගල සංස්ථාවක් හෝ ඒක පුද්ගල අයිතියක් ඊට ඇතුළත් වේ.

## ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 18 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් උධෘතයි

2. 1974 අංක 1 දරන පනතින් අන්තිම වරට සංශෝධිත, (මේ පනතෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඌ) ඡේදයේ (i) අනුඡේදය අගට පහත සඳහන් අලුත් කරුණ එකතු කිරීමෙන් ඒ වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඉ) යම් ව්‍යාපාරස්ථානයක අයිතිකරු මිය යන විට බූදල් බදු ආඥා පනතෙහි අර්ථානුකූලව ඔහුට බැහැර කිරීමට බලය තිබුණා වූ එකී දේපළට වෙනත් ව්‍යාපාරස්ථානයක් ඇතුළත්ව නැත්තාවූත් එම ආඥාපනතෙහි අර්ථානුකූලව ඔහුගේ මුළු බූදලයෙහි වටිනාකම රුපියල් එක්ලක්ෂ පනස් දහසක් නොඉක්මවන්නාවූත් අවස්ථාවක, 1973 නොවැම්බර් 1 වන දින හෝ ඉන් පසු, අයිතිකරු මිය ගිය විට ඒ ව්‍යාපාරස්ථානයේ හිමිකම් පිළිබඳව ඇතිවන වෙනස්වීමක්."

3. (1) 1974 අංක 1 දරන පනතින් අන්තිම වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියෙහි (1) වන උප වගන්තිය, පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(අ) ඒ උපවගන්තියේ (අ-ඇ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ-ඇ) යම් කුඹුරක වගා කරන ලද වී—

(i) 1971 අංක 14 දරන වී අලෙවි මංඩල පනත යටතේ පිහිටුවන ලද වී අලෙවි මණ්ඩලයට හෝ එම පනතෙහි අර්ථානුකූල වූ යම් බලයලත් ගැනුම්කරුවකුට; හෝ

(ii) කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයාට හෝ ඒ අධ්‍යක්ෂකවරයා විසින් බලය දෙන ලද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට

විකිණීමෙන් එම කුඹුරේ හිමියා හෝ ගොවියා විසින් 1973 අප්‍රේල් 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලබන ලද ලාභ සහ ආදායම;"

තවද

(ආ) ඒ උප වගන්තියේ (1971 අංක 33 දරන පනතින් එහි ඇතුළත් කරන ලද) (ඇඇ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—
"(ඇඇඇ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතින් හෝ ඒ පනත යටතේ පිහිටුවන ලද පොල් සංවර්ධන අධිකාරයේ, පොල් පර්යේෂණ මණ්ඩලයේ සහ පොල් වගා මණ්ඩලයේ ලාභ සහ ආදායම;".

(2) මේ වගන්යේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වන්තියෙහි කරන ලද සංශෝධනය 1974 අංක 1 දරන පනත බලාත්විත වූ දිනය වන 1974 ජනවාරි මස 10 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතුය.

4 (1) ප්‍රධාන ප්‍රඥප්තියේ (1972 අංක 17 දරන පනතින් එහි ඇතුළත් කරන ලද) 7 අ වන වගන්තිය, එහි (9) වන උපවගන්තියෙහි පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "අපනයන ලාභ සහ ආදයම" යන්නෙන් අර්ථකථනය වෙනුවට පහත සඳහන් අළුත් අර්ථකථනය ආදේශ කිරීමෙන්:-

' "අපනයන ලාභ සහ ආදයම" යන්නෙන්, එය සමාගමක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදුණු විට, එම සමාගමේ හෝ ව්‍යාපාරයේ අපනයන පිරිවැටුම හා ඒ සමාගමේ හෝ ව්‍යාපාරයේ මුළු පිරිවැටුම හා අතර අනුපාතය මේ පනතෙහි විධිවිධාන අනුව ගණන් බලනු ලබන ඒ සමාගමේ හෝ ව්‍යාපාරයේ (මේ පනතේ 5 අ වන වගන්තිය යටතේ ආදයම් බද්දෙන් නිදහස් යම් ලාභ හා ආදයම අත් හැරීමෙන් පසු, 3 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදයෙහි අර්ථානුකූල වූ) ලාභ සහ ආදයම හා යම් මුදලක් හා අතර ඇති වෙද ඒ මුදල අදහස්වේ.';

(ආ) "අපනයන පිරිවැටුම" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' "අපනයන පිරිවැටුම" යන්නෙන්,එය සමාගමක් හෝ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෙදුණු විට, භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය අපනයනය කිරීමෙන් හෝ විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවනු පිණිස සේවාවන් සැපයීමෙන් ඒ සමාගමට හෝ ව්‍යාපාරයට ලැබුණු හෝ ලබාගත හැකි සම්පූර්ණ මුදල අදහස් වන නමුත් එයට —

(අ) ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලබා ගත හැකි යම් මුදලක්;

(ආ) මැණික් විකිණීමෙන් ඇති වන්නා වූ ලාභ සහ ආදයම මේ පනතේ 5 අ වන වගන්තිය යටතේ ආදයම් බද්දෙන් නිදහස් අවස්ථාවක, එම මැණික් විකිණීමෙන් ලැබුණු හෝ ලබා ගත හැකි යම් මුදලක්;

(ඇ) තොග වශයෙන් කළු තේ හෝ, ක්‍රෙප් රබර්, ෂීට් රබර්, පොල් තෙල්, කපාපු පොල්, කොප්පරා, අමු පොල්, පොල් කෙඳි හෝ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනයකින් අමාත්‍යවරයා විසින් මේ වගන්තියෙහි කාර්යයන් සඳහා නියම කරන ලද වෙන යම් වෙළෙඳ ද්‍රව්‍යයක් අපනයනය කිරීමෙන් ලැබුණු හෝ ලබා ගත හැකි යම් මුදලක් ; සහ

(ඈ) 3 වන වගන්තියෙහි (1) වන උප වගන්තියේ (අ) ඡේදයෙහි අර්ථානුකූල වූ ලාභ සහ ආදයම නොවන ලාභ හා ආදයම් කිසිවක්

ඇතුළත් නොවේ ; ' ; තවද

(ඇ) "මුළු පිරිවැටුම" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන්:-

' "මුළු පිරිවැටුම" යන්නෙන්, එය සමාගමක් හෝ ව්‍යාපාරයක්සම්බන්ධයෙන් යෙදුණු විට, ඒ සමාගම හෝ ව්‍යාපාරය විසින් පවත්වා ගෙන යනු ලබන හෝ කර ගෙන යනු ලබන යම් කර්මාන්තයකින් හෝ වෙළෙඳ ව්‍යාපාරයකින් ලැබුණු හෝ ලබා ගත හැකි මුළු මුදල අදහස් වන නමුත් එයට—

(අ) ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලබා ගත හැකි යම් මුදලක් ;

(ආ) මැණික් විකිණීමකින් ඇතිවන්නා වූ ලාභ සහ ආදයම මේ පනතේ 5 අ වන වගන්තිය යටතේ ආදයම් බද්දෙන් නිදහස් අවස්ථාවක, එම මැණික් විකිණීමෙන් ලැබුණු හෝ ලබා ගත හැකි යම් මුදලක් ; සහ

(ඇ) 3 වන වගන්තියෙහි (I) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි අර්ථානුකූල වූ ලාභ සහ ආදායම නොවන ලාභ සහ ආදායම

ඇතුළත් නොවේ.'.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 අ වන වගන්තියෙහි කරන ලද සංශෝධන ඉහත කී 7 අ වන වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලබන දිනයෙහි ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතුය.

5. 1969 අංක 6 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියෙහි (6 අ) වන උපවගන්තිය ඉවත් කොට පහත සඳහන් අලුත් උපවගන්තිය ඒ වෙනුවට ආදේශ කිරීමෙන් එම වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'(6 අ) මේ වගන්තියෙහි (6) වන උපවගන්තිය—

(අ) 1969 අප්‍රේල් 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1973 අප්‍රේල් 1 වන දින පසු නොවී ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් අදාළ වීමේදී එහි "රුපියල් පන්සියයක" යන වචන වෙනුවට "රුපියල් නව සියයක" යන වචන ආදේශ කරන ලද්දක් මෙන් ද;

(ආ) 1974 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එක් එක්තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් අදාළවීමේ දී "රුපියල් පන්සියයක" යන වචන වෙනුවට "රුපියල් එක් දහස් දෙසියයක" යන වචන ආදේශ කරන ලද්දක් මෙන් ද

බලපැවැත්විය යුතුය.'.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් : –

'(2) 1963 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1973 අප්‍රේල් 1 වන දින පසු නොවී ආරම්භ වන (මේ උපවගන්තියෙහි මින්මතු "උචිත තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) සෑම තක්සේරු වර්ෂයක්ම සඳහා තෑගි බද්දට යටත් යම් තැනැත්තකු විසින් උචිත තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයෙහි පිරිනමනු ලැබූ බදු අයකළ හැකි තෑගිවල වටිනාකම 1958 ජූලි 18 වන දින හෝ ඉන්පසුව හා ඒ පෙරාතුව වූ වර්ෂයට පෙර ඔහු විසින් පිරිනමනු ලැබූ බදු අයකළ හැකි තෑගිවල වටිනාකමට එකතු කරනු ලැබිය යුතුය. එවිට, එසේ එකතු කිරීමෙන් ලැබෙන මුදල, තෑගි බද්ද නියම කළ හැකි, බදු අයකළ හැකි තෑගිවලට වටිනාකම යයි සලකමින්, තෑගි බද්ද පිළිබඳ උචිත අනුප්‍රමාණ අදාළ කරගනිමින් ඒ බදු ප්‍රමාණය ආගණනය කළ යුතුය. එසේ ආගණනය කරනු ලැබූ ඒ මුදල් ප්‍රමාණයෙන්, 1959 අංක 14 දරන පුද්ගල බදු පනත යටතේ අයකරන ලද පුද්ගලික බද්ද සඳහා බදු අයකළ හැකි තෑගි වෙනුවෙන් දයක මුදල් වශයෙන් හෝ මේ පනත යටතේ තෑගි බද්ද වශයෙන් හෝ ඔහු විසින් කලින් ගෙවනු ලැබූ සියලුම මුදල් අඩු කරනු ලැබිය යුතුය. එලෙස අඩු කිරීමෙන් පසු ඉතිරි වන මුදල් ප්‍රමාණය උචිත තක්සේරු වර්ෂය සඳහා බදු අයකළ හැකි ඔහුගේ තෑගි වෙනුවෙන් තෑගි බදු ප්‍රමාණය විය යුතු ය.';

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2 අ) 1974 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් ම සඳහා, බදු අයකළ හැකි තම තෑගි වෙනුවෙන් යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු තෑගි බද්ද වූකලී—

(අ) ඒ තැනැත්තා විසින් 1958 ජුලි 18 වන දින හෝ ඉන් පසුව හා (මේ උපවගන්තියේ මින්මතු "පෙරාතුව වූ වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) එම තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂය අවසාන වීමට පෙර, මේ පනතේ හෝ 1959 අංක 14 දරන පුද්ගල බදු පනතේ අර්ථානුකූලව පිරිනමන ලද බදු අයකළ හැකි සියලුම තෑගිවල මුළු වටිනාකම මත, පෙරාතුව වූ වර්ෂය තුළ පිරිනමන ලද බදු අය කළ හැකි තෑගිවලට අදාළ වන්නාවූ ද, මේ පනතේ හයවන උපලේඛනයේ දක්වෙන තෑගි බද්ද පිළිබඳවූ ද ප්‍රමාණ අනුව ආගණනය කරන ලද ප්‍රමාණය; සහ

(ආ) ඒ තැනැත්තා විසින් 1958 ජුලි 18 වන දින හෝ ඉන් පසුව හා පෙරාතුව වූ වර්ෂය ආරම්භවීමට පෙර, මේ පනතේ හෝ 1959 අංක 14 දරන පුද්ගල බදු පනතේ අර්ථානුකූලව පිරිනමන ලද බදු අයකළ හැකි තෑගිවල මුළු වටිනාකම මත, පෙරාතුව වූ වර්ෂය තුළ පිරිනමන ලද බදු අයකළ හැකි තෑගිවලට අදාළවන්නා වූ ද, මේ පනතේ හය වන උප ලේඛනයේ දක්වෙන තෑගි බද්ද පිළිබඳ වූද ප්‍රමාණ අනුව ආගණනය කරන ලද ප්‍රමාණය

අතර පවතින වෙනස ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 69 ආ වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 69 ඇ වන වගන්තිය ලෙස බල පවත්වන්නේ ය:—

69 ඇ. 1972 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ ලාභවලට හා ආදායමට—

(අ) එම තක්සේරු වර්ෂයට ඉහතින් වූ වර්ෂයේදී කරගෙන යාම හෝ යෙදී සිටීම ඔහු අවසාන කළ යම් වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලද ලාභ හා ආදායම සහ එම තක්සේරු වර්ෂයට ඉහතින් වූ වර්ෂයේ දී හෝ එම තක්සේරු වර්ෂයේ දී කරගෙන යාම හෝ යෙදී සිටීම ඔහු ආරම්භ කළ යම් සේවා නියුක්තියකින් ලද ලාභ, හෝ

(ආ) එම තක්සේරු වර්ෂයේ දී කරගෙන යාම හෝ යෙදී සිටීම ඔහු අවසාන කළ යම් වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලද ලාභ හා ආදායම සහ එම තක්සේරු වර්ෂයේ දී කරගෙන යාම හෝ යෙදී සිටීම ඔහු ආරම්භ කළ සේවා නියුක්තියකින් ලද ලාභ

ඇතුළත් වන අවස්ථාවක, 1975 දෙසැම්බර් 31 වන දින හෝ ඊට පෙර එම තැනැත්තා විසින් ලිඛිත ඉල්ලීමක් කරනු ලැබූ විට, කාරණයේ අවස්ථානුගත තත්ත්වයන් අනුව අවශ්‍ය විය හැකි සහනයක් කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට දිය හැකි ය. ඒ සහනය දෙනු ලැබූ අවස්ථාවක, 103 වන හා 117 වන වගන්තිවල කුමක් සඳහන් ව ඇත ද, ඒ තැනැත්තා සම්බන්ධයෙන් කරන ලද තක්සේරුව සංශෝධනය කොට සංශෝධිත තක්සේරුවෙන් අය කෙරෙන බද්දට අතිරික්තව ගෙවනු ලැබ ඇති යම් මුදලක් ඒ තැනැත්තාට ආපසු ගෙවනු ලැබිය යුතුය.

8. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 73 වන වගන්තිය අගට පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (9), (2), (3), (4), (6අ) හා (8) වන උප වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද, 1973 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්—

( අ ) අග්‍රාමාත්‍ය, (අග්‍රාමාත්‍ය නොවන) අමාත්‍ය, ජාතික රාජ්‍ය සභාවේ කථානායක, නියෝජ්‍ය කථානායක හෝ නියෝජ්‍ය කාරක සභා සභාපති හෝ නියෝජ්‍ය අමාත්‍ය ධුරය තත්කාලයේ දරන්නාවූ යම් තැනැත්තකු පිළිබඳව වූ විට, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ඒ තැනැත්තාට ගෙවනු ලබන මාසික පාරිශ්‍රමිකයෙන්, (2), (3), (4), සහ (6අ) වන උප වගන්තිවල සඳහන් රුපියල් තුන්සියයක් වූ මුදල වෙනුවට, රුපියල් හත්සියයක් වූ මුදලක්, ඒ තැනැත්තාගේ එම ධුරයෙන් උපදින්නා වූ ලාභ හා ආදායම නිශ්චය කිරීමේදී සැලකිල්ලට නොගත යුතු ය; තවද

(ආ) ( (අ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු නොවන) මහජන මන්ත්‍රීවරයකු වන තැනැත්තකු පිළිබඳ ව වූ විට, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ඒ තැනැත්තාට ගෙවනු ලබන මාසික පාරිශ්‍රමිකයෙන්, (8) වන උප වගන්තියෙහි සඳහන් වෙනත් දීමනාවල මුදලින් හරි අඩක් වෙනුවට, රුපියල් හත්සියයක් වූ මුදලක් ඒ මන්ත්‍රීවරයා වශයෙන් වූ ඒ තැනැත්තාගේ ලාභ හා ආදායම නිශ්චය කිරීමේදී සැලකිල්ලට නොගත යුතුය.''

11. ප්‍රධාන ප්‍රඥප්තියේ හය වන උපලේඛනයෙහි ''1965 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වූ යම් තක්සේරු වර්ෂයකට ඉහතින් වූ වර්ෂය ඇතුළත දෙන ලද තෑගි සඳහාවූ තෑගි බද්ද පස්වන උපලේඛනයේ II වන කොටසෙහි දැක්වෙන සියයට ප්‍රමාණය හෝ සියයට ප්‍රමාණයන් අනුව විය යුතු ය.'' යන යෙදුම වෙනුවට පහත සඳහන් යෙදුම ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''කෙසේ වුවද 1974 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට ඉහතින් වූ වර්ෂය ඇතුළත පිරිනමන ලද තෑගි සඳහා, බදු අය කළ හැකි සියලු ම තෑගිවල වටිනාකමේ ප්‍රථම රු. 50,000 වෙනුවෙන් සියයට ප්‍රමාණය පස්වන උපලේඛනයේ II වන කොටසෙහි දැක්වෙන සියයට 5 වෙනුවට සියයට 3 ක් විය යුතුය යන වෙනස් කිරීමට යටත්ව, 1965 අප්‍රේල් 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයකට ඉහතින් වූ වර්ෂය ඇතුළත පිරිනමන ලද තෑගි සඳහා වූ තෑගි බද්ද පස්වන උපලේඛනයේ II වන කොටසෙහි දැක්වෙන සියයට ප්‍රමාණය හෝ සියයට ප්‍රමාණයන් අනුව විය යුතුය.''.

---

## ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 21 දරන මිල පාලන (සංශෝධන) පනතින් උධෘතයි

2. 1962 අංක 23 දරන පනතින් සංශෝධිත මිල පාලන පනතෙහි 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උප වගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන්:—

''(අ) ඒ භාණ්ඩය නොවිකිණිය යුත්තේ (කර්මාන්ත ශාලාවේ දී, තොග සහ සිල්ලර) යම් උපරිම මිලකට වැඩියෙන් ද ඒ මිල නියම කිරීම;'';

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට එහි (ඇ) ඡේදය වශයෙන් නැවත අක්ෂර යෙදීමෙන් ; සහ

(3) ඒ උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

''(ආ) (i) නිෂ්පාදක විසින් හෝ ආනයනකරු විසින් ඒ භාණ්ඩයේ (කර්මාන්ත ශාලාවේ දී, තොග සහ සිල්ලර) උපරිම මිල නියම කළ යුත්තේ යම් මිල ව්‍යුහයකට අනුව ද ඒ මිල ව්‍යුහය දැක්වීම ;

(ii) එසේ නියම කරනු ලැබූ උපරිම මිල ඒ නිෂ්පාදක විසින් හෝ ආනයනකරු විසින් මහජනයාට දැන ගැනීමට සැලැස්විය යුතු ආකාරය දැක්වීම ; සහ

(iii) ඒ භාණ්ඩය යම් උපරිම මිලකට වැඩියෙන් නොවිකිණිය යුත්තේ ද ඒ උපරිම මිල එසේ නියම කරනු ලැබූ මිල විය යුතු බව නියම කර දැක්වීම ; සහ''.

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 22 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත

## ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 22 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** මේ පනතෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනතේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

10. පවුලක ප්‍රධානියා වූ හෝ පවුලකට ඇතුළත් නැති පුද්ගලයකු—

(අ) 1973 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වූ විට—

(i) ඔහුගේ දායක මුදල් ගෙවියයුතු ආදායමට සමාන බදු අය කළ හැකි ආදායමක් වෙනුවෙන් එම තක්සේරු වර්ෂය සඳහා ප්‍රධාන පනත යටතේ ගෙවීමට යටත් වන ආදායම් බද්ද රුපියල් අටසිය හතළිහකට වැඩි නොවේ නම්; හෝ

(ii) ඒ තක්සේරු වර්ෂය සඳහා ලැබූ ඔහුගේ මුළු ආදායම රුපියල් දොළොස් දහසකට වැඩි නොවේ නම්

එම තක්සේරු වර්ෂය සඳහා ද

(ආ) 1974 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වූ විට, එම තක්සේරු වර්ෂය සඳහා ලැබූ ඔහුගේ මුළු ආදායම රුපියල් දහ අට දහසකට වැඩි නොවේ නම් එම තක්සේරු වර්ෂය සඳහා ද

මේ පනත යටතේ දායක මුදල් ගෙවීමට ඒ පුද්ගලයාට නියම නොකළ යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් එම වගන්තිය නැවත අංක කිරීමෙන්;

(ආ) නැවත අංක කරනු ලැබූ (1) වන උප වගන්තියේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන වෙනුවට "1973 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(2) පවුලක ප්‍රධානයා වූ හෝ පවුලකට ඇතුළත් නැති පුද්ගලයකු විසින් 1974 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මෙම පනත යටතේ ගෙවිය යුතු සාමාන්‍ය දායක මුදල, එම තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ මුළු ආදායම රුපියල් දහ අට දහස ඉක්මවන්නේ යම් මුදලකින් ද ඒ මුදලෙන් සියයට අසූවකට වැඩි නොවිය යුතුය ය."

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 28 දරන මුද්දර (සංශෝධන) පනත

මුද්දර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 28 දරන මුද්දර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2 පහත සඳහන් අලුත් වගන්තිය (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) මුද්දර ආඥාපනතේ 87 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 87 අ වන වගන්තිය වශයෙන් බලපවත් වන්නේ යː—

87 අ. (1) සේවකයන්ගේ සේවා නියුක්තිය සම්බන්ධයෙන් ඔවුන්ට කරන ගෙවීම් සඳහා 34 වන වගන්තිය යටතේ යථා පරිදි මුද්දර ගසන ලද කුවිතාන්සි ඒ සේවකයන් විසින් දීම කළ නොහැකි බවත් අයෝග්‍ය බවත් ඒ ගෙවීම් කරන යම් තැනැත්තකු විසින් කොමසාරිස්වරයාට ඒත්තු ගන්වනු ලැබුණ නම්, කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් —

(අ) ඒ ගෙවීමට අදාළ කුවිතාන්සිය වෙනුවෙන් ගෙවිය යුතු මුද්දර ගාස්තුව, ඒ දැන්වීමේ නිශ්චිත ගෙවීම් ප්‍රමාණයෙන් අඩු කරන ලෙස ;

(ආ) (අ) ඡේදය යටතේ අඩු කරන ලද මුදල් දැන්වීමේ නිශ්චිත අන්තර කාලවල දී යවන ලෙස ; සහ

(ඇ) (අ) ඡේදය යටතේ අඩුකරන ලද මුදල් පිළිබඳ ගිණුම් ඒ කොමසාරිස්වරයා විසින් දැන්වීමේ නිශ්චය කරන ලද අන්තර කාලවල දී දැන්වීමේ ම නිශ්චය කරන ලද ආකෘතිය අනුව සහ එහිම නිශ්චය කරන ලද විස්තර සහිතව කොමසාරිස්වරයාට භාර දෙන ලෙස

ඒ තැනැත්තාට විධාන කරනු ලැබිය හැකි ය.

(2) 34 වන වගන්තියේ කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක සඳහන් යම් ගෙවීමක් ලබන යම් තැනැත්තකු විසින් ඒ ගෙවීම වෙනුවෙන් යථා පරිදි මුද්දර ගසන ලද කුවිතාන්සියක් දෙනු ලැබීම අවශ්‍ය නොවන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත නිකුත් කරන ලද දැන්වීමකින් දෙන ලද යම් විධානයක් පිළිපැදීම පැහැර හරින යම් තැනැත්තෙක් ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය වෙනුවෙන් සියයට රුපියල් දහයකට සමාන වූ මුදලක් දණ්ඩනයක් වශයෙන් ගෙවීමට යටත් වන අතර, පැහැර හැරීම නොකඩව කෙරෙන පළමුවන මාසයෙන් පසුව සෑම මාසයක් ම සඳහා එවැනිම දණ්ඩනයක් ගෙවීමට ද යටත් වන්නේ ය.

(4) මෙ වගන්තිය යටතේ ගෙවීමට නියමිත ගාස්තුව සහ දණ්ඩනය, ඒවා iv වන පරිච්ඡේදය යටතේ ගෙවීමට නියම කරනු ලැබූ විටක මෙන් අය කරගනු ලැබිය යුතු ය''.

3. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 21 දරන පනතින් අවසාන වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ අ උපලේඛනයේ I වන කොටස පහත සඳහන් පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 23 වන විෂයයේ (1) වන සහ (2) වන ඡේද වෙනුවට, පහත සඳහන් අලුත් ඡේද එකී 23 වන විෂයයෙහි ආදේශ කිරීමෙන් :—

"(1) (අ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කළ යුතු දේපළක් හිමිකර දෙන නොහොත් පවරා දෙන ලියවිල්ලකට හෝ විකුණුම් පත්‍රයකට ;

(ආ) යම් ප්‍රතිෂ්ඨාවක් සඳහා යම් නිශ්චල දේපළක් හිමිකර දීමකට හෝ පවරා දීමකට එම හිමිකරයෙහි හෝ පැවරුම්කරයෙහි නැතහොත් එම හිමිකරය මත හෝ පැවරුම්කරය මත හෝ ප්‍රකාශිත ගැනුම් මිල හෝ ප්‍රතිෂ්ඨා මුදල, නැතහොත් ප්‍රතිෂ්ඨාව මුදලක් නොවන්නා වූ විට හෝ ප්‍රතිෂ්ඨාව කොටසක් මුදලින් සහ කොටසක් මුදල් නොවන වෙනත් දෙයකින් සමන්විත වන විට, ඒ දේපළෙහි වටිනාකම පහත සඳහන් පරිදි වන අවස්ථාවක—

| | රු. | ශ. |
|---|---|---|
| රු. 0 ට වැඩි, එහෙත් රු. 50 ට වැඩි නොවූ විට .. | 1 | 0 |
| රු. 50 ,, .. රු. 100 ,, .. | 2 | 0 |
| රු. 100 ,, .. රු. 200 ,, .. | 4 | 0 |
| රු. 200 ,, .. රු. 300 ,, .. | 6 | 0 |
| රු. 300 ,, .. රු. 400 ,, .. | 8 | 0 |
| රු. 400 ,, .. රු. 500 ,, .. | 10 | 0 |
| රු. 500 ,, .. රු. 1000 ,, .. | 15 | 0 |
| රු. 1000 ට වැඩි, එහෙත් රු. 50,000 ට වැඩි නොවූ විට, සෑම රු. 100 කට ම හෝ ඉන් කොටසකට .. | 3 | 0 |
| රු. 50,000 ට වැඩි, එහෙත් රු. 75,000 ට වැඩි නොවූ විට, සෑම රු. 100 කට ම හෝ ඉන් කොටසකට .. | 4 | 0 |
| රු. 75,000 ට වැඩි, එහෙත් රු. 100,000 ට වැඩි නොවූ විට, සෑම රු. 100 කට ම හෝ ඉන් කොටසකට .. | 5 | 0 |
| රු. 100,000 ට වැඩි වූ විට, සෑම රු 100 කට ම හෝ ඉන් කොටසකට .. .. | 6 | 0 |

එසේ වුව ද යම් නිශ්චල දේපළක් හිමිකර දීමක් හෝ පවරා දීමක් කොටසක් හිමිකර දීමක් හෝ පවරා දීමක් හෝ ලෙස ද කොටසක් ත්‍යාගයක් ලෙස ද කොමසාරිස්වරයා විසින් සලකනු ලබන අවස්ථාවක, ඒ දේපළෙහි වටිනාකම රු. 1,000 ඉක්මවන්නේ නම්, ඒ හිමිකර දීම හෝ පවරා දීම පිළිබඳ සාධන පත්‍රයෙහි දක්වා ඇති ප්‍රතිෂ්ඨාව රු. 1,000 ට අඩු වුව ද, ඒ ගනු දෙනුවේ හිමිකර දීමක් හෝ පවරා දීමක් ලෙස සලකනු ලබන කොටස වෙනුවෙන් අය කළ යුතු ගාස්තුව ඉහත දක්වා ඇති උචිත ප්‍රමාණය අනුව විය යුතු ය.

( 2 ) යම් ප්‍රතිෂ්ඨාවක් සඳහා යම් චංචල දේපළක් හිමිකර දීමට හෝ පවරා දීමට—

එම හිමිකරයෙහි හෝ පැවරුම්කරයෙහි නැතහොත් එම හිමිකරය මත හෝ පැවරුම්කරය මත ප්‍රකාශිත ගැනුම් මිල හෝ ප්‍රතිෂ්ඨා මුදල, නැතහොත් ප්‍රතිෂ්ඨාව මුදලක් නොවන්නා වූ විට හෝ ප්‍රතිෂ්ඨාව කොටසක් මුදලින් සහ කොටසක් මුදල් නොවන වෙනත් දෙයකින් සමන්විත වන විට ඒ දේපළෙහි වටිනාකම පහත සඳහන් පරිදි වන අවස්ථාවක—

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| රු. 0 ට වැඩි, එහෙත් | රු. 50 ට වැඩි නොවූ විට | .. | 0 | 50 |
| රු. 50 ,, | .. රු. 100 ,, | .. | 1 | 0 |
| රු. 100 ,, | .. රු. 200 ,, | .. | 2 | 0 |
| රු. 200 ,, | .. රු. 300 ,, | .. | 3 | 0 |
| රු. 300 ,, | .. රු. 400 ,, | .. | 4 | 0 |
| රු. 400 ,, | .. රු. 500 ,, | .. | 5 | 0 |
| රු. 500 ,, | .. රු. 1000 ,, | .. | 10 | 0 |
| රු. 1000 ට වැඩි, එහෙත් රු. 50,000 ට වැඩි නොවූ විට, සෑම රු. 100 කට ම හෝ ඉන් කොටසකට | | .. | 3 | 0 |

රු. 50,000 ට වැඩි වූ විට .. රු. 1500 ක් සහ රු. 50,000 ට වැඩි සෑම රු. 500 කට ම හෝ ගෙවීමට ඉතිරිව ඇති එහි යම් භාගයකට රු. 5 බැගින් ගණන් බලනු ලබන අමතර මුදලක්.

එසේ වුව ද කොටස්, කොටස් සහතික පත්‍ර, ස්කන්ධ, සෘණ පත්‍ර හෝ සෘණ ස්කන්ධ හිමිකර දීමක් හෝ පවරා දීමක් සම්බන්ධයෙන් වන විට මුද්දර ගාස්තුව මෙසේ විය යුතුය :—

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| වටිනාකම රු. 0 ට වැඩි, එහෙත් | රු. 50 ට වැඩි නොවූ විට | .. | 1 | 0 |
| ,, රු. 50 | .. රු. 100 ,, | .. | 2 | 0 |
| ,, රු. 100 | .. රු. 200 ,, | .. | 4 | 0 |
| ,, රු. 200 | .. රු. 300 ,, | .. | 6 | 0 |
| ,, රු. 300 | .. රු. 400 ,, | .. | 8 | 0 |
| ,, රු. 400 | .. රු. 500 ,, | .. | 10 | 0 |
| ,, රු. 500 | .. රු. 1000 ,, | .. | 20 | 0 |
| රු. 1000 ට වැඩි, එහෙත් රු. 50,000 ට වැඩි නොවූ විට, සෑම රු. 100 කට ම හෝ ඉන් කොටසකට | | .. | 3 | 0 |

රු. 50,000 වැඩි වූ විට .. රු. 1500 ක් සහ රු. 50,000 ට වැඩි සෑම රු. 500 කට ම හෝ ගෙවීමට ඉතිරිව ඇති එහි යම් භාගයකට රු. 10 බැගින් ගණන් බලනු ලබන අමතර මුදලක්";

( 2 ) එහි 32 වන විෂය වෙනුවට පහත සඳහන් අලුත් විෂය ආදේශ කිරීමෙන් :—

"32. (1) යම් දේපළක් තෑගි දීම හෝ තෑගි දීමේ ඔප්පුව—

| | රු. | ශ. |
|---|---|---|
| (අ ) දේපළෙහි වටිනාකම— | | |
| ( i ) රු. 50 නොඉක්මවන අවස්ථාවක .. .. | 1 | 0 |
| ( ii ) රු. 50 ඉක්මවන, එහෙත් රු. 100 නොඉක්මවන අවස්ථාවක .. .. .. | 2 | 0 |
| ( iii ) රු. 100 ඉක්මවන, එහෙත් රු. 200 නොඉක්මවන අවස්ථාවක .. .. .. | 4 | 0 |
| ( iv ) රු. 200 ඉක්මවන, එහෙත් රු. 300 නොඉක්මවන අවස්ථාවක .. .. .. | 6 | 0 |
| ( v ) රු. 300 ඉක්මවන, එහෙත් රු. 400 නොඉක්මවන අවස්ථාවක .. .. .. | 8 | 0 |
| ( vi ) රු. 400 ඉක්මවන, එහෙත් රු. 500 නොඉක්මවන අවස්ථාවක .. .. .. | 10 | 0 |
| ( vii ) රු. 500 ඉක්මවන, එහෙත් රු. 1,000 නොඉක්මවන අවස්ථාවක .. .. .. | 15 | 0 |
| ( viii ) රු. 1000 ඉක්මවන, එහෙත් රු 50,000 නොඉක්මවන අවස්ථාවක, සෑම රු 100 කට ම හෝ ඉන් කොටසකට .. | 3 | 0 |

(ආ) දේපළෙහි වටිනාකම රු 50,000 ඉක්මවන අවස්ථාවක, රු. 1,500 ක් සහ රු. 50,000 වැඩි සෑම රු. 500 කටම හෝ ගෙවීමට ඉතිරිව ඇති එහි යම් භාගයකට රු 8 බැගින් ගණන් බලනු ලබන අමතර මුදලක්.

( 2 ) බිම් කට්ටි කිහිපයක් එකම දේපළක් වශයෙන් සලකනු ලබන සහ විස්තර කරනු ලබන අවස්ථාවක සහ ඒ බිම් කට්ටි එකිනෙක පිහිටා තිබෙන ආකාරය අනුව ඒවා එකම බිම් මැනීමක ඇතුලත් කරනු ලැබිය හැකි අවස්ථාවක හැර, ඉඩම් එකකට වැඩි ගණනකට බලපාන තෑගි දීමක් හෝ තෑගි දීමේ ඔප්පුවක් පහත සඳහන් පරිදි වැඩිමනත් ගාස්තුවලට යටත් වන්නේ ය :—

| | රු. | ශ. |
|---|---|---|
| එක් එක් අතිරේක ඉඩම සඳහා— | | |
| ( i ) සියලුම ඉඩම්වල වටිනාකමේ සමස්තය රු. 100 ක් නොඉක්මවන අවස්ථාවක .. .. | 0 | 25 |
| ( ii ) සියලුම ඉඩම්වල වටිනාකමේ සමස්තය රු. 100 ක් ඉක්මවන, එහෙත් රු. 300 නොඉක්මවන අවස්ථාවක .. | 0 | 50 |
| ( iii ) සියලුම ඉඩම්වල වටිනාකමේ සමස්තිය රු. 300 ක් ඉක්මවන අවස්ථාවක .. .. | 1 | 0". |

## ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 32 දරන බැංකු හර බදු (සංශෝධන) පනත

1970 අංක 27 දරන බැංකු හර බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 32 දරන බැංකු හර බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍ය වරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක වන්නේ ය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1970 අංක 27 දරන බැංකු හර බදු පනතේ 3 වන වගන්තියෙහි (ආ), (ඇ) සහ (ඈ) ඡේද අත් හැරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

> "(1) සෑම වාණිජ බැංකුවක් විසින් එක් එක් ලිත් මාසය අවසාන වීමෙන් පසු දින හැටක් ඇතුළත, එම බැංකුවෙහි පවත්වා ගෙන යනු ලබන එක් එක් ජංගම ගිණුමෙහි ඇති මුදල අනුව, එම මාසය තුළ එම ගිණුමෙන් කරනු ලැබූ හර වෙනුවෙන් වූ බද්දට හෝ බද්දෙහි කොටසට සමාන මුදලක් එම ගිණුමෙන් ඉවත් කර ගත යුතුය; ඉනික්බිති, මේ උපවගන්තිය ප්‍රකාර ඉවත් කර ගන්නා ලද මුළු මුදලින් 6 වන වගන්තියෙහි සඳහන් ගාස්තුවෙහි මුදල අඩුකර ගැනීමෙන් පසු ඒ මුදලෙහි ඉතුරුව, ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු පිණිස, නියමිත ආකෘතියෙහි වූ එයට අදාළ ප්‍රකාශයකුත් සමග, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රධාන ගණකාධිකාරී වෙත යැවිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත්කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

> 15. සෑම ලිත් මාස තුනක් අවසානයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ එම බැංකුවේ නිලධරයකු විසින්, එක් එක් වාණිජ බැංකුව සම්බන්ධයෙන්, එම වාණිජ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුම් වලින් එකී මාස තුනේ කාලය තුළ කරනු ලැබූ බද්දට යටත් හරවල මුළු මුදල ද, ඒ හර වෙනුවෙන් ගෙවිය යුතු බද්දෙහි මුළු මුදල ද බද්ද ගෙවීම් වශයෙන් එම වාණිජ බැංකුව විසින් යවන ලද මුදල් ප්‍රමාණය ද, බද්ද අයකර ගැනීම හා යැවීම සඳහා බැංකුවේ ගාස්තු වශයෙන් එම වාණිජ බැංකුව විසින් තබා ගන්නා ලද මුදල් ප්‍රමාණය සහ අයකර නොගන්නා ලද යම් බදු මුදලක් වේ නම් ඒ බදු මුදලේ ප්‍රමාණය ද ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වෙත ලියවිල්ල කින් සහතික කර යැවිය යුතු ය. එම සහතිකය එය අදාළ වන ලිත් මාස තුන අවසාන වීමෙන් පසු දින හැත්තෑ හතරක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයකු විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත යැවිය යුතු ය.'.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ "වාණිජ බැංකුව" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

> ' "වාණිජ බැංකුව" යන්නෙන් මුදල් නීති පනතේ අර්ථානුකූල වූ යම් වාණිජ බැංකුවක් අදහස් වේ;'.

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ III වන කොටසට ඉත්බිතිව ම, පහත සඳහන් අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ පනතේ III අ වන කොටස වශයෙන් බලපවත්වන්නේ ය:—

‘ III අ වන කොටස

ප්‍රසිද්ධ සමාගම්වලට අයිතිව තිබෙන වතු ඉඩම්වලට අදාළ විශේෂ විධිවිධාන

42අ. (1) මේ පනතේ මෙම කොටස ක්‍රියාත්මක වන දිනයෙහි ප්‍රසිද්ධ සමාගමකට අයිතිව තිබෙන හෝ ප්‍රසිද්ධ සමාගමක් සන්තකයෙහි පවත්නා සෑම වතු ඉඩමක් ම, ඒ දිනයෙහි සිට බලපැවැත්වෙන පරිදි—

(අ) කොමිෂන් සභාව වෙත සතු වූ ලෙස සහ කොමිෂන් සභාව සන්තකව තිබෙන ලෙස සලකනු ලැබිය යුතු ය; තව ද

(ආ) ඒ සතුවීමේ දිනයට පෙරාතුවම වූ දිනයෙහි ඒ සමාගම සඳහා සහ වෙනුවෙන් එම වතු ඉඩමේ කළමනාකරණය පිළිබඳව වගකීම දරූ සහ කළමනාකරණය භාරව සිටි නියෝජිත ආයතනය හෝ සංවිධානය හෝ තැනැත්තා හෝ විසින් කොමිෂන් සභාව සඳහා සහ වෙනුවෙන් ව්‍යවස්ථාපිත භාරයක් යටතේ කළමනාකරණය කරනු ලබන ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ නියෝජිත ආයතනය, සංවිධානය හෝ තැනැත්තා, මේ පනතේ මේ කොටසෙහි විධිවිධානවලට යටත්ව එම වතු ඉඩමේ ව්‍යවස්ථාපිත භාරකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වතු ඉඩමක් සතු කිරීමෙහි, ඒ සතු කිරීමේ දිනයෙහි සිට, සහ මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට යටත්ව සියලු බැඳීම්වලින් තොරව, එම වතු ඉඩමෙහි පරම අයිතිය කොමිෂන් සභාව වෙත ලබාදීමේ බලපෑම ඇත්තේ ය.

(3) ව්‍යවස්ථාපිත භාරකරුවන්ගේ පාරිශ්‍රමික හෝ නියෝජිත ගාස්තුව ද ඇතුළුව, ව්‍යවස්ථාපිත භාරයෙහි නියමයන් හා කොන්දේසි, මේ පනතේ මේ කොටසෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට යටත්ව, මෙම පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියමිත පරිදි වන්නේ ය.

42ආ. (1) 42අ වන වගන්තිය යටතේ යම් වතු ඉඩමක් කොමිෂන් සභාව වෙත සතු කරනු ලැබූ අවස්ථාවක, ඒ වතු ඉඩමේ ව්‍යවස්ථාපිත භාරකරු, එම ව්‍යවස්ථාපිත භාරය පවත්නා කාලය තුළ, කොමිෂන් සභාව විසින් කලින් කල නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව එම වතු ඉඩමේ මනා හා නිසි කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු ය.

(2) ඒ කිසිම ව්‍යවස්ථාපිත භාරකරුවකු, කිසියම් ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින්, එම වතු ඉඩමේ තත්ත්වය පිරිහීයාමට හැරීම හෝ එම වතු ඉඩමේ චංචල හෝ නිශ්චල වත්කම් විනාශ කරනු ලැබීම, නැති කරනු ලැබීම, ඒවාට අලාභ හානි කරනු ලැබීම හෝ ඒවායෙහි අගය ක්ෂයවීමට හැරීම නොකළ යුතු ය.

(3) ඒ සතු කිරීමේ දිනයට පෙරාතුවම වූ දිනයෙහි එම වතු ඉඩමේ නීත්‍යානුකූලව නේවාසිකව සිටි කම්කරුවන්ට එසේ එම වතු ඉඩමෙහි තවදුරටත් නේවාසිකව සිටීමට ඉඩදීමද ඒ දිනයෙහි එම වතු ඉඩමේ නිත්‍ය සේවයෙහි නියුක්තව සිටි කම්කරුවන් ඉදිරියටත් සේවයෙහි නියුක්ත කර තබා ගැනීමද ඒ ව්‍යවස්ථාපිත භාරකරුගේ යුතුකම වන්නේ ය.

(4) එවැනි යම් වතු ඉඩමක කළමනාකරණයට, අධීක්ෂණයට හෝ සංවර්ධනයට හෝ ඒ ඉඩමේ පලදාව අලෙවි කිරීමට අදාළ වූ හා මේ පනතෙහි මෙම කොටස ක්‍රියාත්මක වන දිනයෙහි සක්‍රියව පැවති කිසිදු ණය හෝ වෙනත් මුදල් පහසුකම් සැලැස්වීමක් කොමිෂන් සභාවේ ලිඛිත කැමැත්ත ඇතිව හැර සුළු වශයෙන් වෙනස් කිරීම හෝ වෙනස් කිරීම හෝ නොකළ යුතු ය. තව ද මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන අනුව ක්‍රියා කිරීම ගැන වග බලා ගැනීමේ කාර්යය සඳහා, කොමිෂන් සභාව විසින්, අවශ්‍ය යයි හෝ අවස්ථානුකූල යයි කොමිෂන් සභාව සලකන යම් විධාන, යම් ව්‍යවස්ථාපිත භාරකරුවකු, වාණිජ බැංකුවක්, ප්‍රසිද්ධ සමාගමක්, නියෝජිත ආයතනයක් හෝ තැරැව්කරුවකු වෙත හෝ එම පහසුකම් සැලැස්වීමෙහි වෙනත් යම් පාර්ශ්වකරුවකු වෙත කලින් කල නිකුත් කරනු ලැබිය හැකි අතර, තමා වෙත නිකුත් කරනු ලැබූ එවැනි යම් විධානයක් අනුව ක්‍රියා කිරීම සෑම තැනැත්තකුගේ ම යුතුකම වන්නේ ය.

(5) (අ) යම් වතු ඉඩමක් කොමිෂන් සභාව වෙත සතු කරනු ලැබූ අවස්ථාවක, ඒ වතු ඉඩමෙහි කාර්යයන්ට අදාළවූ ද, ඒ සතු කිරීමේ දිනයට පෙරාතුවම වූ දිනයෙහි පැවතියාවූ ද ප්‍රකාශිත හෝ ගම්‍යමාන යම් ගිවිසුමක් හෝ එකඟවීමක් යටතේ වූ ඒ වතු ඉඩමේ කලින් සිටි හිමිකරුගේ අයිතිවාසිකම් සහ බැඳීම් සහ ඒ දිනයෙහි පැවතියාවූ ද, ඒ වතු ඉඩමේ පාලනයට අදාළවූ ද ඒ හිමිකරුගේ වෙනත් අයිතිවාසිකම් සහ බැඳීම්, (ආ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාවේ අයිතිවාසිකම් සහ බැඳීම් වන්නේ ය; තව ද ඒ වතු ඉඩම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි ප්‍රමාණයෙන්, ඒ සියලු බැඳීම් නිදහස් කිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණ අඩු කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයෙහි සඳහන් යම් බැඳීම් ව්‍යාජ ලෙස, වංක ලෙස හෝ වංචනික ලෙස ඇති කරන ලදැයි අමාත්‍යවරයාගේ මතය වන්නේ නම් ඔහු විසින්, ඕනෑම අවස්ථාවක දී ඒ බැඳීම් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ දන්වීම අමාත්‍යවරයා විසින්, ඒ ප්‍රතික්ෂේප කිරීම බලපාන පාර්ශ්වකරුවන් වෙත දෙනු ලැබිය යුතු ය.

(ඇ) යම් බැඳීම් අමාත්‍යවරයා විසින් (ආ) ඡේදය යටතේ ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක ඒ බැඳීම් කිසිවිටකත් කොමිෂන් සභාවේ බැඳීම් නොවූ ලෙස සලකනු ලැබිය යුතු ය.

42ඇ. (1) යම් වතු ඉඩමක් මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව වෙත සතු කරනු ලැබූ අවස්ථාවක, ඒ සතු කිරීමේ දිනයෙහි සිට මාසයක් ඇතුළත පහත සඳහන් විස්තර ඇතුළත් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ලියවිල්ලකින් සැපයීම ඒ වතු ඉඩමේ ව්‍යවස්ථාපිත භාරකරුගේ යුතුකම වන්නේ ය:—

(අ) වතු ඉඩමේ නම සහ ලියුම් ලැබෙන ලිපිනය ;

(ආ) වතු ඉඩමේ කලින් සිටි හිමිකරුගේ නම සහ ලිපිනය ;

(ඇ) වතු ඉඩමෙහි පිහිටීම සහ ප්‍රමාණය, එහි ඇති වගාවන්, ඒ එක් එක් වගාවට යට වී ඇති බිම් ප්‍රමාණය සහ සතු කර ගැනීමේ දිනයට පෙරාතුවම වූ ලිත් වර්ෂ පහේ එක් එක් වර්ෂයේ දී එම වගාවල පලදාව ;

(ඈ) වතු ඉඩමට අයත් ගොඩනැගිලි, කර්මාන්ත ශාලා, යන්ත්‍ර, උපකරණ, වාහන සහ චංචල සහ නිශ්චල වෙනත් දේවල් පිළිබඳ විස්තරයක් ;

(ඉ) සතු කර ගැනීමේ දිනයට පෙරාතුවමවූ ගිණුම් වර්ෂ පහේ එක් එක් වර්ෂය සඳහා ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම;

(ඊ) සතු කර ගැනීමේ දිනයට පෙරාතුවම වූ ගිණුම් වර්ෂ තුනේ එක් එක් වර්ෂය තුළ එම වතු ඉඩම වෙනුවෙන් ගෙවිය යුතු.යම් බද්දක් සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද ප්‍රකාශවල පිටපත්;

(උ) සතු කර ගැනීමේ දිනයට පෙරාතුවම වූ ගිණුම් වර්ෂ පහේ එක් එක් වර්ෂය සඳහා කලින් සිටි හිමිකරු විසින් ප්‍රකාශිත අතුරු හා අවසාන ලාභාංශ ප්‍රකාශයක්;

(ඌ) සතු කර ගැනීමේ දිනයට පෙරාතුවම වූ වර්ෂ තුන තුළ සිදු වූ, ව්‍යවස්ථාපිත භාර කරු දන්නා වෙනත් වතු ඉඩම් විකිණීම් එම පරිපාලන දිස්ත්‍රික්කය තුළ වෙතොත් ඒ විකිණීම් පිළිබඳ විස්තර;

සහ

(එ) නියම කරනු ලබන වෙනත් විස්තර.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත සපයනු ලබන ප්‍රකාශයේ පිටපතක් ව්‍යවස්ථාපිත භාරකරු විසින් ඒ වතු ඉඩමේ කලින් සිටි හිමිකරු වෙත යැවිය යුතු අතර ඒ පිටපත තමා වෙත ලැබී දින අනුවක් ඇතුළත ඒ පිටපතේ ඇතුළත් තොරතුරු සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ කිසිවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට ඒ හිමිකරුට අයිතිවාසිකම ඇත්තේ ය.

(3) සතු කිරීමේ දින සිට මාස හතරක් ඇතුළත—

(අ) පෙරාතුව වූ ගිණුම් වර්ෂයේ අවසාන දිනයට පසු දිනයෙන් ආරම්භ වන සහ සතු කිරීමේ දිනයට පෙරාතුවම වූ දිනයෙන් අවසාන වන කාලසීමාව සඳහා වූ ලාභාලාභ ගිණුමක්;

(ආ) සතු කිරීමේ දිනයට පෙරාතුවම වූ දිනයෙහි පැවති පරිදි ශේෂ පත්‍රය; සහ

(ඇ) නියම කරනු ලැබිය හැකි වෙනත් තොරතුරු

ඒ වතු ඉඩම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත සැපයීම ඒ වතු ඉඩමේ ව්‍යවස්ථාපිත භාරකරුගේ යුතුකම වන්නේ ය.

42ඇ. (1) කොමිෂන් සභාව වෙත සතු කරනු ලැබූ යම් වතු ඉඩමක නීත්‍යානුකූල පදිංචි කරුවකු නොවන යම් තැනැත්තකු එම වතු ඉඩමෙහි පදිංචිවීමට උත්සාහ කරන හෝ පදිංචි වන අවස්ථාවක, ඒ බව කොමිෂන් සභාව වෙත සහ ළඟම පිහිටි පොලිස් ස්ථානය භාරව සිටින පොලිස් නිලධරයා වෙත ලියවිල්ලකින් වහාම වාර්තා කිරීම ව්‍යවස්ථාපිත භාරකරුගේ සහ එම වතු ඉඩමේ අධිකාරිවරයාගේ යුතුකම වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබුණ විට එම වතු ඉඩමෙන් එම තැනැත්තන් නෙරපීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ බලයලත් නිලධරයකු හෝ නියෝජිතයකු විසින් යම් පොලිස් නිලධරයකුට විධාන කළ හැකි ය. තව ද එම විධාන අනුව ක්‍රියා කරනු පිණිස ඒ පොලිස් නිලධරයා විසින් පියවර ගත යුතු අතර ඒ සඳහා අවශ්‍ය බලය පාවිච්චි කිරීම ද ඔහු විසින් කළ හැකි ය.

(3) කොමිෂන් සභාවේ බලයලත් නිලධරයාට හෝ නියෝජිතයාට එම වතු ඉඩමෙන් එම තැනැත්තන් නෙරපීමට නොහැකි වන හෝ නොහැකි වෙතැයි හැඟී යන අවස්ථාවක, ඔහු විසින් ඒ වතු ඉඩම පිහිටා ඇති ප්‍රදේශයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඒ සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, එම තැනැත්තන් එම වතු ඉඩමෙන් නෙරපීමට පිස්කල්ට විධාන කෙරෙන අධිකරණයේ ඒක පාක්ෂික ආඥාවක් ලැබීමට ඔහුට හිමිකම ඇත්තේ ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ආඥවක් මහේස්ත්‍රාත් අධිකරණය විසින් පිස්කල් වෙත නිකුත් කරනු ලැබූ අවස්ථාවක ඔහු විසින් ඒ ආඥව වහාම ක්‍රියාවෙහි යෙදවිය යුතු අතර ඒ ආඥව ක්‍රියාවෙහි යෙදවූ ආකාරය අධිකරණය වෙත ලියවිල්ලකින් වාර්තා කළ යුතුය.

(5) (3) වන උපවගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් නිකුත් කරන ලද ආඥවක් ක්‍රියාවෙහි යෙදවීමේ කාර්යය සඳහා පිස්කල් විසින් හෝ ඔහුගේ විධානය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් ඕනෑම පොලිස් නිලධරයකුගේ සහාය ලබා ගැනීම ද, එම වතු ඉඩමට ඇතුළු වී එම තැනැත්තන් සහ ඔවුන්ගෙන් යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන් එම වතු ඉඩමෙන් ඉවත් කිරීම පිණිස අවශ්‍ය විය හැකි බලය පාවිච්චි කිරීම ද කළ හැකි ය.

42ඉ. යම් වතු ඉඩමක් පිළිබඳ වූ කිසිම පරවශතාවක් කොමිෂන් සභාව විසින් අවසාන කරනු ලැබ ඇති නම් මිස සහ එසේ අවසාන කරනු ලබන තුරු, මේ පනතේ මේ කොටසේ විධිවිධාන යටතේ ඒ වතු ඉඩම කොමිෂන් සභාව වෙත සතු කිරීමෙන් ඒ පරවශතාව කෙරෙහි කිසිදු ආකාරයක බලපෑමක් ඇති නොවිය යුතු ය. ඒ පරවශතාව එසේ අවසන් කරනු ලැබූ අවස්ථාවක, ඒ පරවශතාවෙහි හිමිකරු වන්දියකට හිමිකම් ලබන්නේ ය.

42ඊ. උකසකට, බද්දකට, ඵල භුක්තියකට හෝ ජීවිත භුක්තියකට යටත් යම් වතු ඉඩමක් මේ පනතේ මේ කොටසේ විධිවිධාන යටතේ කොමිෂන් සභාව වෙත සතු කරන ලද අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි එම උකස්හිමියාට, බදු ගැනුම්කරුට, ඵල භුක්තිකරුට හෝ ජීවිත භුක්තිය දරන්නාට, එම වතු ඉඩමෙහිලා වූ තමාගේ සම්බන්ධතාවේ ප්‍රමාණයට, ඒ වතු ඉඩම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය කෙරෙහි කැප අයිතියක් ඇත්තේ ය.

42උ. 42 අ වන වගන්තිය යටතේ වූ යම් ව්‍යවස්ථාපිත භාරයක් කොමිෂන් සභාවේ මනාපය පරිදි කවර විටක වුවත් අවසන් කරනු ලැබිය හැකි අතර කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් වතු ඉඩමක් කවර විටක වුවත් කොමිෂන් සභාවේ සන්තකයට ගත හැකිය. එම භාරය, කලින් අවසන් කරනු ලැබුවහොත් මිස, සතු කිරීමේ දිනයේ සිට එක් වර්ෂයක් පැවතිය යුතු අතර එය දීර්ඝ කිරීමට කොමිෂන් සභාව තීරණය කරතහොත් තවත් වර්ෂයක් පවතින්නේ ය. අමාත්‍යවරයාගේ ප්‍රකාශිත අනුමතය ඇතිව මිස, කිසිම ව්‍යවස්ථාපිත භාරයක් ඊට වඩා වැඩි කාලයකට කොමිෂන් සභාව විසින් පවත්වා ගෙන යා නොහැකි ය.

42ඌ. (1) මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් වතු ඉඩමක් පහත සඳහන් කාර්යයන් අතුරින් යම් කාර්යයක් සඳහා යොදා ගත හැකි ය:—

(අ) කෘෂිකාර්මික සංවර්ධනය හෝ සත්ව පාලනය සඳහා හෝ සමුපකාර හෝ සාමූහික ගොවිපළක් හෝ ව්‍යවසායක් සඳහා තැනැත්තන්ට විකිණීම, හුවමාරු කිරීම, කුලී සින්න ක්‍රමයට දීම හෝ බදු දීම මගින් පවරා දීම;

(ආ) පදිංචිවීමේ නිවාස සෑදීම සඳහා තනි කැබලි වශයෙන් තැනැත්තන්ට විකිණීම මගින් පවරා දීම;

(ඇ) 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂි කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලබන යම් සංස්ථාවකට හෝ 1958 අංක 4 දරන ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා දීම;

(ඈ) කොමිෂන් සභාව විසින් කෙළින්ම හෝ එහි නියෝජිතයන් මගින් කළමනාකරණය කරනු ලබන ගොවිපළක් හෝ වැවිලි කර්මාන්තයක් සඳහා;

(ඉ) ගම් පුළුල් කිරීම හෝ වෙනත් පොදු කාර්යයක් සඳහා.

(2) කොමිෂන් සභාව වෙත සතු කරන ලද වතු ඉඩම් යෙදවිය හැකි කාර්යයන් තීරණය කිරීමේ දී කොමිෂන් සභාව, අමාත්‍යවරයා විසින් ඒ සඳහා කලින් කල නිකුත් කරනු ලැබිය හැකි විධානවලට යටත් විය යුතු ය.

42උ. (1) මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව වෙත සතු කරනු ලබන සෑම වතු ඉඩමක් වෙනුවෙන් ම වන්දි ගෙවිය යුතු ය.

(2) කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් වතු ඉඩමක් වෙනුවෙන් ගෙවිය යුතු වන්දියේ ප්‍රමාණය ප්‍රධාන තක්සේරුකරුගේ මතය අනුව සතු කිරීමේ දිනයේ දී එම වතු ඉඩමේ සාධාරණ වටිනාකම වන මුදල වන්නේය. වන්දියේ ප්‍රමාණය තීරණය කිරීමේ දී, ප්‍රධාන තක්සේරු කරු, අනිකුත් කරුණුවලට අමතරව සතු කිරීමේ දිනයේ දී වතු ඉඩමේ තත්ත්වය, සතු කිරීමේ දිනයට පෙරාතුවම වූ ගිණුම් වර්ෂ පහේ එක් එක් වර්ෂය සඳහා එහි හිමිකරු විසින් ප්‍රකාශ කරන ලද ලාභාංශ සහ ලාභ සහ එම වතු ඉඩම පිහිටි ප්‍රදේශයේ වතු ඉඩම් එකී වතු ඉඩම සතු කිරීමේ දිනයට පෙරාතුවම වූ වර්ෂ තුනක කාල පරිච්ඡේදය ඇතුළත විකුණනු ලැබූ මිල ද සැලකිල්ලට ගත යුතු ය.

(3) වන්දි ගෙවිය යුතු ක්‍රමය සහ ආකාරය මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(4) ගෙවිය යුතු වන්දියෙන්, මේ පනතේ මේ කොටස යටතේ අඩු කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක් හැර, ඉතිරි කොටසට, එම වන්දිය හිමි වූ දිනයේ සිට එම වන්දිය ගෙවනු ලබන දිනය තෙක් මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයකට පොලී හිමි වන්නේ ය.

(5) මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව වෙත සතු කරන ලද වතු ඉඩම් විෂයයෙහි 29 සිට 40 දක්වා වූ (දෙකම ඇතුළු) වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

(6) කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් වතු ඉඩමක් වෙනුවෙන් යම් තැනැත්තකුට වන්දියක් හිමිවන අවස්ථාවක—

(අ) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ තැනැත්තාගෙන් අය විය යුතු බවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අත්සන යටතේ කොමිෂන් සභාවට සහතික කරන ලද යම් මුදලක් වේ නම් එම මුදල දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ද;

(ආ) එම වතු ඉඩමේ සේවයේ නියුක්තව සිටින යම් තැනැත්තකුට හිඟ වැටුප්, අර්ථ සාධක අරමුදල් දායක මුදල්, පාරිතෝෂික හෝ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ වශයෙන් ඒ තැනැත්තාගෙන් අය විය යුතු බවට ඒ වතු ඉඩම සතු කිරීමේ දින සිට එක් අවුරුද්දක කාල සීමාවක් ඇතුළත කම්කරු කොමසාරිස්වරයාගේ අත්සන යටතේ කොමිෂන් සභාවට සහතික කරන ලද යම් මුදලක් වේ නම්, එම මුදල කම්කරු කොමසාරිස්වරයාට ද

කොමිෂන් සභාව විසින් එම වන්දි මුදලෙන් ඒ තැනැත්තා වෙත සාධාරණ කාලයක දැනුම් දීමක් කිරීමෙන් පසුව ගෙවිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්යයන් සඳහා "වන්දි" යන යෙදුමට එම වන්දි මුදලට අය වූ යම් පොලියක් ද ඇතුළත් වේ.

(7) මේ වගන්තියේ (1) සිට (5) දක්වා වූ උපවගන්තිවල (දෙකම ඇතුළුව) විධිවිධාන කුමක් වුව ද, මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් වතු ඉඩමක් වෙනුවෙන් වන්දිවලට හිමිකම් ඇති යම් තැනැත්තකුට, අමාත්‍යවරයා සහ එම තැනැත්තා අතර එම වතු ඉඩම සඳහා වූ වන්දියේ ප්‍රමාණය සහ එය ගෙවිය යුතු ක්‍රමය සහ ආකාරය සම්බන්ධයෙන් ඇති කරගත් එකඟවීමක් හෝ සාකච්ඡා මගින් ඇති කර ගන්නා

ලද බෙරුම් කිරීමක් අනුව මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් විධාන කරනු ලබන මුදලක් එසේ විධාන කරනු ලබන ක්‍රමයකින් හෝ ආකාරයකින් කොමිෂන් සභාව විසින් ගෙවිය හැකි ය.

(8) මේ වගන්තියේ විධිවිධාන අනුව යම් වතු ඉඩමක් සම්බන්ධයෙන් වන්දි ගෙවනු ලැබ තිබෙන අවස්ථාවක, ඒ වන්දිය ගෙවනු ලැබූ තැනැත්තාට හෝ වෙනත් තැනැත්තකුට කොමිෂන් සභාවට විරුද්ධව වැඩිදුර හිමිකම් පෑමක් කරනු ලැබීමට ඉඩ නොදිය යුතු අතර ඒ වැඩිදුර හිමිකම් පෑම සම්බන්ධයෙන් කොමිෂන් සභාවට විරුද්ධව යම් අධිකරණයක දී කිසිම නඩුවක් පැවරිය නොහැක්කේ ය.

**42ඒ.** මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, මේ පනතේ මේ කොටස යටතේ වූ, කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් වතු ඉඩමක ව්‍යවස්ථාපිත භාරකරු වන යම් නියෝජිත ආයතනයක හෝ සංවිධානයක වෙළෙඳ ව්‍යාපාරයක් ආණ්ඩුව වෙත සතු කිරීම අවශ්‍ය යයි, වෙළෙඳ විෂය භාර අමාත්‍යවරයා, ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසුව, අමාත්‍යවරයා අදහස් කරන අවස්ථාවක, 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනතේ විධිවිධාන යටතේ ඒ වෙළෙඳ ව්‍යාපාරය ආණ්ඩුව වෙත සතු කරගන්නා ලෙස අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටිය හැකි අතර, ඒ අනුව, මුදල් අමාත්‍යවරයා විසින් ඒ පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ඒ වෙළෙඳ ව්‍යාපාරය ආණ්ඩුව වෙත සතු කරනු ලැබිය හැකි ය.

**42ඔ.** (1) කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් වතු ඉඩමක මනා සහ නිසි කළමනාකරණය සඳහා, මේ පනතේ මේ කොටස යටතේ වූ, ඒ වතු ඉඩමේ ව්‍යවස්ථාපිත භාරකරු වන නියෝජිත ආයතනයේ හෝ සංවිධානයේ යම් අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් විධායක නිලධරයකු ධූරයෙන් ඉවත් කිරීම හෝ යම් තැනැත්තකු අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් විධායක නිලධරයකු වශයෙන් පත් කිරීම හෝ අවශ්‍ය යයි අමාත්‍යවරයා අදහස් කරන අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් එසේ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක්--

(අ) ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයේ සිට බලපැවැත්විය යුතු ය;

(ආ) වෙන යම් නීතියක කුමක් සඳහන් වුව ද වලංගුව බලපැවැත්විය යුතු ය;

(ඇ) කවර වූ හෝ හේතුවක් මත හෝ යම් අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී හෝ ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය; තව ද

ඒ නියමය කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරන ලද දින සිට, අවස්ථාවෝචිත පරිදි, පත් කරනු ලැබූ ලෙස හෝ තම ධූරය අත්හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**42ඔ.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ මේ කොටසෙහි--

"වතු ඉඩම" යන්නෙන්, අක්කර පනහකට වැඩි ප්‍රමාණයක තේ, රබර්, පොල් හෝ වෙන යම් කෘෂිකාර්මික බෝගයක් වගා කර තිබෙන හෝ යම් කෘෂිකාර්මික කාර්යයක් සඳහා ප්‍රයෝජනයට ගන්නා යම් ඉඩමක් අදහස් වන අතර ඊට, එම ඉඩමේ නොවිකුණූ පලදාව සහ ඒ ඉඩමේ හිමිකරුට අයත්වූ ද එම ඉඩමේ කාර්යයන් සඳහා යොදා ගනු ලබන්නාවූ ද සියලුම ගොඩනැගිලි, සවිකිරීම්, යන්ත්‍ර, උපකරණ, වාහන සහ චංචල සහ නිශ්චල දේවල් ද වෙනත් සියලු වත්කම් ද ඇතුළත් වේ.'.

## ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 42 දරන ජාතික මිල කොමිෂන් සභා පනතින් උධෘතයි

### I වන කොටස

#### ජාතික මිල කොමිෂන් සභාව පිහිටුවීම

2. ජාතික මිල කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන හා තත් කාලයෙහි 4 වන වගන්තිය යටතේ එම කොමිෂන් සභාවේ සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු (මේ පනතෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබේ.

### II වන කොටස

#### කොමිෂන් සභාවේ කටයුතු සහ බලතල

13. පහත සඳහන් කරුණු කොමිෂන් සභාවේ කාර්යයන් වන්නේ ය :—

(අ) 17 වන වගන්තිය යටතේ හෝ 18 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත කරන ලද යම් ඉල්ලීමක් ගැන විභාග කිරීම සහ සුදුසු අවස්ථාවල දී, එම ඉල්ලීමෙහි සඳහන් යම් භාණ්ඩයක් කර්මාන්ත ශාලාවේ දී හෝ තොග වශයෙන් හෝ සිල්ලරට යම් උපරිම මිලකට වැඩියෙන් නොවිකිණිය යුතු ද ඒ මිල නියම කිරීම හෝ ඒ මිල නියම කළ යුත්තේ යම් මිල ව්‍යුහයක් අනුව ද ඒ මිල ව්‍යුහය දැක්වීම ;

(ආ) 23 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත කරන ලද යොමු කිරීමක දැක්වෙන යම් කරුණක් ගැන විභාග කිරීම සහ ඒ යොමු කිරීම කරන අදාළ නියෝජිත ආයතනය වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවක ස්වරූපයෙන් ඒ කරුණ සම්බන්ධයෙන් උපදෙස් දීම ;

(ඇ) 24 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත කරන ලද යොමු කිරීමක දැක්වෙන යම් කරුණක් ගැන විභාග කිරීම සහ ඒ යොමු කිරීම කරන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවක ස්වරූපයෙන් ඒ කරුණ සම්බන්ධයෙන් උපදෙස් දීම.

---

## ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 43 දරන මිල පාලන (සංශෝධන) පනතින් උධෘතයි

#### මිල පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

2. (1) මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන මිල පාලන පනතේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ඉවත් කරනු ලැබුව ද, ඒ ප්‍රඥප්තියේ 4 වන වගන්තිය යටතේ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් සාදනු ලැබ, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි වලංගුව පවත්නා සෑම නියමයක් ම, ඒ නියමය ජාතික රාජ්‍ය සභාවේ ජාතික මිල කොමිෂන් සභා පනතේ විධිවිධානවලට පටහැනි නොවන තාක් දුරට ඒ පනතේ 20 වන වගන්තිය යටතේ සාදනු ලැබූ නියමයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ .—

(i) ඒ උපවගන්තියේ (ආ) ඡේදය අත් හැරීමෙන් ;

(ii) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) භාණ්ඩ කිසිවක මිල නියම කරමින් ජාතික රාජ්‍ය සභාවේ ජාතික මිල කොමිෂන් සභා පනත යටතේ කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් නියමයක් ක්‍රියාත්මකව පවතින විට ඒ භාණ්ඩ ගබඩා කිරීම, ඉවත් කිරීම හෝ ඒවා ගැන සුදුස්සක් කිරීම, තහනම් කිරීම, විධිමත් කිරීම හෝ පාලනය කිරීම සහ ඒ භාණ්ඩ රැස්කර සඟවා තබා ගැනීම වැළැක්වීම ;";

(iii) ඒ උපවගන්තියේ (ඉ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් —

"(ඉ) භාණ්ඩ කිසිවක මිල නියම කරමින් ජාතික රාජ්‍ය සභාවේ ජාතික මිල කොමිෂන් සභා පනත යටතේ කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් නියමයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් ඒ භාණ්ඩ සම්බන්ධයෙන් හෝ ඒ භාණ්ඩ පිළිබඳව කඩ කරනු ලැබ ඇත් ද නැතහොත් කඩ කරන ලදැයි සැක කරනු ලබන්නේ ද, ඒ භාණ්ඩ තහනමට අල්ලා ගැනීම සහ එසේ තහනමට අල්ලා ගන්නා ලද හෝ අහිමි කරන ලෙස යම් අධිකරණයක් විසින් ආඥා කරන ලද භාණ්ඩවල භාරය, ඒවා විකිණීම සහ ඒවා ගැන සුදුස්සක් කිරීම ;";

(iv) ඒ උපවගන්තියේ (ඊ) ඡේදය ඉවත් කිරීමෙන් ; සහ

(v) ඒ උපවගන්තියේ (උ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් :-

"(උ) මෙහි මින් පෙර සඳහන් කරන ලද කරුණු අතුරින් යම් කරුණකට ආනුෂංගික හෝ සම්බන්ධ හෝ යම් භාණ්ඩයක මිල නියම කරමින් ජාතික රාජ්‍ය සභාවේ ජාතික මිල කොමිෂන් සභා පනත යටතේ කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් නියමයක් අනුව ක්‍රියා කිරීමට සැලැස්වීමේ කාර්යය සඳහා අවශ්‍ය වෙන යම් කරුණු.".

4 ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් : —

"(1) මේ පනත යටතේ කරන ලද යම් නියමයක් හෝ සාදන ලද යම් නියෝගයක් හෝ කරන ලදැයි සලකනු ලබන යම් නියමයක් හෝ සාදන ලදැයි සලකනු ලබන යම් නියෝගයක් හෝ මේ පනතේ 5 වන වගන්තිය යටතේ දෙනු ලැබූ යම් සාමාන්‍ය හෝ විශේෂ නියෝගයක් කඩ කරමින් ක්‍රියා කරන හෝ භාණ්ඩයක මිල නියම කරමින් ජාතික රාජ්‍ය සභාවේ ජාතික මිල කොමිෂන් සභා පනත යටතේ කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් නියමයක් කඩ කරන හෝ මේ මේ පනතේ 5 අ වන වගන්තිය යටතේ දෙන ලද යම් විධානයක් හෝ කරන ලද යම් නියමයක් කර කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ ඒ වගන්තිය යටතේ වෙන යම් තැනැත්තකුගේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා ඒ තැනැත්තාට බාධා පමුණුවන හෝ අවහිර කරන සෑම තැනැත්තෙක් ම වරදක් කරන්නේ ය.".

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි—

(අ) (අ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) භාණ්ඩයක මිල නියම කරමින් ජාතික රාජ්‍ය සභාවේ ජාතික මිල කොමිෂන් සභා පනත යටතේ කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන නියමයක් ක්‍රියාත්මක වන යම් තැනක හෝ ප්‍රදේශයක පිහිටි යම් ස්ථානයක ව්‍යාපාරයක් පවත්වා ගෙන යන යම් තැනැත්තකුගේ සන්තකයෙහි වෙළඳ කාර්යයන් සඳහා එවැනි භාණ්ඩ තොගයක් තිබේ නම්, සහ"; සහ

(ආ) (ආ) ඡේදයේ (ii) වන අනුඡේදය වෙනුවට පහත සඳහන් අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) ඒ භාණ්ඩය වෙනත් යම් භාණ්ඩයක් (එම වෙනත් භාණ්ඩය සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ ජාතික මිල කොමිෂන් සභා පනතේ 20 වන වගන්තිය යටතේ කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන නියමයක් ක්‍රියාත්මකව පවතිතත් නැතත්) මිලට ගැනීමට හෝ යම් සේවාවක් සම්බන්ධයෙන් යම් ගෙවීමක් කිරීමට නියම කරන කොන්දේසියකට යටත්ව හෝ මිලදී ගන්නා විසින් එවේලේම මිල ගෙවිය යුතුය යන කොන්දේසිය හැර වෙනත් යම් කොන්දේසියකට යටත්ව, විකිණීම පිණිස ඉදිරිපත් කරනු ලැබීණි නම් ;";

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදය වෙනුවට පහත සඳහන් අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(i) ඒ වරද, ජාතික රාජ්‍ය සභාවේ ජාතික මිල කොමිෂන් සභා පනතේ 20වන වගන්තිය යටතේ කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන නියමයකින් යම් භාණ්ඩයක් සඳහා නියම කරන ලද උපරිම මිලට වැඩියෙන් ඒ භාණ්ඩය විකිණීමෙන් ඒ නියමය කඩ කිරීමක් නම් හෝ ඒ නියමයකින් උපරිම මිල නියම කරනු ලැබූ යම් භාණ්ඩයක් රැස්කර සඟවා තබා ගැනීම වැළැක්වීම සඳහා වූ නියෝගයක් කඩ කිරීමක් නම්, බරපතල වැඩ ඇතිව සති හතරකට නොඅඩු සහ මාස හයක් නොඉක්මවන කාල සීමාවක් බන්ධනාගාර ගත කිරීමෙන් සහ, ඊට අමතරව, රුපියල් හත් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතුය";

(4) එම වගන්තියේ (8) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

'(8) යම් තැනැත්තකු විසින්, (ඒ තැනැත්තා මෙහි මින් මතු "සේවා යෝජකයා" ලෙස සඳහන් කරනු ලැබේ.) යම් ස්ථානයක සේවා යෝජකයා පවත්වාගෙන යන යම් ව්‍යාපාරයක් කරගෙන යාමෙහි ලා භාණ්ඩ විකිණීම පිණිස සේවයේ නියුක්ත කර ගන්නා ලද වෙනත් යම් තැනැත්තකු විසින් ඒ ස්ථානයේ දී කරන ලද හෝ නොකර හරින ලද යම් දෙයක් හේතු කොට ගෙන, ඒ භාණ්ඩවල මිල නියම කරමින් ජාතික රාජ්‍ය සභාවේ ජාතික මිල කොමිෂන් සභා පනත යටතේ කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් නියමයක යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද හෝ සාදන ලදැයි සලකනු ලබන නියෝගයක යම් විධිවිධානයක් හෝ කඩ කිරීමේ වරදට ඔහු වරදකරු කරන ලද අවස්ථාවක, ඒ සේවා යෝජකයා

හෝ සේවා යෝජකයා ශ්‍රී ලංකාවෙන් බැහැර සිටී නම්, තත් කාලයේ ඒ ව්‍යාපාරයේ කළමනාකරු ලෙස ක්‍රියාකරන හෝ පාලනය දරන තැනැත්තාද, ඒ වරද සිදුකරන ලද්දේ තමා නොදැනුවත්ව බව හා ඒ වරද සිදුකිරීම වැළැක්වීම පිණිස තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව අධිකරණය සෑහීමට පත් වන පරිදි ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරදට වරදකරු වන්නේ ය.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"පනත අදාළවීම 10. මේ පනතේ විධිවිධාන හෝ යම් භාණ්ඩයක මිල නියම කරමින් ජාතික රාජ්‍ය සභාවේ ජාතික මිල කොමිෂන් සභා පනත යටතේ කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් නියමයක විධිවිධාන ශ්‍රී ලංකා සන්නද්ධ සේවාවල හෝ ආණ්ඩුවේ හෝ ප්‍රයෝජනය සඳහා නාවික, යුද්ධ හෝ ගුවන් හමුදාව විසින් හෝ වෙනුවෙන් හෝ සිවිල් බරධරයන් විසින් හෝ වෙනුවෙන් හෝ ආනයනය කරන ලද, මිල දී ගන්නා ලද හෝ ගබඩා කර තබන ලද යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් භාණ්ඩයක් ආණ්ඩුවේ ප්‍රයෝජනය සඳහා මිල දී ගැනීමට අමාත්‍යවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකුට ඒ භාණ්ඩය විකුණනු ලබන මිල සම්බන්ධයෙන් හෝ අදාළ නොවන්නේ ය; එහෙත්, මේ වගන්තියේ සඳහන් කිසිවකින්, ඉහත කී විධිවිධාන කඩ කරමින් නාවික, යුද්ධ හෝ ගුවන් හමුදා බලධරයන්ට හෝ අන්තිමට සඳහන් බලධරයන් අතුරින් කිසිවකු වෙනුවෙන් වූ වෙන යම් තැනැත්තකුට හෝ යම් භාණ්ඩයක් විකිණීමට යම් තැනැත්තකුට අවසර ලැබෙතියි හෝ එකී විධිවිධාන කඩ කරමින් ඒ බලධරයන්ට හෝ එකී යම් තැනැත්තකුට යම් භාණ්ඩයක් විකිණීම ප්‍රතික්ෂේප කිරීමට යම් තැනැත්තකුට බලය ලැබෙතියි හෝ සැලකීම හෝ තේරුම් ගැනීම නොකළ යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(i) "අමාත්‍යවරයා" යන්නෙහි අර්ථකථනය අත් හැරීමෙන් ;

(ii) ' "මිල පාලිත භාණ්ඩය" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත සඳහන් අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

"මිල පාලිත භාණ්ඩය" යන්නෙන් භාණ්ඩයේ මිල නියම කරමින් ජාතික රාජ්‍ය සභාවේ ජාතික මිල කොමිෂන් සභා පනත යටතේ කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන නියමයක් යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මකව පවතී ද ඒ භාණ්ඩය අදහස් වේ.'; තව ද,

(iii) "බලකර ලබා ගැනීම" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් —

' "ජාතික රාජ්‍ය සභාවේ ජාතික මිල කොමිෂන් සභා පනත යටතේ කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන නියමයක්" යන්නට ජාතික රාජ්‍ය සභාවේ ජාතික මිල කොමිෂන් සභා පනතේ 20 වන වගන්තිය යටතේ කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන නියමයක් එම පනතේ 22 වන වගන්තිය යටතේ වෙනස් කිරීමක් ද ඇතුළත් වේ '.

## 1975 අංක 50 දරන විසර්ජන පනත

1976 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ යම් යම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත් ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ පනතකි.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 50 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි "1976 මුදල් වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන 1976 ජනවාරි 01 වන දිනෙන් ආරම්භව 1976 දෙසැම්බර් 31 වන දින අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති රුපියල් හයසිය අනූහත් කෝටි තිස්එක් ලක්ෂ හැත්තෑ දෙදහස් හත්සිය පණස් පහක් වූ ආණ්ඩුවේ වියදම—

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින්, හා

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් දෙසිය අනූ කෝටි හතලිස් ලක්ෂයක් නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල් වලින්

පියවිය යුතු ය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් හයසිය අනූහත් කෝටි තිස්එක් ලක්ෂ හැත්තෑ දෙදහස් හත්සිය පණස් පහක් වූ මුදල මේ පනතේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන අන් කිසි ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බලපැවැත්විය යුතු ය.

3. (1) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයේ දක්වෙන එක් එක් කටයුත්තෙන් 2 වන වගන්තියෙහි සඳහන් මුදල් වර්ෂය තුළ දී ආණ්ඩුවට ලැබෙන ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැරකළ යුතු ය. එහෙත් එසේ බැර කරනු ලබන ලැබීම්වල සමස්තය එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය. එවැනි කටයුත්තකින් ඒ උපරිම සීමාව ඉක්මවා ලැබෙන ලැබීම් කිසිවක් වේනොත් එය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.

(2) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයේ දක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 2 වන වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම් ඒ මුදල් වර්ෂය තුළ දී එම කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්වලින් ගෙවිය යුතු ය. එහෙත් එම වියදම් එම උප ලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන කිසි යම් කටයුත්තක් සම්බන්ධයෙන් 2 වන වගන්තියේ සඳහන් මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය එම උපලේඛනයේ IV වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය. තවද ඒ මුදල් වර්ෂයේ අවසානයට එම කටයුත්තේ මුළු බැරකම් එම උපලේඛනයේ V වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

4. 2 වන වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුවට ලැබෙන ලැබීම් ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම පියවීමට ප්‍රමාණවත් නොවේ නම් එම වියදම පියවීම සඳහා අමාත්‍යවරයා අවශ්‍ය යයි සලකන මුදල් ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කළ හැකිය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්තය එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතු ය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක් අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතු ය.

5. (1) යථෝක්ත උපලේඛනයේ සඳහන් කිසි යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් කිසි වැඩ සටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට මෙම පනතේ පළමුවන උපලේඛනයේ විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබූවාවූ ද, එහෙත් වියදම් නොකරන ලද්දවූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු විය හැකිවූ ද, යම් මුදලක්, එම වැඩසටහනේම මූලධන වියදමේ වෙන් කිරීමකට හෝ එම ශීර්ෂයේම වෙන යම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ වෙන් කිරීමකට හෝ, භාණ්ඩාගාරයේ ලේකම්ගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකි ය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතු ය.

6. (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම් බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩු විය හැකි බවට ; හෝ

(2) යම් කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට

අමාත්‍යවරයා සෑහීමට පත් වූ අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදා හරින ලද මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් ඉවත් කර ගැනීම අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමැතිය ඇතිව කළ හැකි ය''.

7. මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයේ, III වන තීරයේ, IV වන තීරයේ හෝ V වන තීරයේ දැක්වෙන යම් උපරිම සීමාවක් ආණ්ඩුවේ අනුමතය ඇතිව 1977 ජූලි 31 වන දින හෝ ඊට පෙර අමාත්‍යවරයා විසින් නියමයක් මගින් වෙනස් කළ හැකි ය. නැතහොත් අමුතු කළ හැකි ය. එබඳු යම් නියමයක්, එහි එසේ ප්‍රකාශිතව ම සඳහන් කරනු ලැබුවහොත්, ඒ නියමය කරනු ලැබූ දිනයට කලින් වූ සහ එහි දක්වනු ලබන දිනයක සිට බලපැවැත් වූ ලෙස සැලකිය යුතු ය.

8. මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරවලට යම් කටයුත්තක් හා ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් එකතු කිරීමෙන් ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත යෝජනාවක් මගින් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකි ය.